

# අඳුර මැදින් යළි එළියක්

සනුජ හේවගේ

අඳුර මැදින් යළි එළියක් - සනුජ හේවගේ

# අඳුර මැදින්
# යළි එළියක්

**සනුජ හේවගේ**

*යථාපි භමරෝ පුප්ඵං - වණ්ණ ගන්ධං අහේඨයං*
*පලේති රසමාදාය - ඒවං ගාමේ මුනී චරේ*
*(ධම්ම පදයෙන්)*

බ්‍රහ්ම ලෝකයේ මහා බ්‍රහ්මයන් ලඟ බඹ සුව සොයන බඹ සැප විඳින පිරිසක සමග දහම් සුවයෙන් සිටින මොහොතක ගමක් හෝ නගරයක් හෝ පාළුවට ගිය බිම්කඩක් තවත් බ්‍රහ්ම ලෝකයක් කරන්නට කවුරුන් හෝ පැවසුවොත් ඒ ඇරයුම ඔබට නම් ඔබ තෝරාගන්නේ කුමක්ද? එය බාරගන්නවාද? නැද්ද? ඔබ කුමක් තෝරාගත්තද එවැන්නක වගකීම සිතා බැලුවහොත් අර මුලින් කී විවේකයම රුචිකරනවා නො අනුමානයි.

මේ ඔබට අවධාරනය කරන්නට උත්සාහ වන්නේ මෙම පොත ලියන කර්තෘතුමන්ගේ කරුනු ඉදිරිපත් කරන්නට මෙම නාවිමන සෙනසුන සිතුවිලි ගොනුකලේ කෙසේද යන්නයි. සැබවින්ම බඹලොව බ්‍රහ්මයන්ගේ සිතුවිලි දහරාව පිරී ඇත්තේ සිව්බඹ විහරණයෙන් එනම් මෙත්තා කරුණා මුදිතා උපේක්ෂා යන ගුණ සමූහයෙන්. මේ උතුම් ගුණ පුරුදු පුහුණු කරන නාඋයන ආරණ්‍ය සේනාසනයද අපට දැනුනේ තවත් බ්‍රහ්ම ලොකයක් ලෙසින්. මන්දයත් කාත් කවුරුවත් නොපෙනෙන නිසසල රුක්ෂ තුරුලතාවලින් ගැවසීගත් කඳුමුදුන සිත නිවන්නටත් නිවුනු සිත රැකගන්නටත් මහත් උපකාරී නිසා. ඊටත් වඩා අප ප්‍රියකලේ මහෝපාධ්‍ය නාඋයනේ මාහිමිපාණන් වහන්සේගේ දහම් සිසිලෙන් බබලන සෙවණයි කිවහොත් එය වඩාත් නිවැරදිය.

එකී සෙවණේ සිටින මට දිනක් අපගේ ගුරුදේවෝත්තම මහා කම්මට්ඨානාචාරී අතිපූජනීය නා උයනේ මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ මෙසේ දන්වා සිටිසේක. “ආයස්මතුන් වහන්ස! කියන්න කාරණයක් තියෙනවා. ඔබට පමණයි මෙය කල හැකිවන්නේ!” මෙය අසනවිට මම විමතියට පත්වුණා. මට පමණක් කලහැකි අන් අයට නොහැකි මේ කරුණ කුමක්දෝ කියා. නැවතත් මාහිමිපාණන් වහන්සේට සවන්දෙන මට ඇසුනේ “කටානේ ගංගාරාමය බොහෝම ප්‍රයොජනවත් තැනක්! බොහෝ සෙයින් අන්‍යාගමික පිරිසක් සිටින මේ ප්‍රදේශය

ධර්මකාමී පිරිසකට මිසදුටු නොවන්නටත් මිසදුටු පිරිස් සම්දිටු කරන්නටත් හොඳ තැනක්. වාර කිහිපයක්ම ආයස්මතුන් වහන්සේලා කිහිපදෙනෙක්ම යොමුකළා. නමුත් කිසිවෙක් වැඩි කලක් වැඩසිටියේ නෑ. විවිධ ප්‍රශ්න ගැටළු ගැන කියා ආපසු වඩිනවා. සමිත ආයස්මතුන් වහන්සේවත් පුළුවන්ද බලන්න!'' මාහිමිපාණන් වහන්සේගේ ප්‍රකාශය මොහොතකට මසිතට බරක් වුණා. ඒ අන්කිසිවක් නිසා නොව, සේනාසන භාරකාරිත්වය විවේකයට බාධාවක් වීමත් මාහිමිපාණන් වහන්සේගේ සෙවණින් දුරස්ථ වන්නට සිදුවීමත් නිසාය.

කෙසේ නමුත් ඉමහත් ගෞරවය නිසාම එය සඟවාත් මම මෙසේ ප්‍රකාශ කලේ සිතේ බර හෙමින් හෙමින් අඩුකර ගන්නටයි. ''ස්වාමීන් වහන්ස! මම පැවිදිවෙන්නට ආවෙත් ඔබවහන්සේ ළඟට. පැවිදිවී වසර දහයක් වැඩසිටියේත් ඔබවහන්සේගේ සෙවණේමයි. මම ඒ කාලය ගතකලේ බොහොම සතුටින්. තවත් කාලයක් වැඩසිටින්නට මා ප්‍රියකරනවා''. එය ඇසූ පූජනීය ස්වාමීන්වහන්සේ කියාසිටියේ ''ඔව්, මම දන්නවා දකිනවා. ඒ නිසාම තමයි කවුරුත් වැඩසිටින්නට අකමැති ප්‍රශ්න ගැටළු පිරුන තැනක්ම බාරදෙන්නේ. ආයස්මතුන්ට පමණයි මෙය කරන්න පුළුවන්!''

පූජනීය මහා සමිඳුන්ගේ වචනයට පිටුපාන්නට මාවැන්නකුට කෙසේ හැකිවෙයිද? ඒ නිසාම එම වගකීම බාරගෙන කියන ලද භාවනා මධ්‍යස්ථානයට ගොස් එහි කටයුතු සතුටින් කළා. අපගේ ක්‍රියාකලාපයට ගිහි පැවිදි සැම සතුටු වුණා. වඩාත් සතුටුවූයේ එවකට අග්‍රවිනිශ්චයකාරව සිටි සනත් එන්. සිල්වා මහත්මා සහ එම මැතිණියයි. ඒ එම ස්ථානය සාදා පූජා කරන ලද සැදැහැති දානපතියෝය. ගතවූයේ මාස දෙකක් පමණයි. මැලේසියාවේ ආරම්භ කරන නව භාවනා මධ්‍යස්ථානයේ භාරකාරිත්වයට මා යොමුකළා. එහි වසර කිහිපයක් සිට මා නැවත ලංකාවට පැමිණෙන විට මා මුලින් සඳහන් කළ කටානේ භාවනා මධ්‍යස්ථානය අපට අහිමිවී තිබුණේ නැවතත් එහි පාලනයට නිසි අයකු නොවූ නිසා.

මෙසේ මැලේසියාවේ පිනැන්ග් නගරයට ආසන්න කඳුයායේ පවත්වාගෙන යන භාවනා මධ්‍යස්ථානයේ කටයුතු

කරන අතර නැවතත් මාහිමිපාණන් වහන්සේ පණිවිඩයක් යවා තිබුණා. කාත්කවුරුත් නැති කිසිවෙක් ප්‍රිය නොකරන පාළුවට ගිය පැරණි වන සෙනසුනක් ගැන. විවිධ ජාවාරම්වලට ක්ෂේම භූමියක්ව පැවති (මෙම පොතෙහි සඳහන් වන පරිදි) වන වදුලට වැසී සැඟවීගිය මේ පිංකෙතට වඩින්නට ඒ අනුව අප හට සිදුවුණා. එකී වගකීමද ගුරුගෞරවයෙන් පිළිගත් අප මෙහි පැමිණි පළමු දිනම අදිටන් කරගත් සදහම් කරුණු අතර එකකි ඉහත ගාථාවෙන් අරුත් වන්නේ. එහි අදහස කෙටියෙන් දක්වන්නේ නම් වර්ණයටත් සුවඳටත් හානි නොකර බමරුන් රොන් ගන්නා සේ දායක දායිකාවනට (කිසිවෙකුටත්) බරක් නොවී මුනිවරයෝ හැසිරෙත් යනුයි. ඊට අනුවම කටයුතු අද දක්වාම කරන්නේ චන්ද්‍රෝපම ප්‍රතිපදාව වැනි උතුම් සදහම් දේශනාවන්ද සිත්හි තබාගෙනමයි.

එසේ කටයුතු කරන අතර අපට නන් අයුරින් අතහිත දෙන සැදැහැති පිරිස් නැවත සෙනසුන වටා ඒකරාශී වුණා. ඒ නිසාම විනාශයට පත්වෙමින් තිබූ සෙනසුන නැවතත් ගොඩනගන්නට අපට දිරියක් ලැබුණා. ඒ උදවු කළ සැමට ආශීර්වාද කරන අතර තොරතුරු සොයාබලා මෙම සෙනසුන් ඉතිහාසයේ දෙවන පරිච්ඡේදය වදනට සිත්ගන්නා සේ ගොනුකළ සද්ගුණවත් සනුජ මහත්මාටත් කරුණු මතක් කර දුන් නාගසිරි මහත්මාටත් පොත මුද්‍රණය කිරීමට බරපැන ඉසුලූ මැලේසියාවේ විමුක්ති සොහොයුරිය ඇතුළු සැමටත් අප මෙත් සිතින් ආශීර්වාද කරන්නෙමු.

අනුශාසක ස්වාමීන්වහන්සේ,
නාවිමන වන සෙනසුන

කර්තෘගෙන් යමක්.....

සැබවින්ම මම කතුවරයකු නොවේ. මීට පෙර පොත් ලියා පුරුද්දක්ද නැත. එසේ නමුත් 2010 වසරේ සිට සෙනසුනට සහ ස්වාමීන් වහන්සේලාට සමීපතම කෙනකු ලෙස සෙනසුනෙහි සියළු වත්මන් කටයුතු පිළිබඳව මනාසේ දන්නා හෙයින් මෙය සකස් කිරීමට මට අපහසුවක් නොවීය. මෙහි ඇති අතීත තොරතුරු සැදැහැති නාගසිරි මහත්මාගෙන් ලබාගත් අතර සදහම් තොරතුරු පූජනීය ස්වාමීන් වහන්සේලාගෙන් දැන ඉදිරිපත් කළ බව මෙහිලා සටහන් කරමි.

මෙම සෙනසුනෙහි ආරම්භය 1964 වර්ෂයේ වන අතර ආරම්භක ස්වාමීන් වහන්සේ වන්නේ අති පූජනීය තාඹුගල ආනන්දසිරි ස්වාමීන් වහන්සේය. උන්වහන්සේගේ පටන් 2008 දක්වා සියළු තොරතුරු ග්‍රන්ථ සම්පාදිකා විශ්‍රාමලත් ගුරුතුමිය නාලිනී සුසිලා දිසානායක මහත්මිය විසින් රචනා කරන ලදුව දායක දායිකාවනට බෙදාදුන් බව අසන්නට ලැබුණි. මෙහි සටහන් වන්නේ 2010-06-17 දින සිට විස්තරයයි. මේ අනුව වසර දෙකක් මෙහි නිසි පිළිවෙලක් නැති පාළුවට ගිය ස්ථානයක් බව ඔබ සැමට වැටහෙනු ඇත.

මෙය සකස් කිරීමට උපකාර වීමෙන් මා ලද පුණ්‍ය මහිමය වසර 3 කට පෙර වියෝවූ පියතුමාට නිවන් පිණිස වේවායි! අනුමෝදන් කරමි.

සනුජ හේවගේ
2019 අප්‍රේල් 19

## පෙළගැස්ම

අඳුර මැදින් යළි එළියක් ........ 09
උත්තරීතර හුදකලාව ........ 19
මාසයකට පසු දිනක තවත් සිදුවීමක් ........ 22
පළමු දායක ආධාරය........ 27
පළමු වස් පිංකම ........ 29
සේනාසන පූජාව සහ ශ්‍රමදාන ........ 29
ධර්ම ශාලාවේ වැඩ ඇරඹුම ........ 33
ප්‍රථම කම්ටුවාරය සහ දෙටු නිලතල ........ 45
දාන ශාලාව ........ 51
දාන ශාලා පූජාවේ ආනිසංස ........ 57
2012 කඨින පිංකම - සංඝ පිරිස පුළුල් කිරීම ........ 61
කැපකරු මාරුව ........ 64
කළ කම් පල දේ........ 75
බුදුරජාණන්වහන්සේ බලන්න අපි ගිය ගමන........ 76
මහා ථෙර කුටිය ........ 80
අටුවා පෙළ පොත් ........ 85
සදහම් සිතුවිලි ........ 88
සෙනසුන් පූජා - 2014........ 89
කැපකරුතුමෙක් සෙවීම කළුනික වගෙයි ........ 90
සීමා මාලකය ........ 94
ලක්දිව ප්‍රථම සීමා සම්මතය........ 106
2014 කඨින පිංකම........ 109
සාදු සාදු වඩිනෙමු........ 113
ආනන්ද බෝධි රෝපණය ........ 113
දෙව්රමින් නාවිමන සෙනසුනට වැඩි බෝරජිඳුන් ........ 117
කළ පින් පිහිටට එනවාද ?........ 122
ලස්සන සිත සදා සුව දේ ........ 127
වගකීම සහ යුතුකම ........ 136
පින........ 147
වනරොපසුත්තං........ 148

**පැතුම**

කැලේ පිපෙන ලස්සන සුවඳැති මල් පොකුරු වගේ
ගමෙත් නගරයත් සැමතැන ගුණ-දම් හුරුවේවා!
සෝෂා නැති සැඩපහරත් නැති දියපාරක සිහින් හඬට මුසු,
සිසිලස සේ කරුණා මෙත් සිත් තුල පැතිරේවා!
කටුකොහොලින් විසඵලයෙන් පිරි, වනපියසට සඳුන් හරක් සේ
ගුණ දහමින් පිරි උතුමන්ගේ සුවඳ දැනේවා!
දැය වනසන සතුට නසන, දුදනන් වෙනුවට මගෙ මේ රට,
සැම මිදුලෙම සුදන ගුණෙන් පිරි, අය බිහිවේවා!!!

# අඳුර මැදින් යළි එළියක්...

අඳුරු රැයේ පායන සඳ හරි ප්‍රියංකරයි
සඳේ එළිය හැම මිදුලෙම එකම එකවගෙයි
සුදෝ සුදට නිල් අහසට හරිම ලස්සනයි
සඳ වටකර ඇති තරුකැල සැවොම ඒ වගෙයි

සඳ හරි ප්‍රියංකරයි
එහි එළිය හරි අගෙයි
සඳේ එළිය නැති දවසට
සිතට හරිදුකයි!

ජාති භේද උස්මිටිකම් සඳට වැඩක් නෑ
බෙදන එළිය සැමතැනටම කිසි වෙනසක් නෑ
වාද භේද මානාදී ලප කිසිවක් නෑ
සඳට එරෙහි කිසිවෙක් සඳ අසලකවත් නෑ

ඝන වැහි වලාකුලු මහ රාහු බියකරු
එකමුතුවී සඳ රජිඳුට කරයි ගරු සරු!

සඳ හරි ප්‍රියංකරයි
එහි එළිය හරි අගෙයි
සඳේ එළිය නැති දවසට
සිතට හරිදුකයි!

ඡන්ද දෝස බය මෝහෙන් අගතියට වෙලා
අන්ධයින් වගේ ඇයි මේ තව පමාවෙලා
වින්ද නේක දුක් මහසයුරෙන් එතෙරවෙලා
චන්ද්‍ර මඩල සේ ගුණදම් පුරමු එක්වෙලා!

නගරයේ සැරිසරන මට පෙනුනේ මුළු ලෝකෙම ගිනි අරන් වගේ. හැම දෙනාම මහා යුද්ධෙක පැටලිලා වගේ, එනිසාම එදා දවස වැඩ ඉවර වෙලා හැන්දෑවෙ පන්සලට ගියා. පන්සලකට යන්නවත් විවේකයක් නැහැ. මහා පුදුම ජීවිතයක් මට විතරද, නෑ, කවුරුත් ඒ වගේ.

*සුදු වතින් සැරසිලා, සුදු මල් මිටක් අරන්*
*සුදෝ සුදු පැහැය ඇති*
*සේල චෛතිය ළඟින්*
*සල පතල මලුව මත*
*දූහුල් රෙදිකඩ එලා*
*වදිමි සම්බුදු පියා*
*දොහොත් මුදුනේ තියා*
*බෝපත් වලින් නැගෙන සිහින් සිරි සිරි හඬයි*
*කොත් කැරැල්ලේ මතින් දිලෙන මිනි පළිඟුවයි*
*සියො ළඟ වෙලා දැනෙන සිහිලැල් පවන් රොදයි*
*රත් වූ මගේ සිත නිවන්නට පවන් සලයි*

සලපතල මළුවේ සැදෑ අඳුරේ සිටින මගේ සිත නිවී යද්දී නොදැනීම වගේ අතීතයේ සුන්දර අව්‍යාජ මතකයන් ටික ටික සිත තුළ මතුවෙන්නට ගත්තා.

ඇත්තෙන්ම ඒ පුංචි කාලෙ කොච්චර මිහිරිද? මගේ සිතට මතක් වුණා. අම්ම තාත්ත දෙන්න එක්ක කැලේ පන්සල බලන්න ගිය හැටි. මහ පාරෙන් රූස්ස වන රොදට තිබුන පුංචි පඩිපෙළ දිගේ බොහොම පරිස්සමින් හිමින් හිමින් කැලේ ඇතුලෙ පියවර තැබූ හැටි. කැලේට ඇතුලු වුණාම කෑගහන්න, රිලවුන්ට ගල්කැට විසිකරන්න, හයියෙන් හිනාවෙන්න, හූ කියන්න මට නොයෙක් දේ හිතෙනවා. වරෙක රිලා පැටවෙකු එක්ක හයියෙන් හිනාවෙද්දි අම්ම මට කියනව “මගේ පුතේ මේ අපි යන්නේ බුදු හාමුදුරුවො බලන්න. දඟලන්න කෑ ගහන්න දඟ කරන්න හොඳ නෑ.”

මට හිතුණා ඇත්තටම බුදු හාමුදුරුවො වැඩ සිටින්නේ මේ කැලේද කියල. මම ඇහුවා “බුදුරජාණන්වහන්සේ මෙහේ

ඉන්නවද?'' තාත්ත කිවුවා. ''සද්ද කළොත් නම් දැඟලුවොත්නම් දකින්න බැරිවෙයි, සංවර වෙලා යමු. එතකොට දකින්න පුළුවන්'' කියලා, මම නිහඬ වුණා. ශාන්ත ගමනින් වඩින බුදු හාමුදුරුවො දකින්න ඕන නිසා. මම දහම්පාසලේදී අහලා තිබුණා බුදුරජාණන් වහන්සේගේ හැටි.

පඩිපෙළ නැගල ගල් තලාවකට මතු වුණේ. එතන එළියයි. පුංචි දැල් ගහපු ශාලාවක් තිබුණා. ටිකක් වෙහෙස නිවාගෙන එතනින් මූහුණ කට තෙමාගෙන, ආයේ කැලේ තුලින් තිබුන ඉතා පටු අඩිපාරෙ කන්දෙ උඩට නැග්ගා. එකවරම කැලේ තුල අඩිපාරක බිම බලාගෙන හිමින් හිමින් කවුදෝ ගියා. මම හිතුවෙ බුදුහාමුදුරුවො කියලා. මං ඇහුවා ''අම්මේ! අන්න බුදු හාමුදුරුවො'' කියලා. අම්ම කිවුවා ''නෑ පුතේ ඒ ලොකු හාමුදුරුවො'' කියලා. එදා තමයි මම පළවෙනි වතාවට ලොකු හාමුදුරුවෝ දැක්කේ. ඒ පූජනීය තාඹුගල ආනන්දසිරි ස්වාමින්වහන්සේ.

අතීත සිතුවිලි හිතට එද්දී මට සිටින තැනත් අමතක වෙලා. දිගටම සිත රටා මවනවා, හදිස්සියේම කවුද පිටට තට්ටු කළා. මම ඇහැ ඇරල බැලුවා. දෙවියනේ මගේ මිත්‍රයෙක්. මම හිටියේ පුංචි සුන්දර ලෝකයක බව මට දැනුනේ ඉදිරියෙන් නෙතට ගැටුන චෛතිය නිසා.

මම මගේ මිත්‍රයට කතා කළා ''දවසක අපි යමුද මම පුංචි කාලෙ ගියපු ලස්සන තැනක් බලන්න?'' අපි කතා වුණා එවෙලේම දිනයක් යොදාගත්තා. නියමිත දිනයේ මා, මිත්‍රයා සමග ඒ පුංචි කාලේ මතකයන් සිතට අරන් ගමන පිටත් වුණා. නමුත් කැලයට යන්න එදා තිබුණු පුංචි පඩිපෙළ් පාර වෙනුවට අද වාහන යන පාරක් කඳු මුදුනටම තිබුණා. ඒ නිසා ඒ පාර දිගේම අපි ගමන් කරා. පුංචි කාලෙ පඩිපෙළෙන් ඇවිත් ගොඩවුණ ගල්තලාව තමයි වාහනපාර අවසන් වුණ තැනත්. පෙරට වඩා ටිකක් ලොකු ශාලාවක් තිබුණා. ඇතුලුවෙන තැනම ජරාවාස වෙච්චි, වහල කැඩීගිය, බිත්ති පුපුරාගිය, දිරාගිය ලට්ට ලොට්ට පිරුන ශාලාවක් තිබුණා. ඒ ඉදිරියෙන් දුගඳ හමන කැඩීගිය වියලි කොළවලින් සහ ගස් අතුවලින් වැසීගිය, මදුරුවන්ගේ රජ දහනක් වූ වැසිකිළි පෙළක් අනෙක් පසින් ගල්

බැම්ම මත පුංචි වැලිතලාවක කොටුකළ තැනක් එහි ඇතුලේ කුඩා බුද්ධ ප්‍රතිමා වහන්සේ නමක් සහ එහි බඳුනක් මත තිබූ පරවී වියලී ගිය මල් දුටු මා තේරුම් ගත්තේ දින ගණනාවකට පෙර කවුරුන් හෝ පැමිණි ඇති බවකි.

ටිකින් ටික කැලයට ඇතුලු වුණා, ගල් ගැලවී කැඩී බිඳී ගිය මාවත දිගේ, ඒ සමගම වම් පස බිඳුණ කැඩීගිය වහල සහිත පසක ගඩොලින් බැඳී ඉහල මහල විවෘත දෙමහල් කුටියක්, තව දුරටත් ඉහළට පියනගද්දී දුටු දසුන් ඉතා ශෝචනීයයි. කාමර 4කින් යුත් දිග කුටියක් උළු වහලය දිරා කඩාවැටිල බිත්ති පුපුරා ඉරි තලා ගිහින්. වේයන් මන්දිර සදමින් බිත්ති පුරා ආක්‍රමණය කරලා. තව ටිකක් ඉහළට පමණයි යන්න තිබුණේ කඳු මුදුන මත කුඩා විහාරයක් සැම අතින් ආවරණය කළ පුංචි කාමරයක අඩි 2ක 2 ½ ක් පමණ බුද්ධ ප්‍රතිමාවක්. ඒ කුඩා කුටිය අවට හිසේ ගෑවෙන තරම් මිටි වහලයකින් යුතු කැඩී ගිය සෙවිලි සහිත 30ක 40ක ප්‍රමාණයේ පිරිසකට ඉඳගන්නට ප්‍රමාණවත් වූ ශාලාවක්. කළු කූඹි ලක්ෂ කෝටි ගණන් වැල් වැල් හැදී සැරි සරනවා. දූවිලි තට්ටුවකින් බිම වැසීගිහින්.

බැලූ බැලූ අත මේ වාගේ, බුදු සසුනට මොකද වුණේ? වසර පන්දහසක් යන්නට පෙර පිරිහිලා ගියාද? කෝ මේ ස්වාමින්වහන්සේලා කවුරුත්ම නැද්ද? ප්‍රශ්න ගණනාවකින් සිත වෙලී ගියා. ඒ මොහොතේම මම සිතුවේ කුමක් හෝ ක්‍රමයකින් මේ ස්ථානයට මේ පිං කෙතට සිල් ගුණ පිරි භික්ෂූන් වහන්සේලා වැඩම කරවා හැකි උපරිම උත්සාහයෙන් මෙය නැවත ගොඩ නගන්නටයි.

ආපසු පහල ගරාවැටී ගිය වැසිකිළිපෙල සහ දිරාගිය කොටුදැල් ශාලාව ලඟට එනවිට, කවුදෝ කෙනෙකු අපදිහා බලා සිටියා. මේ පාලු භූමියෙහි හුදකලාවේ බලාසිටි මිනිසා දකිනවිටත් හිතට ආවේ අමුතු හැඟීමක්. ඒ දසුන නෙත ගැටෙන කවුරු නමුත් තිගැස්සෙනවා නොඅනුමානයි. වයස අවු 60ක පමණ පෙනුමක් ඇත්තාවූ කළු මහත හැඩි දැඩි මනුස්සයෙකු උඩු කය නිරුවත්ව, කැලේපාට කොටු සරමක් ඇඳගෙන ඒ මදිවට දිලිසෙන දිග පිහියකුත් අතේ, අප දිහා දිගටම බලා සිටියා. හුදකලා වන අරමේ තනිව සිටි මේ මිනිසා කවුද? මෙහි කුමක් කරන්නේද?

විමතියෙන් සහ සැකයෙන් අප ලංවුනේ. කටපුරා සිනහවක් ආයාසයෙන්ම මවාගෙන. "සැකයත් විමතියත් නිසා සිනහවක් නැතත් එය ආයාසයෙන් කරන්නට වූයේ එය දුටු කාට නමුත් තරහක් ඇතත් සිත නිවෙන බව අප දැන සිටි නිසා."

ඒ මනුස්සය කතා කළා, "මහත්තයලා කවුද? ඇයි මේ පැත්තේ?" ඒකත් මහා ගොරෝසු හඬක්. අපි අපගේ අනන්‍යතාවය පැහැදිලි කළා. කපටි සිනහවකින් යුතුව ඒ මිනිසා අපට හොඳින් කතා කළා.

"මහත්මයා එන්න තේ එකක් බොන්න, මම මේ කැම උයමින් සිටි ගමන් කවුදෝ උඩ කතා කරන හඬක් නිසා එලියට ආවේ. මේවයේ විවිධ ජාවාරම් කාරයොත් එනවනේ ඒ නිසා."

"ඔබතුමා කවුද, මෙහෙ තනිවම ඇයි? " අපි ඔහුගෙන් විමසුවා.

"මහත්මයා මම මෙහෙ කැපකරු, ලේකම්තුමා. මම තමයි මේක ආරක්ෂා කරගෙන ඉන්නේ. ඒක ලොකු වැඩක්, මෙහෙ තනිවම ඉන්න එක ලේසි නෑ." ඒ කතාවේ විලාශයෙන් මොනවදෝ සැඟවී ඇති බව මට තේරුණා. ඒ නිසා අපි ඇහුවා "ඇයි තනිවම? කවුරුත් නැද්ද?" "මොකද නැත්තෙ හිටියා හිටියා, කවුරුත් වැඩිකල් නෑ දවසයි දෙකයි පැදූරටත් නොකියා යනවා." "ඇයි එහෙම වෙන්නේ" අපි ඇසුවේ විමතියෙන්. "මේක මහත්තයෝ අවුල් ගොඩක්, මහ ජංජාලයක්. හාමුදුරුවොන්ට ඉන්නත් බෑ දායකයොන්ට එන්න හිත දෙන්නෙත් නෑ මම නිසාම කාගෙන ඉන්නව." මනුස්සයාගේ කතාව මහා අභිරහසක් වගේ, "එතකොට තනිවම ඉන්න බැරි මොනව හරි ප්‍රශ්නයක් තියනවද?" අපි ඇසුවා. "ප්‍රශ්නනම් බැරිය මහත්තය මේක ප්‍රශ්ණ පිට ප්‍රශ්ණ, *අන්තෝ ජටා බහි ජටා*" අහන ප්‍රශ්නයට දෙන පිළිතුර මහා ගුප්ත හැඟීමක්මයි පල කලේ. ඒත් කොහොමහරි සත්‍යය දැනගන්නමයි ඕන කලේ. මේ පිං බිම රැක ගන්න ඕන නිසා නැවතත් අපි විමසුවා.

"ඔබ කියන කතාව අපිට තේරෙන්නේ නෑ. ඔය කියන කරදර මනුස්සයන්ගෙන්ද, අමනුස්සයන්ගෙන්ද?" "මහත්තයෝ

එකක් දෙකක් නෙමෙයි ඔක්කොම කරදර. මනුස්සයන්ගේ කරදර නිසාත් හාමුදුරුවොන්ට වැඩසිටින්න බැහැ. අමනුස්සයන්ගේ කරදර නිසාත් ඉන්න හිත දෙන්නෙ නෑ. ඔක්කොම හොල්මන් මන්දිරයක් වගේ තමයි''

කතාව දිගට යන බවක් පෙනුණා. නමුත් දැනගන්නත් ඕන කළා, කෙලින්ම මම පුංචි කාලේ තොරතුරු කියලා මේ මනුස්සයට වඩා ඉතිහාසයක් මම දන්නා බව පෙන්වා දුන්නා. ''හරි ඔබ ඔය කියන කතන්දර ඉස්සර තිබුණේ නෑ. මමත් මෙහෙ පොඩිකාලේ ඉඳල ඇවිල්ල තියෙනවා.'' මම ප්‍රකාශ කළේ හරියට හැමදාම ආවා වගේ. පොඩිකාලේ ආවට පස්සෙ අවුරුදු තිස්ගානකින් මමත් අද ආවේ. මනුස්සය පුදුම වුණා ඇස් ලොකු වුණා. ''ඇත්තටම මහත්තයා මෙහෙ දන්නවද?'' ''ඔව්, මම පටන් ගන්න කාලෙ ඉඳන් දන්නවා. ඉස්සර මෙහෙ වැඩ හිටියා තාඹුගල ආනන්දසිරි කියල ලොකු ස්වාමින්වහන්සේ නමක්. අර කන්දේ ගල උඩ කෙලවරේ ගරාවැටුණ පුංචි කුටියේ වැඩ සිටියේ'' දන්නේ ටික වුණාට මහ ලොකුවට මම කිවුවා.

එවිට ඒ මනුස්සය කිවුවා ''ඇත්ත, ඒ ඉස්සර. මමත් දැකලා නෑ. අහලනම් තියෙනවා. ඒ කාලේ හරිම හොඳයිලු. පස්සේ උන්වහන්සේ කුඩුම්බිගලට වැඩියා පානම පැත්තේ, ඊළඟට දන්න කාලෙක දිගටම වැඩ සිටියේ කෙහෙල් ඇල්ලේ කුසලසිරි ස්වාමින්වහන්සේ. ඒ කාලෙත් බොහොම දායක සම්බන්ධකම් තිබුනලු, සේනාසනේ පිරිල ස්වාමින්වහන්සේලා වැඩ සිටියලු. දුර ඈත ගාල්ල, අනුරාධපුර පැත්තේ වුණත් මළගෙයක්, දානයක්, ආරාධනාවක් තිබුනොත් වඩිනවලු. දායක පිරිසට තිබුණේ පුදුම ආදරයක්ලු. ඔය කියන විදියට නම් උන්වහන්සේට තමන්ගේ වැඩක් කරගන්න වෙලාවක් තියෙන්න නැතුව ඇති කියලා මට සිතුනත් එය නොකියාම වෙනත් යමකින් කතාවට සම්බන්ධ වුණා.

''ඔය කියන්නේ මේ මෑත කාලෙද? මම දන්නේ නැති නිසා ඇහුවා, ඔව් මහත්තයා 2004 අවුරුද්ද වෙනකම්ම'', ''ඉතිං ඊටපස්සෙ මොනාද මේ වෙලා තියෙන්නේ?'' අපි විමසුවේ කනින් කොනින් අහල තිබුනු කතාවත් දැනගැනීමට කැමති නිසා.

"මමත් දන්නෙ නෑ මහත්තයෝ. ඔය එන යන අය කියන විදියට නම් කවුරු හරි තරහ කෙනෙක් කපල කොටල මරල දාල. ඔව් අර තට්ටු දෙකේ කුටිය ළඟ කැලේ උදේ බලනවිට ලේ පෙරි පෙරී මැරිල හිටියලු. "ඉතිං මොකද වුණේ හොරු ඇල්ලුවද?" "එක මහා අභිරහසක්, ආණ්ඩුවේ පත්තරවලත් ගියා. කරපු කෙනෙකුත් නෑ, දන්න වරදකුත් නෑ, ගන්න දේකුත් නෑ, හාමුදුරුවොත් නෑ, අනේ අනිච්චං. ඊටපස්සෙ හිටපු ස්වාමින්වහන්සේලා එක එක දිහාවට වැඩියලු. කවුරුත් මෙහෙ නැතුව පාළුවට ගියාලු. වරින් වර හාමුදුරුවො වැඩියලු. ඉන්න බැරිලු" මිනිහ එක දිගටම කියාගෙන ගියා.

"ඇත්තට, මහා අපරාධයක් මේකනම්. පුදුමයි හාමුදුරුවන්ගෙන් මොනව ගන්නද? ඒ නැතත් ආරණ්‍යයේ උන්වහන්සේලා හොරුන්ට තරම් වැදගත් වන එකතු කරන දෙයක් නැහැනෙ. ඔබතුමා මෙහෙට සම්බන්ධ වුනේ කොහොමද?"

"ඔව් මහත්තයො. මේක වැහිල යනකොට පරණ දායක ඇත්තෝ ගල්දූව අරණ්‍යට කියල අපේ හාමුදුරු නමක් වැඩම කරගත්තා. උන්වහන්සේ මම හොඳට අඳුරනවා. ඒ නිසා කැපකරු කමටයි, තනිපන්ගලමටයි, ආරක්සාවටයි ඔක්කෝටම මාව ගෙන්න ගත්තා. ඒකෙ රහසක් තියෙනවා. උන්වහන්සේ දන්නවා මං මනුස්සයන්ට තියා යකාටවත් බය නැති බව" මනුස්සයාගේ කියමන හරිම අපූරුයි.

අපි ඇහුවා "ඔබතුමා කියන ඒ හාමුදුරුවො දැන් නැද්ද?"

"නෑ මහත්තයො උන්වහන්සේ ආපහු කොහේදෝ වැඩිය. කොහෙද, ඉන්න දෙන්නේ නැනේ මේ හැතිකරේ, එක පැත්තකින් කේලම්, හාමුදුරුවෝ ඉන්නවට මිනිස්සු තරහලු, තව පැත්තකින් හොල්මන් තියෙනවලු. ඕව කිවුවම මාත් එක්ක කියනවා අපේ හාමුදුරුවො. මම කිවුවා මොන එහෙකට ඕව හිතනවද, මම ඉන්නවනේ, ඔබවහන්සේ වැඩ සිටින්න කියලා. අනේ ටික දවසකින් ඔන්න දායක කට්ටියට එන්න කිවුවා එකවරම මම මෙහෙන් යනව කිවුවා. ගියා. කවුරු ගියත්

මහත්තයෝ මේවා ආරක්සා කරන එක අපේ යුතුකම. ඒ නිසා තනිවම හරි මම ඔහේ ඉන්නව, නැතිනම් මේ කැලේ විනාසයි. වතුර වලක් මඩ වලක් ගානේ බැරල්, ඒ මදිවට බොරු වලවල් හෝදිස්සියක් නැතුව ගියොත් කපෝතියි. ගිහිං බලන්න ටිකක් කැලේ ඇතුලට අඩු ගානේ අරණ්‍ය සීමාවවත් රැකගන්න එපායැ'' මිනිහා කිවුවා.

ඒ වුණාට මට හිතුනේ වෙන දෙයක්, මිනිහගේ හැටියටනම් මෙතන තවත් මොකක්දෝ තියෙනව. කතාව දිගට ගියා. හදා දීපු තේ කෝප්පයත් ඇල් වෙලා, ඒ වුණත් කමක් නෑ දිගටම එක උගුරටම බීල දැම්මේ පිපාසයත් තිබුණ නිසා, මිනිසාට කතාකරමින් සිටි අපි පැය කිහිපයක් ගෙවා එතනින් සමුගත්තා.


මම ආපසු මෙම වන රොදින් පියමැන්නේ මිතුරාට මගේ මේ දැඩි අධිෂ්ඨානේ ගැනත් පැහැදිලි කරමින්. මම ආපසු ගියේ මා මිත්‍ර අබේගුණවර්ධන මහතාත් හමුවෙන්නටයි. එතුමා හමු වුනේ මගෙ ඕනෑම ප්‍රශ්නයකදී මුලින්ම මා එතුමන් සමග කතාකර විසඳුමක් ලබා ගෙන තිබුන පුරුද්ද නිසා. අබේගුණවර්ධන මහත්මා බොහොම දහමට ලැදි පිං කැමති කෙනෙක් වෘතියෙන් රජයේ නීතිඥ මහත්මයෙක්. එතුමා හමුවී එම කරුණු පැහැදිලි කලේ බොහොම සංවේගයකින්, එය එතුමාට හොඳින්ම වැටහුනා. මගේ කතාව ඇසූ ඔහු එකවරම මා සිත සතුටු කරන අදහසක් ප්‍රකාශ කළා.

''හරි! අපිට හොඳ වැඩක් තියෙනව, මතකද අපි එදා ගිය පන්සල, භාවනා මධ්‍යස්ථානය කටානේ? එතන සිටියා මතකද ස්වාමින්වහන්සේ? අපි ආරාධනා කරමු මේ ස්ථානයට'' අපි තීරණයක් ගත්තා ඒ භාවනා මධ්‍යස්ථානයට යන්නට. මේ කාලයේම දායක සභාවේ පරණ සිල්වත් මහතුන්ද මේ පරිහානිය දරාගත නොහැකිව අති පූජනීය නා උයනේ අරියධම්ම ස්වාමින්වහන්සේ හමුවීමට තීරණය කර තිබුණා. එවකට උන්වහන්සේ වැඩ සිටියේ මැල්සිරිපුර නා උයන අරණ්‍ය සේනාසනයෙයි.

නා උයනේ මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ ගැන ඔබ සැම දෙනාම අසා ඇති. ඒ ස්වාමින්වහන්සේ මහා ගුණ තේජසකින්, සීල තේජසකින්, ඤාණ තේජසකින් යුක්ත මතු බුදුවන මහා බෝසත් උතුමන්වහන්සේ නමක්. වයෝවෘද්ධ දායක පින්වතුන්ගේ ඉල්ලීමට කාරුණික වූ ඒ මහා ස්වාමින්ද්‍රයන් වහන්සේ මේ වන සෙනසුනට සුදුසු කෙනෙකු ගැන සිත යොමු කලා. උන්වහසේට එකවරම මතක් වූයේ එවකට උපසම්පදාවෙන් දසවස්පිරි ගල්දූව සෙනසුනේ පස් වසක් ත්‍රිපිටක ධර්‍මය හදාරා ඉතිරි වසර 5 නා උයන සහ බුරුම රට භාවනා ප්‍රගුණ කර එවකට චීනය, සිංගප්පූරුව, ඉන්දියාව, මැලේසියාව ආදී විදේශ රටවල භාවනා උගන්වමින් වැඩ සිටින තම සුවච කීකරු ශික්ෂාකාමී ශිෂ්‍ය රත්නයක් වූ **පූජ්‍ය බුලත්සිංහල සමිත ස්වාමින්වහන්සේ** ගැනයි. එය මුවින් නොපවසා සසුන් ලැදි ප්‍රධාන දායක දෙපලක් වූ පිළියන්දල සමරසිංහ මහත්මාටත් එම මැතිණියටත් තම අදහස ප්‍රකාශ කලේ “මේ ස්ථානයට සුදුසුම කෙනෙක් සිටිනවා විදේශගතවෙලා. කාලය සකස්වෙන්න ඕනනෙ” කියාය. ඒ අදහස සිතේ තබා සිටියදී එවකට කටානේ ගංගාරාම භාවනා මධ්‍යස්ථානයේ වැඩ සිටි **පූජ්‍ය බුලත්සිංහල සමිතවංශ ස්වාමින්වහන්සේට,** මමත්, මිත්‍ර අබේගුණවර්ධන මහත්මාත් මේ සේනාසනයට (නාවිමන) ආරාධනා කලා. උන්වහන්සේ නා උයනට වැඩමවන්න අති පූජනීය නා උයනේ අරියධම්ම ස්වාමින්වහන්සේට සැලකල විට, ඒ මහා ස්වාමින්ද්‍රයන්වහන්සේ යෝජනා කලා. “එහෙනම් මේ ආයස්මතුන් වහන්සේ මැලේසියාවෙ සිටින පූජ්‍ය **බුලත්සිංහල සමිත අයස්මතුන්** වහන්සේ සමග ඒම ස්ථානයට වඩින්න. ඔය නම තාම නවක භික්ෂුවක් නිසා තනිව ඉන්න දෙන්න බැහැ. ඉතා පැරණි ස්ථානයක් වූ නා විමන බොහෝ දෙනාට හිතසුව පිණිස වූ තැනක් කරන්නට ආශිර්වාද කරනවා කියා පූජනීය ස්වාමින්වහන්සේ අවසරය ලබාදුන්නා. ඒ අවසරයෙන් මැලේසියාවේ වැඩ සිටින **පූජ්‍ය බුලත්සිංහල සමිත ස්වාමින්වහන්සේට** ආරාධනා කර දිනයක් යොදාගෙන අතිපූජ්‍ය නා උයනේ මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේද, අති පූජනීය කොස්ගොඩ නන්දසීල ස්වාමින්වහන්සේ, අති පූජනීය කහගොල්ලේ සෝමවංස ස්වාමින්වහන්සේ, අති පූජනීය අගුල්ගමුවේ අරියනන්ද ස්වාමින්වහන්සේ ආදී

ස්වාමින්වහන්සේලා වැඩම කරවා මෙම පාළුවට ගිය සෙනසුන භාර කලේ සසුනේ චිරස්ථිතියට මෙය වැදගත් වන නිසාමයි. ඒ 2010.07.17 වන දිනයේදීය.





# උත්තරීතර හුදකලාව

*රමණීයානි අරඤ්ඤානී යත්ථ නො රමතී ජනෝ*
*වීතරාගා රමෙස්සන්ති නතේ කාම ගවේසිනෝ*

ආසාවන්ගෙන් සිත් සතන් වෙලීගිය අය නොපැමිණෙන වීතරාගී උතුමන් ගැවසෙන ජනයාගෙන් සුලබ නොවූ වන පියසෙ ඉතා පියකරුය.

*(ධම්ම පදයෙන්)*

වනාන්තර ලොව කොතෙකුත් ඇති බව ඔබ දන්නවා ඒවා තුල ලස්සන ලස්සන දේ කොච්චර තියෙනවද. ලස්සන සත්ව විශේෂ, ලස්සන වෘක්ෂලතා, විශේෂ ලස්සන මල්, ඇළ දොළ, දිය ඇලි, වැව් පොකුණු පවා ඒ වගේම ඉතාම බිහිසුන රෞද්‍ර දේද මහා වනාන්තර වල සිදුවේ, ඇතැම් වනාන්තර වල විනෝදය පිණිස සකස්කළ බොහෝ ස්ත්‍රී පුරුෂ, ළමා ළපටි පවුල් පිටින් ගැවසෙන, සහ සුරාසොඬුන්, සලෙලුන් ආදීන්ට ක්ෂේමභූමියක් වූ විවිධ අංශ සඳහා සැකසුන වන රොදවල් මේ ලක් පොලවේද නැතුවා නොවේ.

නමුත් මේ වනාන්තර, වනරොදට වඩා ලොකු වෙනසක්, වනඅරම තුල දකින්නට පුළුවන්. ඊට හේතුව එහි සැරිසරන්නේ රාගයෙන්, ද්වේශයෙන්, මෝහයෙන්, මාන ආදියෙන් තෙත්වූ රත්වූ සිත්සතන් ඇති අය නොවේ. හුදෙක් සිත නිවා සුපරිශුද්ධ සන්තානයක් සකසා ගත් හෝ ගැනීමට වෙර දරන උතුමන් වහන්සේලා නිසාවෙනි.

2010.07.17 දින නාවිමනට වැඩම කළ ස්වාමීන් වහන්සේලාද බොහෝ කලක් මේ නිහඬ පරිසරවල පාලු හුදකලාව හොඳින් පුරුදු කළ නිසා එහි සිත් අලවා වැඩ වසන්නට විය. කලක් භික්ෂූන් වහන්සේලා වැඩ නොසිටීමත්, වරින් වර පැමිණි ස්වාමීන්වහන්සේලාගේ නොරැඳීමත් නිසා අද්භූත අභිරහස් සිදුවීම් වන පරිසරයක් ලෙස ප්‍රකටව තිබූ නිසාත් වැඩමවා වදාළ ස්වාමීන්වහන්සේලා හමුවීමට හිතවත් අබේගුණවර්ධන මහත්මා සමඟ දිනපතාම සන්ද්‍යාවේ පැමිණීමට අප අමතක කළේ නැහැ.







වැඩ සිටින්න හරිහමන් කුටියක්වත් නොතිබුණු ජරාවාස වූ සෙනසුනෙහි අභිවෘධිය සිතූ ස්වාමින්වහන්සේලා, වැඩවාසය කිරීමට තෝරාගත්තේ කොතැනද? එකල **පූජ්‍ය කෙහෙල්ඇල්ලේ කුසලසිරි හිමියන්** වැඩ සිටි ගිලන් කුටියක් ලෙස භාවිත කළ, දෙමහල් කුටිය ස්වාමින්වහන්සේලාගේ නවාතැන වූහ. වහලය සිදුරු සහිත ඉහළ මහලය විවෘත එම කුටියේ විවෘත පෙදෙස සිවුරු වලින් ආවරණය කර වැඩ සිටි අයුරු දුටු විට අපට සිහිපත් වූයේ අතීතයේ වැඩසිටි ගංගාතීරිය **මහරහතන් වහන්සේ** වැනි ශ්‍රේෂ්ඨ උතුමෝය. ස්වාමින්වහන්සේ දෙනම වැඩම කරවා දින තුනකින් නැවත අපි සන්ධ්‍යාවේ පැමිණියේ තොරතුරු දැනගන්නටයි. අපේ වැඩ කටයුතු නිමවා අප එන විට රාත්‍රී 8ට පමණ වී තිබුණා. අප ගිය රථය නවතා පිණ්ඩපාත ශාලාව දෙසට ළංවෙන විට ලී කපන කොටන සද්දයක් ඇහුනා. අපි ළංවෙනවිට දුටුවේ ස්වාමින්වහන්සේලා ලෑලි කපමින් ඇණ ගසමින් කුමක්දෝ කරනවා. අපි එහි ගොස් වන්දනා කරමින් විමසුවා,

"අවසර ස්වාමින්වහන්ස, මොනවද මේ කරන්නේ?"

අප දෙස බැලූ ස්වාමින්වහන්සේ කිව්වේ "මහත්තයෝ, මේකෙ දොරක් නෑ. දොර කැඩිලා. බල්ලෝ රිලව් මේකෙ ඇතුලට එනවා, කියන්න කෙනෙකුත් නෑ. ලෑලි ටිකක් හේත්තු කරල පරණ ඇණ ටිකක් ගහල යන්තම් මාට්ටු කරගන්නව මේ දොර ලෑල්ලක්"

ඇත්තටම ඒක විස්මිත වැඩක්, හරිහමං ආයුධයක් නැතුව එළවලු කපන, දර කපන මන්න පිහි වලින් කපා කොටා මට්ටම් කර ඇණ ගසා පැය 1½ ක් වන විට දොර සවි කර තීන්තද ගා අවසන් කළා. අපිටත් බලාසිටින්නට බැරි නිසා හැකි පමණින් උදව් වුණා. මේ සිදුවීම දුටු දා පටන් අපි තීරණය කළා පුළුවන් සෑම දිනකම සන්ද්‍යාවේ මේ සෙනසුනට එන්නට.

## මාසයකට පසු දිනක තවත් සිදුවීමක්

එදින සැන්දෑවේ අපි සෙනසුනට පැමිණියා. කටානේ ශාන්තිරත්න මහත්මයාද පැමිණ සිටියා. අපේ පුංචි කම්ටුවේ දැන් ඉන්නෙ අපි තුන් දෙනයි, ස්වාමින්වහන්සේලා දෙනමයි. පුරුදු ලෙස සන්ධ්‍යා බුද්ධවන්දනාව අවසානයේ ගිලන්පස ගැනීමට ස්වාමින්වහන්සේලා පහළ ශාලාවට වැඩියා. හැමදේටම අපිට තිබුනේ එච්චරයි දානේ සකස් කරන්න, පිණ්ඩපාත දානෙ බෙදන්න, දානෙ වළඳන්න, භාවනා කරන්න, ධර්ම දේශනා කරන්න, කම්ටු රැස්වීම් තබන්න, ගිහි අයට නවතින්න ඔක්කෝටම එකයි. හරියට ඉස්සර තිබුණු බෙහෙත් තෙල **"කෝකටත් තෛලෙ"** වගේ.

භාවනා ශාලාවක්, ධර්ම ශාලාවක්, රැස්වීම් ශාලාවක්, පිණ්ඩපාත ශාලාවක්, දන ශාලාවක්, ගිහි නවාතැනක්, මුළුතැන් ගෙයක්, ඔක්කෝටම එකයි. එතනදී එකතුවෙලා කතා කරද්දී ලොකු ස්වාමින්වහන්සේ ඊළඟ පියවර ගැන මතක් කළා. ඒ තමයි මීළඟට වහාම කළ යුතු දේ.

"මහත්මයා අපි ඉක්මනටම අලුත් වැසිකිළි පෙළක් හදන්න ඕන. අර ඉස්සරහ ඇතුල්වෙන තැනම තියෙන වැසිකිළි දැන් හොඳටෝම ජරා වෙලා. සමහරක් කඩා වැටෙන්න ඔන්න

මෙන්න. ඒක දැක්කමත් එන අයට මුළු සෙනසුනම එපාවෙනව. ඊටත් වඩා එදා අපිට මේ ස්ථානය බාරදීල යන්න පිටත් වුණ වෙලාවේ පූජනීය කහගොල්ලේ ස්වාමින්වහන්සේ මට කිවුවා වහාම මේ වැසිකිළිපෙල අයින් කරන්න කියලා. මම ගුරු ගෞරවයක් වශයෙන් ස්වාමින්වහන්සේ ආයේ වඩින්නට පෙර එය මුලින්ම කරන්න වුණා.''

''හොඳයි අපි කරමු'' අපි එකඟ වුණා.

''නමුත් මහත්මයා අලුතෙන් වැඩක් පටන්ගන්න තරම් අපිට ශක්තියක් නෑ නේද?'' එවිට එකල සභාපතිතුමා ලෙස හඳුන්වන සුනිල් ශාන්ත මහත්මා පැමිණියා. කතාවට එක්වූ ඔහුගේ අදහස් වලින් ඉස්මතු වුනේ සෙනසුනේ දියුණුව ප්‍රියකරන අවංක සැදැහැති ගුණවත් අයෙක් බවයි. එතුමා අපිට යමක් මතක් කළා.

''අවසර! මේ සෙනසුනේ පරණ කමිටු එකක් තිබුණා. මතකද එදා බාරදෙන දවසේ ලොකු ස්වාමින්වහන්සේ ඉස්සරහ කතාකර වයෝවෘධ උපාසක මහත්තුරු දෙන්න, ඒ තමයි **රත්නායක රාලහාමි**, බොහොම පැරණි ගුණවත් කෙනෙක්. එතුමා තමයි ඒ කාලෙ **භාණ්ඩාගාරික** තුමා විදියට වැඩ කලේ. අනිත් කෙනා **තලගම පියදාස මහත්තයා** හිටපු **ලේකම් තුමා,** දෙන්නනම් බොහෝම ගැලපෙන පින්වත් දෙන්නෙක්. ඉස්සර ඉඳලම යාළුවො හරිම ලෙන්ගතුයි සෙනසුනට. අපේ තාත්තත් එක්ක ඒ දෙන්න තමයි මුල ඉඳලම මේවා බලාගත්තෙ. එදා කතාවෙදී කිවුවා මෙහෙම දෙයක්. ''**මං හිතන්නේ අවසරලටත් මතක ඇති**'' (මේ මහතා ''අවසර'' යනුවෙන් ආමන්ත්‍රණය කරන්නේ ''ස්වාමින්වහන්සේ'' යන වචනය වෙනුවටය.)

''අපි බොහොම අමාරුවෙන් මේවා රැක ගත්තා. අද එකේ ප්‍රතිඵලය අපිට මතු බුදුවෙන නා උයනේ ලොකු ස්වාමින්වහන්සේ පිහිට වුණා. දැන් ඉතිං ආයේ බලාපොරොත්තු තියාගන්න පුළුවන්'' ඒ වයෝවෘද්ධ මහත්මයෙක් කියූ කතාව සුනිල් ශාන්ත මහත්මා මතක් කර දුන්නා. තවද එම කතාව පෙන්වා දෙන සුනිල් ශාන්ත මහත්මා මෙයද මතක් කළා. ඒ වයෝවෘද්ධ පින්වත් මහත්තුරුන්ගේ වාග් විලාශයෙන්මයි ''**අපි**

**නැති නාස්ති නොකර අපේ ගිණුමේ රුපියල් ලක්ෂ 3ක් තියාගෙන ඉන්නව. ඒකනම් හොල්ලන්නෙ නෑ. හදිස්සියකට තියාගන්න ඕන.** මතකද ඒ කතාව?'' සුනිල් ශාන්ත මහතා කිවුවා.



එසේ කිවුව එතුමා ''**එහෙම කිවුවට අවසර, අපිට පුළුවන් ඒ අය කැමති කරවාගෙන මේකෙ බරපැන ලබාගන්න.**''

අපි කවුරුත් එකඟ වුණා. අපි අහන විගසින් ඒ පින්වත් මහත්වරුන්ද අපේ අදහසට කැමති වුණා. අමාරුවෙන් රැකගත් වියදම අපට ලබාදුන්නා. සති කිහිපයක් ඇතුලත යුහුසුළුව වැසිකිළිපෙල සහ තවත් නඩත්තු කටයුතු කරන්නට එවකට සිටි පාලක ලේකම් තුමාටත් (සේනාධීර) ගිණුම් පරීක්ෂක තුමාටත් භාණ්ඩාගාරික **රත්නායක මහත්මාටත්** බාර වුණා.

දිනපතා සන්ධ්‍යාවේ අපි එන හැම දිනයකම වගේ **ශාන්ති මහත්මාද** අපට හමු වුණා. ''**මහත්මයා මෙහෙ නැවතිලා වගේ**'' අපි හිනාවෙවී අපේ සතුට ප්‍රකාශ කළා. ''**ඔව් මහත්තයා**

**දැන් ඉතිං නහින දෙහින කාලෙනේ. එලොවටත් යමක් එපැයි"** එතුමාද හිනාවෙවී කිවුවා.

නමුත් ශාන්ති මහත්මා දවස පුරා සෙනසුන පිරිසිදුකිරීමේ කටයුතු වල නිරතව සිටියා. ඊට හේතුව හැමතැනම මහා කුණු ගොඩවල් කැලේ පුරාවට ඉටිකොළ ඉටි කවර ඒ නිසා ඒවා පිරිසිදු කරමින් ස්වාමින්වහන්සේලාට උපකාර වුණා.

ඊළඟ දවසේ සැන්දෑවේ අපි එනකොට කුඩා මිදුලේ ජරාවාස වී වැසිකිළි පෙළ ළඟ ස්වාමින්වහන්සේ කුළු ගෙඩියකින් පහර දෙනව. වන්දනා කර අපි ඇසුවා, **"ස්වාමින්වහන්ස, අදත් වැඩක්ද?"**

"ඔව් මහත්තය, දවල් දවසේ විවේකයෙන් ඉඳල සන්ධ්‍යාවේ බුද්ධවන්දනාව කරල පහලට වැඩිය ගිලන්පස ටිකක් ගන්න. ගිලන්පස ගත්තට පස්සෙ මතක් වුණා.

අපේ ගුරු උතුමන්වහන්සේ, කහගොල්ලේ සෝමවංස ස්වාමින්වහන්සේ කියපු කතාවක්. මහත්තය දන්නේ නැනෙ"

අපිට එදා මෙහෙ බාරදීල අපහු වඩින්න පිටත් වෙද්දි වාහනේ ළඟට අපි ලං වුණාම මට කිවුවා "ආයස්මතුන්වහන්ස, මේ පේනවා නේද මේ ජරාවෙච්ච වැසිකිළි පෙළ. සෙනසුනට ඇතුලුවෙන තැනම. මේක බුද්ධ භූමියේ ගැලපෙන දෙයක් නෙමෙයි. මේක අයින් කරල දාන්න කියල."

"ඒ නිසා මම හිතුව ව්‍යායාමටත් එක්ක මේක කඩල දමන්න. නමුත් මහත්තය මට මේක තනිව කරන්න වුනේ නෑ. මේ බලන්න, මේ ළඟ පාත ඉන්න දරුවෙක් ඇවිල්ල තමයි මේ ටික කරේ, මම කරේ බලා හිටිය එක."

කවුද ඒ ළඟ පාත දරුවා?

අසල්වාසී නිවසේ සිටින ගුණවත් තරුණයෙක් අපි කවුරුත් එයා හඳුන්වන්නේ **මංජු** කියලා. ඒ සමගම **සමීරත්** හිටියා. සෙනසුනේ ලොකු ස්වාමින්වහන්සේ වන **සමිත**

**ස්වාමින්වහන්සේ** මෙසේ කියද්දී, අපේ ඇඳුම් පැළඳුම් ගැනත් නොසිතා අපිත් එයට එකතු වුණා. පැය කිහිපයකින් එය සම්පූර්ණයෙන් අස්කර දමන්නට හැකි වුණා.








## පළමු දායක ආධාරය

සෙනසුන හැමතැනම විදුලිය අක්‍රමවත්, පුංචි පොදටත් විසන්ධි වී අඳුරු වෙනව. හේතුව කුමක්ද? පාළුවට ගිය කාලෙ ප්‍රධාන ස්විචයට අකුණු සැරක් වැදිල එය පුපුරා සුනුවිසුණු වී ගිහින් යන්තම් වයර් එල්ලගෙන වැඩ ගත්තේ. එය අලුත්වැඩියා කරන්න රු. 20,000ක මුදලක් වැය වන බව කාර්මික ශිල්පියා කිවුවා. නමුත් එවකට කිසි ආධාරයක් නෑ, මේ වන විට පළමු වස් කාලෙ අඩක් ගෙවී ගිහින්.

එසේ වුණත් විදුලිය ගැන සිතන්න ස්වාමින් වහන්සේලාට වෙලාවක් තිබුනෙ නෑ අනික් කටයුතු නිසා. ඊටත් වඩා අගෝස්තු ඉඩෝරය ලොකුවට බලපෑවා. නල ළිදක් තිබුනට එය අක්‍රමවත් වෙලා, බට කැඩිලා. මොටරේ පිච්චිලා. අනික් ළිඳ බින්දුවට හිඳිලා.

සුනිල් ශාන්ත මහත්තයා වැඩපලේ අලුත් නාන කාමරයක් හදල ආරාධනා කළා. "අවසර! ඉඩොරේ සැරයි. පැන් පහසුවෙන්නත් වතුර නැතිව ඇති නේද?" ඔහු කිවුවා.

ස්වාමින්වහන්සේලා වැඩි යමක් නොකිය, "මහත්තය අපිටත් වඩා අනිත් පළාත් වලට බලපානවා ඇති නේද?" කිවුවා. එදා හැන්දෑවේ සුනිල් මහත්මයා ඇවිත් හිටියේ බොහොම සතුටින්. ඉඩෝරෙ ගැන ඇහුවෙත් තව යමක් යටි සිතේ තබාගෙන, ඔහු හඬ අවදි කළා. "**අවසර! මම වැඩපලේ නාන කාමරයක් අලුතෙන් හැදුවා, අවසරලට කැමති විදියට පැන් පහසුවෙන්න. ඔන්න මම ආරාධනා කළා.**" හරි සතුටින් කීවා. ඇත්තටම ඒක වෙලාවේ හැටියට ලොකු පරිත්‍යාගයක්. නමුත් අපිට දැනගන්න ලැබුනේ ස්වාමින්වහන්සේලා එතනට නොවැඩිය බවයි.

රාත්‍රී කාලයේ වතුර බේසමකට අරගෙන යන්තම් දාඩිය ගඳ නිවාගනිමින් ඒ කාලය වැසි සමය තෙක් ඉවසා තිබුනා. විදුලිබලය ගැන හිත වැඩිපුර යෙදුනේ වස් කාලය ගෙවී යමින් තිබුන නිසා. පිං කමට ස්වාමින්වහන්සේලා වඩිනවා, සෙනග රැස් වෙනවා, නා උයනේ ලොකු ස්වාමින්වහන්සේත්, නාථගනේ ලොකු ස්වාමින්වහන්සේත් වඩිනවා. ඒ නිසා මේ තියෙන වැඩ, ටික ටික කල් ඇතුව කරන්න ඕන කවුරුත් කතා වුණා. ඒ ළඟ දිනයක තමයි පිළියන්දල සමරසිංග මහතාගේ වාර්ෂික දානය හිටපු ලේකම් මහතා බොහොම හොඳට දන්නා කෙනෙක්. එතුමා එම මැතිනියට විදුලි ගැටලුව ගැන මතක් කළා. ඇයගේ දානය දින නඩත්තුවට. රු.20,000ක් දී තිබුණා. එයින් විදුලිය පිළිසකර කළා.

## පළමු වස් පිංකම

වස් කාලය නිමාවීමටත් පෙර පැරණි කමිටුවේ ප්‍රධාන ක්‍රියාකාරී සාමාජිකයන් දෙදෙනෙකු සෙනසුනට පැමිණියා. ඒ අන් අයෙක් නොව අපි මුලින් සඳහන් කළ මෙම සෙනසුන ආරම්භයේ සිටම පින්බිම රැකගන්නට වෙහෙසුණු සත්ගුණවත් **රත්නායක** භාණ්ඩාගාරික මහත්මා සහ සත්ගුණවත් **පියදාස** ලේකම් මහත්මාය. ඔවුන් මූලික වී කඨින මහා පිංකම සංවිධානය කළ අතර, අපට හැකි හැම උපකාරයම සාමූහික හැඟීමෙන් සිදු කළහ. ඒ මහා පින්කමට බෝධිසත්ව ගුණෝපේත අතිපූජනීය නා උයනේ මාහිමිපාණන් වහන්සේ වැඩම කරවා ගැනීමට හැකිවීම මහත් වූ භාග්‍යයකි.

## සේනාසන පූජාව සහ ශ්‍රමදාන

තවමත් ස්වාමින්වහන්සේලා වැඩ සිටින්නේ සිවුරු වලින් ආවරණය කළ කුටියෙමයි. දැන් දැන් හිරිපොද වැසි වැටෙමින් තිබුණා. සීතල සුළඟ ඒ වගේමයි. මහා වැස්සට වැඩි ඇතක් නෑ. නමුත් මහවැසි කාලයේ වැඩ සිටින්නට සුදුසු කුටියක් තිබුනෙත් නෑ. මා මිත්‍ර අබේගුණවර්ධන මහත්මා ඒ ගැන සිතුවා. තම ස්වකීය වියදමින් සෙනසුනක් සාදා පූජා කිරීමට අදහස් කළා. නැවත රැස් වූ දිනයක අපේ පුංචි කමිටුවේ මාතෘකාව වූයේ එයයි.

**"දැන් වැස්සත් ළඟ ළඟ ස්වාමින්වහන්සේ තාම සිවුරු කුටියේ. කොහොමද සීතලේ වැඩ සිටින්නෙ? මම තීරණය කළා කුටියක් හදලා පූජා කරන්නට."** මේ අදහස ඉදිරිපත්වන විට එතන සිටි **ශාන්තිරත්න මහත්මයාද, වෛද්‍යාචාරිනි සුමනා විමලරත්න මහත්මියද.** තවත් කුටියක් සාදා පූජා කරන්නට තීරණය කළා. ඒ අනුව දිනයක් යොදාගෙන ස්වාමින්වහන්සේලා පිරිත් සජ්ඣායනා කරද්දීම කුටි දෙකටම මුල් ගල තබා වැඩ ආරම්භ කළා.





කුටි සෑදීමේදී අපේ අදහස් වලටත් වඩා අපි මුල් තැන දුන්නේ ස්වාමින්වහන්සේලාගේ අදහස් වලටයි. ඒ නිසා ඉතා කුඩා කුටි සෑහෙන බව ස්වාමින්වහන්සේලා සඳහන් කළ බැවින්

අපි ඉදිකිරීම් ඒ අනුව සැලසුම් කළා, සැදැහැති අප මිතුරෝ පිනෙහි අගය නුවණින් සලකා තම ධනය පමණක් නොව ශ්‍රමයද පරිත්‍යාග කරමින් කුටි සෙනසුන් නිමවාගන්නට වෙහෙසුනා. ශ්‍රමය දන්දුන් පිරිස අතර,

- බුලත්සිංහල ඩීන්ස් දයාල් මහත්මා සහ මිතුරු පිරිස
- අබේගුණවර්ධන මහත්මා ඇතුලු පිරිස
- බලතව සමීර මල්ලි ඇතුලු මිතුරු පිරිස
- මෙනේරිපිටියේ පිරිස
- මායිම්ඹලුවේ උපාලි මුදලාලි මහතා ඇතුලු පිරිස
- ශාන්ති මහත්මා ඇතුලු පිරිස
- කටානේ සුනිල් මහත්මා ආදී බොහෝ දෙනා ඉතා උනන්දුවෙන් ඉදිරිපත් වුණා.

පාරක් තොටක් නැති කඳු මුදුනට අමුද්‍රව්‍ය ගෙන යාම ලේසි දෙයක් නොවෙයි. ශ්‍රමයෙන් දායක නොවුනේනම් කෙසේ මෙවන් කටයුක්තක් කරන්නද?









කෙසේ නමුත් මාස කිහිපයක් ඇතුලත කුටි සෙනසුන් සාදා. නිම කර පූජා කරා. ඒ අනුව 2011 කඨින පිංකම වන විට කුටි සෙනසුන් 2ක් පූජා කරන්නට අපිට හැකි වුණා.

## ධර්ම ශාලාවේ වැඩ ඇරඹුම

සෙනසුනට ඇතුළුවන විගසම ඔබට දකින්නන්ට පුළුවන් ඉහල මහලය පමණක් සම්පූර්ණ කළ ලස්සන ධර්ම ශාලාවක්. ඉස්සර එතන එවැන්නක් තිබුනේ නෑ. වැලිමළුවක් මත කුඩා මල් ආසනයක් පමණයි එහි තිබුණේ. බණ අහන්නයි, දානෙ උයන්නයි, දානෙ වළඳන්නයි, ගිහි අයට නවතින්නයි හැමදේටම එකම ශාලාවයි තිබුනෙ කියලා අපි මුලදීත් ඔබට කිවුවනේ. ලොකු ස්වාමින්වහන්සේ කියන විදිහට මේ අලුත් ධර්ම ශාලාවේ වැඩ ආරම්භ වුනේ මෙහෙමයි.

දවසක් උන්වහන්සේට හිතුනා මෙතන ශාලාවක් තිබුනානම් වටිනව කියල. නමුත් ඉදි කරන්න පිළිවෙලක් නම් තිබුනෙ නෑ. සැලසුම් කරන කෙනෙක් හිටියෙත් නෑ. කඳු මුදුනේ පුංචි විහාරයේ උදේ වත්පිළිවෙත් අවසන් කර, වන්දනාව නිමවා,

භාවනා පර්යංකයට සූදානම් වෙලා. විනාඩි කිහිපයක් යන විට ඔය දැනට තියෙන සැලසුම තම ඉදිරියේ එකවරම මැවී පෙනිලා ඔය ඉදිකර ඇති කොටස පමණක් නම් නොවේ. තවමත් ඉදි නොකළ පහල මාලයේ අවු. 2000 ට පෙර අනුරාධපුර යුගයේ තිබූ ඉතා පෞරාණික ලක්ෂණ ඇති සැලසුමකුත් තිබුණා ඒ හදිසියේ මැවුණු දර්ශනයේ. ඒ ටිකකින් කවුදෝ කඩවසම් තරුණයෙක් තමා ඉදිරියේ සිනහවෙමින් සතුටින් ඉඳගෙන මෙහෙම කිවුවලු.

"ස්වාමිනි! ඔබවහන්සේලා පැමිණීම මට හරි සතුටක්. මට පුළුවන් තරම් ඔබවහන්සේලාට උදවු කරනවා." එසේ කියූ ඒ තරුණයා එසැනින්ම නොපෙනී ගිහිං. සියල්ල අමතක කළ ස්වාමින්වහන්සේ සුපුරුදු භාවනාවට නිරත වුණාලු, දවල් දානයට වැඩම කර ඉන්පසු සවස් කාලයේ ඒ උදේ මැවී පෙනුණු විහාරයේ සටහනක් ඇන්දාලු එදා සන්ද්‍යාවේ සුනිල් ශාන්ත මහත්මා පැමිණි විට තමන් උදේ දුටු දේ නොකියා තමන්වහන්සේ මෙම ස්ථානයේ ධර්ම ශාලාවක් ඉදි කරන බවත් ප්‍රකාශ කරාලු.

"චුටි මහත්තයා ආපු එක ලොකු දෙයක්"

"ඔව් අවසර මම මේ වැඩපලට ගිහිං ගෙදර යනගමන් අවසරල දැකල යන්න ආවා."

"එක හොඳයි. ***සමනානංච දස්සනං ඒතං මංගල මුත්තමං*** කියලා ඔය මංගල සූත්‍රයේ තියෙන්නෙ"

"ස්වාමින්වහන්සේලා දැකීමත්, කතා කිරීමත්, උපස්ථාන කිරීමත් දියුණුවට කාරණයක්නේ"

"චුටි මහත්මයා, මම හිතාගෙන ඉන්නෙ මෙතන මේ කුඩා වැලිමළුවත්, ආසනයත් අයින් කරන්න." කෑම උයන ශාලාව ඉදිරිපස ඇති කුඩා වැලිමළුව පෙන්වමින් කිවුවා. එවිට සුනිල් ශාන්ත මහත්මයා අහනව.



"ඒ ඇයි අවසර, ඔහොම තිබුනම කරදරයක්ද?"

"නෑ මහත්තය, අපිට ඔක්කෝටම තියෙන්නෙ ඔය පරණ ශාලවනේ දානේ උයන්න, බණ කියන්න, සිල් ගන්න, බුද්ධ වන්දනා කරන්න, ගිහි අයට නවතින්න හැමදේකටම ඔච්චරයි තියෙන්නෙ. ඉතිං මේක මේ මහා කරදරයක්. විශේෂයෙන්ම පෝය දවසට කුස්සිය පැත්තේ කෑ ගහද්දි උයද්දී මහා සද්ද බද්ද කොහොමටත් ඒවා නවත්තන්න බැහැනේ. හොඳයි, සද්ද නැතුව පොල් ගාන්න පුලුවන්ද. අනිත් වැඩත් එහෙම්මම තමයි. වැඩ කරද්දී කතාකරන්න වෙනවා. ඒ නිසා සිල් ගත් අයට ලොකු බාධාවක් අන්න ඒ නිසා තමයි මං හිතුවෙ මේ මළුව අයින් කරලා ශාලාවක් හදන්න. බණ කියන වෙලාවට බුද්ධ පූජා පවත්වන වෙලාවට අපේ බුදුරජාණන්වහන්සේට වඩින්න එහෙම විශේෂ තැනක් තිබුනොත් හොඳයි නේද?" (එහෙම කිව්වෙ බුදුරජාණන්වහන්සේ ජීවමානයි කියන හැඟීම සිතට අරන්)

"අවසර! එක කොච්චර හොඳද? අවසරට කියන්න ඔය ටිකක් බැඳල වැලිමළුවක් වගේ සකස්කරල, කුඩා මල්

ආසනයත්, ඔය ඔක්කොම හැදෙව්වේ අපේ අප්පච්චි. ඉතිං එතුමාටත් පිං සිද්දවෙන්න මම ඔය ශාලාව හදන්නම්.'' සුනිල් ශාන්ත මහත්මය කිවුවා.

''චූටි මහත්තයෝ මේක ලොකු වැඩක්. රුපියල් ලක්ෂ 50ක් 60ක් වත් විතර යාවි. ඒ ඉහල මාලයට විතරයි. පහල මාලයත් එක්ක සම්පූර්ණ කලොත් ලක්ෂ 100ක් වත් වෙයි, ඒ නිසා මේක තනිවම කරන්න බෑ මං හිතන්නේ. මහත්තයාගේ යාලුවොත් එකතුකර ගත්තොත් හොඳා. එතකොට ඒ අයටත් පිනක් කරගන්න පුළුවන්නේ.''

''අවසර! මං කැමති නෑ ඔය සම්මාදම් වලට. එහෙම කරනකොට නොයෙක් කතන්දර අහන්න වෙනව. මම පුළුවන් විදියට තනිවම කරන්නම්.'' චූටි මහත්තය කිවුවා.

''හොඳයි මහත්මයා. ඔබතුමාගේ කැමැත්තක්.''

''ඉතිං අවසර! ඕකට හොඳ සැලසුමක් ඕන නේද.''

''ඔව් සැලසුමක් නැතුව මුකුත් කරන්න බැහැනේ මහත්තයා. මං ළඟ සැලසුමක් තියෙනවා. නමුත් ඇස්ටිමේට් එකක් (වියදම් තක්සේරුවක්) නම් නෑ.''

''ඒකට කමක් නෑ අවසර, සැලසුමක් තිබුනම ඇති. එන එන විදියට වියදම් කරමු. බොහොම සතුටින් ඒ මහත්මා අදහස ප්‍රකාශ කළා.''

එතුමාගේ කැමැත්ත නිසා. ස්වාමින්වහන්සේ අඳින ලද සැලසුම පෙන්වූ පසු සතුටට පත් චූටි මහත්මා (සුනිල් ශාන්ත මහත්මා) එය වහ වහා ඉදි කිරීමට සැලසුම් කළා. මෙය සිදු වුණේ ඒ වස් කාලය තුළමයි.

''ඉතිං අවසර අපි කවද්ද කොහොමද මේක පටන් ගන්නෙ?''

"අපේ මත්තයා, දැන් වස් පිංකමට නාඋයනේ ලොකු ස්වාමින්වහන්සේ වඩිනවා. අපි එදාට උන්වහන්සේගේ ආශීර්වාද ලබමින්ම මේකට මුල් ගල තියලා වැඬේ පටන් ගමු."

කතාකරගත් පරිදිම 2011 වස් අවසාන පිංකම දින උදයේ සුබ මොහොතින් අති පූජනීය නාඋයනේ මහා ස්වාමින්ද්‍රයන් වහන්සේ ඇතුලු මහා සඟරුවන සෙත් පිරිත් සජ්ඣායනා කරමින් ආශීර්වාද කරද්දී චූටි මහත්මා (භාණ්ඩාගාරිකතුමා), අබේගුණවර්ධන මහත්මා (ලේකම්තුමා), ශාන්තිරත්න මහත්මා (ගිහි උපදේශකතුමා), සමන් මහත්මා (උප භාණ්ඩාගාරිකතුමා) ඇතුලු පිරිස විසින් චූටි මහත්මාගේ මුලිකත්වයෙන් මුල්ගල් තැබීමෙන් මූලික වැඩ ආරම්භ කළා.

දිනෙන් දින වැඩ කටයුතු කඩිනමින් සිදුවෙමින් පැවතුනා. බිම සකස් කිරීමට මිනුවන්ගොඩ සැදැහැති වජිර ප්‍රියන්ත මහතා ස්වකීය බැකෝ යන්ත්‍රය (එක්ස්කැවේටර්) ලබා දුන්නා. අඛණ්ඩව ඉදිකිරීම් කළ යුතු නිසා තම අන් වැඩකටයුතුද නොතකා නිර්මාණශිල්පී මංජු මහත්මා අඛණ්ඩව සේවයේ යෙදුනා.

චූටි මහත්තයා බිස්නස් වැඩ කොතෙක් තිබුණත් නිතර මේ ශාලාවේ වැඩ බලන්නට අමතක කලේ නෑ. එනිසා දිනක් ස්වාමීන් වහන්සේ කිවුවා "මහත්මයා මහ පුදුම කෙනෙක් කොච්චර වැඩ තිබුණත් නැහැයි නොකියන්න වෙලාවට බඩු සපයනව. වෙන අයනම් මුදල් දීල වැඬේ කරනකම් බලා සිටිනව. ඔබතුමා හරි වෙනස්. කිසි බරක් අපිට නෑ. සියල්ල තමන්ම කරනවා" කියා ප්‍රසංශා කළා. "අවසර කොහොම හරි කරන්නත් ඕනනෙ. ඒ නැතත් අවසර මගේ එකම පුතා නැති වුණාට පස්සෙ ඔක්කොම මගේ තනිකරට ආවනේ ඉතිං මග හරින්න බැහැ."

චූටි මහත්මයා කිව්වේ ඉතා සංවේදී බවකින්.

"එහෙනම් මහත්තය ඒ පුතාටත් පිංසිද්ද වෙන්න සතුටු වෙන්න මහත්තය මේ කරන වැඬේ බොහොම වටිනවා. මං හිතනවා එතුමා දිව්‍යලෝකේ ඉඳන් බලන් සිටිනවා ඇති. ඒ විතරක් නෙමෙයි මෙතනටත් ඇවිත් මේ වැඩ දකිමින් සතුටු

වෙනවා ඇති. ඇයි මහත්තයෝ එහෙම කතා බණ පොතේ ඕන තරම් තියෙන්නෙ.''

ස්වාමින්වහන්සේ කිවුවා, එය ඇසූ එතුමාට ඇතිවුනේ මහා සතුටක් ඒ මොහොතේ ඇතිවූ වෙනස දීප්තිමත් වූ දෙනෙතින් හා සිහින් සිනහබර මුවගින් මොනවට පැහැදිලි වුණා. නමුත් බලා සිටි බුද්ධිමත් අයට හැඟීගියේ එතුමාගේ හිතේ වදදුන් මොකක්දෝ මහා ගුප්ත අදුරක් පහව ගියා සේය. ඒ සතුටින්ම එතුමා තමන්ගේ සිතට ආ අදහස මෙසේ ප්‍රකාශ කළා.

''ඔව් අවසර මගේ පුතානම් හොඳ තැනක තමයි ඇත්තෙ, මට එක විස්වාසයි. ඒ කාලයේ හොඳ තරුණ හැඩිදැඩි කොල්ලෙක් වෙන අය වගේ රස්තියාදු නෑ, නරක වැඩ නෑ, යාළුවො එක්ක තිස්සෙම මේ ආරණ්‍යයේ තමයි. හැම වැඩක්ම සාසනය වෙනුවෙන් කළා. අවසරට කියන්න ඔය හදිසියේ ලෙඩ වෙන්න කලින් දවසේ මේ ආරණ්‍යයේ හොඳට වෙහෙසිලා වැඩ කර කර ඉඳල තියෙනව.''

දිනපතා හැන්දෑවට ස්වාමින්වහන්සේලා බලන්න එන පිරිස අතර දැන් දැන් කවුරු නැතත් චූටි මහත්මයා නම් පැමිණීමට අමතක කලේ නෑ. වැඩපලෙන් ගෙදර යනගමන් සෙනසුනට ගොඩවෙන චූටි මහත්මා ස්වාමින්වහන්සේගේ තොරතුරු දැන කතාබහ කරන්නට අතිශය ප්‍රිය කළා. එවන් දිනක හැන්දෑවේ,

''අවසර! එදා වැඩ කරද්දී කිවුවා නේද යහපත් වැඩ කරන තැන් වලට දෙවියොත් ඇවිත් උදව් කරනව කියලා. ධර්මයේ සඳහන් වෙන කතාවක් ගැන.''

''ඔව් මහත්මයා මම එහෙම කිවුවා තමයි, ඉතිං?''

''අවසර! වෙලාව තියෙනවම් මම කැමතියි අහන්න.''

''මහත්තයා ඔය දඹදිව වන්දනාවෙ යනකොට සමහර අය යනවනේ **පැට්නා** කියල නගරයකට. දැනට අවුරුදු 2300කට විතර ඉස්සර ඒ නගරය හැදින්වුයේ **පාඨලී පුත්‍ර** කියලා.

ඉන්දියාවේ තිබුන ලොකුම ප්‍රසිද්ධම වැදගත්ම නගරයක්. එහෙම වුනේ අශෝක මහා රජතුමාගේ අගනගරය වු නිසා සියළුම කටයුතු රජතුමා මෙහෙය වූයේ පාඨලී පුත්‍ර නම මුල් කරගෙන. ඒ නිසාම එහි වික්‍රමශීලා කියලා භික්ෂු විශ්ව විද්‍යාලයකුත් තිබුණා. ඒක මහා විශාල ප්‍රදේශයක පැතිරිලා තිබුන එකක්. දැන්නම් ගල් කැටයක්වත් දකින්න නෑ. ඔය තුර්කියෙන් ආපු මුස්ලිම්වරුන් හින්දු භක්තිකයන්ට එකතු වෙලා ඒ නුවර සම්පූර්ණයෙන්ම විනාශ කළා. බෞද්ධ සටහනක්වත් නැතිතරමට"

"ඒ ලස්සන නගරය හැදුවේ බුදුරජාණන්වහන්සේ ජීවමාන කාලයේ සිටි **සුනීධ** සහ **වස්සාකාර** කියන මහා ඇමතිවරුන්ගේ මුලිකත්වයෙන්. ඒ දෙන්නා බිම්බිසාර මහා රජතුමාගේ රාජ සභාවේ මහා ඇමතිවරු මහා මොළකාරයෝ දෙන්නෙක්. මම එහෙම කිව්වේ කාටවත් හොල්ලන්න, අල්ලන්න බැරි විශාලා මහ නුවර 500ක් ලිච්චවී රජුන් පරදවලා යටතට ගන්න තරම් සුක්ෂම උපායක් කලේ ඔය දෙන්න තමයි."

"ඔය නුවර හදන්න පටන් ගනිද්දී අපේ බුදුරජාණන්වහන්සේ වැඩ සිටියේ ඒ අසල ගමක විහාරයේ දවසක් උදේ ආනන්ද ස්වාමින්වහන්සේට කතා කරල බුදුරජාණන්වහන්සේ මෙසේ වදාලා."

"ආනන්ද, අද විශේෂ දවසක්. **සුනීධ** සහ **වස්සකාර** මහා ඇමතිවරු නගරයක් සෑදීමට මහා පිරිසක් එක්ක පැමිණ තිබෙනවා. ඔය මහා ඇමතිවරු දෙදෙනා ළඟ **මහේශාක්‍ය දෙවිවරු** ආරක්ෂාව දෙනවා. අනෙක් පිරිස් ළඟ **අල්පේශාක්‍ය දෙවිවරු**."

"ආනන්ද, ඔය නගරය තව අවුරුදු 300කින් මේ දඹදිව බොහොම ප්‍රසිද්ද වටිනා නගරයක් වෙනවා එහි සිට ලෝක සත්වයාට මහා උපකාරයක් සිදුවෙන මධ්‍යස්ථානයක් වනවා. නමුත් ආනන්ද ඒ ටික කලකට පමණයි. එකල රජුගේ ඇවෑමෙන් එය සම්පූර්ණ විනාශයට ලක් වෙනවා. ආනන්ද, ඒ නගරය පමණක් නෙමෙයි මේ සියළු හිත ඇති හිත නැති සංස්කාරයක්ම විනාශයට යනවා. එය තමයි සත්‍යය, එය තමයි ධර්මතාවය සියල්ල අනිත්‍යයි නේද ආනන්ද?"මෙම බුදු වදන සිහිකරමින්.

“මෙවන් කතා වලින් පෙනෙන්නේ හොඳ වැඩට දෙවියන් පැමිණෙන බව නේද?” ස්වාමින්වහන්සේ කියා දුන්නා.

මේ තොරතුරු පොත ලියන මම දන්නේ කොහොමද? මේ සියළු කතා අපි හමු වුණාම ස්වාමින්වහන්සේ අපිටත් කියාදෙනවා. මේක අහන මටත් මතක් වුනේ තවත් දෙයක්. ඒ ඔබ කවුරුත් දන්න පන්සලේ, පල්ලියේ, කෝවිලේ, දේවාලේ, අඳුරුකුටිවල නොවෙයි දෙවියෝ වැඩ සිටින්නේ. අපේ මනුස්සයෝ නොදැනුවත්කමට ඒවායේ ගිහිං බලි පූජා, බිලි පූජා, යාඥා, කන්නලවු කරන්න පුරුදු වී හිටියට.

කාලය ගෙවී ගියා. දිනපතා වැඩ කෙරුනා, ධර්ම ශාලාවේ වැඩ බොහෝ දුරට සම්පූර්ණ වුණා. දැන් 2012 වර්ෂයේ කඨින පින්කමට පූජා කරන්නටයි චුටි මහත්මාගේ වුවමනාව. දැඩි අධිෂ්ඨානයකින් දිනය උදාවන තුරු බලා සිටියා.

වස් කාලයේ මුලදීම තම සොයුරියගේ ගොඩවෙල සිංහල බෙහෙත් කඩේ අධිපතිනියගේ සෙනසුනට ඇති වාර්ෂික දාන වාරය. ඊටපෙර දින නාඋයන ආරණ්‍යට වැඩිය ස්වාමින්වහන්සේලා ආපසු වඩින ගමනේ කුඩා බුදුපිළිමයක් ගැනීමට ඩ්‍රයිවර් මහතා සමඟ මෙම කඩයට ගොඩ වුණා. නමුත් උන්වහන්සේලා දැන සිටියේ නැහැ මෙහි අයිතිකරු කාගේ කවුද සෙනසුනේ දායකයෙක්ද යන වගක්.

බුදුපිළිමය තෝරාගෙන තෙමහල් ගොඩනැගිල්ලේ ඇති අනෙකුත් බුදුරුවවල මිලද බලමින් ඩ්‍රයිවර් මහතා සමඟ කඩය පුරා ඔබමොබ සැරිසරනා නමුත් කිසිවක් ගැනීමට තරම් මුදලක් තිබුනෙ නෑ.

සෙනසුනට පැමිණ දින කිහිපයකට පසු සන්ද්‍යාවේ සුදු වෑන් රථයකින් පැමිණි පිරිසක් මහා පරිෂ්කාර ගොඩක් සෙනසුන ඉදිරියේ ගොඩගැසුවලු, ස්වාමින් වහන්සේලා පුදුම වෙලා. ඇයි මේ සියලුදේම සෙනසුනට අවශ්‍ය දේවල්, අපි දවසක් කඩේකට ගිහිං මිල ගණන් බැලුවා නමුත් ගන්න සල්ලි තිබුනෙ නෑ ඒ නිසා ආවා. මෙන්න අද සියල්ල ලැබිල.





විමතියෙන් යුතුව මේ කතාව පැමිණි සැදැහැති දායක මහතාට සහ මැණියන්ට කීවා.

"අවසර! ඒ අපේ කඩේ තමයි." මැණියෝ සතුටින් කීවා.

"ඒ වෙලාවේ කඩේ හිටියේ අපේ පුතා. දැන් ඒක කරගෙන යන්නේ පුතා, අපි ඒක පුතාට බාර දුන්නා. දැන් අපේකාලෙ ඉවරයි . ඕව බඳාගෙන ඉඳල කොහේ යන්නද? ගෙනියන්නද? අනික අපේ පුතා දැන් දැනුම් තේරුම් ඇති කෙනෙක් එයාට භාරදීල අපිත් ඉඩතියෙන වෙලාවට උදව් කරනව. එදා අවසරල ගිහිං ඒවා බලද්දී පුතා කැෂියර් එක ළඟ ඉඳල ස්ක්‍රීන් එකෙන් බලල ඔක්කොම ලියල තිබුනා. අපි ඒ බඩු ටික තමයි ගෙනාවේ."

"අපි දැනගත්තා මේවා සේනාසනයට ඕන බව" ඒ කතාව ඇහුණාම තමයි අපි දැනගත්තේ කඩසාප්පුවේ හැම තැනම කැමරා සවිකරලා තිබුන බව."

කෙසේ නමුත් ඒ පැමිණ තිබුනෙ චුටි මහත්තයාගේ නැගණිය වන සැදැහැති සසුනේ අම්මා කෙනෙක් සහ ඒ මහත්මයායි. ඒ ඔවුන්ගේ වාර්ෂික දාන වාරය නිසා. තවමත් සියළු කටයුතු වලට එකම ශාලාව තමයි භාවිතා කරන්නේ සුපුරුදු පරිදි සන්ධ්‍යා වන්දනාව නිමවී ගිලන්පස සඳහාත්, රාත්‍රී ධර්ම දේශනාව සඳහාත් ස්වාමින්වහන්සේ ඒ ශාලාවට වැඩියා එවිට එතනට පැමිණි චූටි මහත්මයා සහ නැගණිය පිරිස වන්දනා කර සතුටු සමීචියේ යෙදුනා. චූටි මහත්තයා අතේ රෝල් කරපු සුදු පාට අඩි දෙක තුනක් දිග කැලැන්ඩරයක් වැනි යමක් තිබුණා එක දිගහැර දැක්වූ එතුමා.

"අවසර! මේ මගේ එකම පුතා. මට අකාලේ අහිමි වුනු වස්තුව ඔබවහන්සේට පෙන්වන්න අරගෙන ආවේ."

ඒ දුටු ස්වාමින්වහන්සේ විමතියට පත් වුණාලු.

"දෙයියනේ! මෙයාව මම දැකල තියෙනවා, හොඳට හුරු මුහුණක්."

ස්වාමින් වහන්සේ මතක් කළා. ඒ පින්තූරයේ සිනහවෙමින් සිටින හැඩිදැඩි තරුණයෙක්, එක්වරම ස්වාමින්වහන්සේට මතක් වුණා.

"මේ ඉස්සර දවසක් විහාරේ භාවනා කරන්න කලින් එකවරම පෙනීසිටි ලස්සන හිනාවෙන තරුණයා. ස්වාමින්වහන්සේගේ වැඩමවීම ගැන සතුට ප්‍රකාශ කර නොපෙනී ගියා, එය ස්ථිරයි."

නමුත් ඒ බව නොකියා සැනසෙන්න දහම් බිදක් කියා දුන්නා. නමුත් ස්වාමින්වහන්සේ දැන සිටියා ඒකාන්තයෙන් මේ පුතා දිව්‍යලෝකේ සැප ලබන කෙනෙක් විය යුතු බව. එදා විහාරයේ භාවනා පර්යංකයට පෙර පෙනීසිට පොරොන්දු වුන පරිදිම තම පියතුමා උනන්දු කරවා පියතුමාටත් මෑණියන්ටත් උපකාරවනු පිණිස මේ සම්බුදු සසුනේ මහා පින්කම් කරගන්ට සිත් පහල කරමින් උදවු කරන්නේ මේ දිව්‍යපුත්‍රයා වියයුතු බව එයින් හැඟී ගියා. කවුරුත් දන්න මට්ටකුණ්ඩලී දිව්‍ය පුත්‍රයා ගැන මදකට සිතන්න. කුඹුරේ වැඩකරමින් සිටි මරණසති වඩන බෝසත් පියතුමා ගැන සිතන්න .මේ කතා ගැන අසනවිට මේ සිදුවීමත් ඒවගේ කියල ඔබට සිතෙන්නැද්ද ? ඒ කතා දෙකෙහිම කියන්නෙ මරණයට පත් පුතා පියතුමාට පිංකරන්න අවස්ථා සලසා දීපු හැටිනෙ.

වස් කාලය ගෙවී අවසන් වුණා. කඨින මහා පිංකම 2012 ආරම්භ වුණා. සුපුරුදු පරිදි සැදැහැති මහජන ගඟක් ගලා ආවා. වෙනදාට වඩා ආලෝකමත්.

ලස්සන ධර්ම මන්දිරය ස්වේත වර්ණයෙන් බබළනවා. ඇතුළත පැහැදිලි නිල් ආකාසයක් වගේ. ඒ ආකාසය පමණක් නොව පළාතම එළිය කරන රන්වන් බුදුපියනාණන් වහන්සේ මහා කරුණාවෙන් බලා සිටිනවා. මෙය දකින අප සැම දෙනාටම මහා පුදුම සතුටක් ඇති වුනේ. එවරත් අති පූජනීය නාඋයනේ මහා ස්වාමින්ද්‍රයන් වහන්සේගේ මූලික අනුශාසනා පරිදි පිංකම සිදු වුණා. එය දුටු අපි බල බලා සිටි බලාපොරොත්තුව සඵල වීමේ සතුට සිත තුළ රැව් පිළි රැව් දුන්නා.





"දැන් ඉතිං කෝකටත් තෛලෙ වගේ ඕන නෑ. බුදුරජාණන් වහන්සේට කරදරයක් නැතුව පිරිසිදුව වැඩ ඉන්න,

දායකයන්ට බණ අහන්න භාවනා කරන්න තැනක් වෙනම තියෙනව චූටි මහත්තයට පින් සිදුවේවා.'' අපේ සතුට ගලාගියා.

**කවදාද රම්‍ය පාසාදය සදා නිම කරන්නේ...**
**කවදාද ස්වේත වන් වූ බුදු සමිඳු වැඩ සිටින්නේ...**
**කවදාද මල් මිටක් ගෙන සම්බුදු සමිඳු පුදන්නේ...**
**කවදාද සුදු වතින් සැරසී දහම් ගුණ පුරන්නේ...''**
**කවදාද බුදු රැසින් මේ මුලු ලොවම එකළුවන්නේ -**
**කවදාද බුදු දහම් සුමිහිරි දෙසවනට ඇසෙන්නේ**
**කවදාද දෙවි ඔඹුන් සතුටින් සාදු හඬ නගන්නේ -**
**කවදාද සමිඳුනේ මේ මනු ලොවේ පහලවන්නේ**
**කවදාද සිල්සුවද දෙන පිං මලක් වී සිටින්නේ -**
**කවදාද දම් සිසිල් පවනින් සිත්සතන්නිවන්නේ**
**කවදාද බුදු පියා වදහල ලෙස බවුන් වඩන්නේ -**
**කවදාද සමිඳුනේ අපි මේ සසර දුක් නිවන්නේ**

අපේ ඒ පැතුම එදා ඉෂ්ට සිද්ධ වුණා. එදා පටන් අපි සැවොම සැම පොහෝ දිනකම අෂ්ඨාංග සීලයේ පිහිටා ගුණ පුරන්න අධිෂ්ඨාන කරගත්තා.

## ප්‍රථම කමිටුවාරය සහ දෙටු නිලතල

තවත් දිනක යාළුවො හතර පස් දෙනා එකට එකතු වුණා. සුපුරුදු පරිදි සන්ද්‍යාවේ බුද්ධ වන්දනා කර ගිලන්පස වෙලාවේ දැන් අලුත් මාතෘකාවක. ස්වාමීන් වහන්සේ ඇහුවා "අද යාළුවො මොකද කතාව?"

"අවසර ස්වාමීන්වහන්ස, අලුත් කතාවක් කියන්න අවසරද?"

"ඔව් කියන්න,"

"ක්‍රියාකාරී පිරිස වැඩිවුණු තරමට පිළිවෙලකට වැඩ කරන්න පුළුවන්. දැනට සැම තීරණයකටම ඉන්නෙ අපි හතර පස් දෙනා විතරයි."

"ඉතිං එපා වුණාද? පිං ඇති කියල හිතුනද?"

"නෑ නෑ අනේ ස්වාමින් වහන්ස අවසරයි සමාවෙන්න. අපි කිව්වේ දැන් අවුරුදු 2ක් ගත වුණා ඔබවහන්සේලා වැඩලා, තාම සෙනසුනට හරිහමන් කමිටුවක් නෑ නේද?"

"ඔව් එකනම් ඇත්ත. නමුත් අපිටනම් බෑ ඔය සමිති සමාගම් කමිටු රැස්වීම වලට කාලෙ ගන්න. ගිහි කාලේ ඕව ඕනෑතරම් කරල එපාවෙලා තමයි පැවිදි වුනේ."

"එහෙමයි අවසර, අපි කිව්වේ ගිහි දායක කමිටුවක් පත් කරගන්න ඕන නේද."

"ඇත්ත අපේ මහත්තයෝ ඔය කතාවට මමත් එකඟයි." තව දුරටත් කතා කළ ස්වාමින්වහන්සේ,

"දැන් ඔක්කොම කරන්න වෙලා තියෙන්නෙ ඔය හතර දෙනාට. පරණ කමිටුවේ වයෝවෘර්ධ මහත්තුරු දෙන්නා දැන් අවුරුදු 90 පැනලා. එත් බලන්න අධිෂ්ඨානය, ධෛර්යය, ශ්‍රද්ධාව, නුවණ, ඕනෑකම කොච්චර වයසට ගියත් මෙහෙ ඇවිල්ලා අපේ දුක සැප බලලා කොහොම හරි මේවා කරනවනේ. ඉතිං ඒ අයට කොයි තරම් පළපුරුද්දක් මේ ගැන ඇද්ද. මම කිව්වේ පැවිදිකම ගැන නෙමෙයි සෙනසුනක කෙරෙන්ඩ ඕන උපස්ථාන, නඩත්තු කටයුතු ආදිය ගැන. දැන් හැදෙන අයට එහෙම තේරුමක් නෑ ඉස්සර අය වගේ. තරහ වෙන්න එපා, මං හිතන්නේ ඔබතුමාලටවත් ඒ තරම් අවබෝධයක් නැතුව ඇති. ඔය මහත්තුරු දෙන්නා බොහොම වැදගත්, මේ සිහිය තියෙන කාලෙ අපි ඒ දෙදෙනාගෙන් උපරිම ප්‍රයෝජන ගන්න ඕන."

ස්වාමින් වහන්සේ එහෙම කිවුවත් ඒ කතාව අපිට නම් තේරුනේ නෑ. ස්වාමින් වහන්සේ මොකක්ද මේ අදහස් කලේ ඇත්තටම අපිත් සෙනසුනට ආව ගියාට ගිහි ගෙදරනේ තවමත් ඔලුවෙන් බාගයක්. අපිට හිතුනේ මේ වයසක දෙන්නට පුලුවන්ද වැඩ කරන්න. ඒ නිසා අපි ඇහුවා,

“හොඳයි අවසර, අපි කොහොමද ඉතිං මේක කරන්නෙ?”

“ඔව් මහත්තයෝ, ඔය දෙන්නා නැතිවෙද්දී ඔය දෙන්නත් එක්කම ඔය වටිනා ගුණ ධර්ම නැතිවෙලා යන්න දෙන්න හොඳ නෑ. අපි ඒවා ඉල්ලගන්න ඕනේ ඒ විතරක් නෙමෙයි වයෝවෘර්ධ අයගේ හිත සතුටින් තබන්න ඕන. එක ලොකු පිං කමක්. ඒ නිසා අපේ ලොකු ස්වාමින් වහන්සේ ඉදිරියේ අපි ඒ අය මේ කරපු ශ්‍රේෂ්ඨ වැඩපිළිවෙල අගය කරලා ආශිර්වාද කරමු. ඒ විතරක් නොවෙයි නිතර දැක දැක සතුටු වෙන අපේ නාඋයනේ ලොකු ස්වාමින්වහන්සේගේ අතින් සිහිවටනයක් ප්‍රදානය කරමු. නවක පරපුරට අනුසාසනා කරන ජ්‍යෙෂ්ඨ අනුශාසක තනතුරට උසස් කරමු. සෑම කටයුත්තකදීම එතුමන් ගෙන්වා ඒ අය මුල් කරගෙන අදහස් ලබාගනිමින් ඒ සෙනසුනේ කටයුතු කරමු. ඔන්න ඕක තමයි මහත්තයෝ අපි ඒ අයගේ කාලයක් තිස්සේ එකතු කර ගනිපු අනිත් අය ළඟ විරල වූ ගුණධර්ම සහ පළපුරුද්ද ඉල්ල ගන්න පිළිවෙල.”

ස්වාමින්වහන්සේගේ ඒ කතාවට අපි සැවොම එකඟ වුණා. ඒ අනුව ඊළඟ කඨින මහා පිංකමේදී (2012) අති පූජනීය නාඋයනේ මහා ස්වාමින්ද්‍රයන් වහන්සේ ඉදිරියේ ඒ සැදැහැති භවතුන් දෙපල විසින් කළ සේවයේ අගය සුවිශේෂී ආශීර්වාද බෝධිපූජාවක්ද සිහිවටන තිළිණ ප්‍රදානයද කරවමින් එදා පටන් නාවිමන වන සෙනසුනෙහි ගිහි ජ්‍යෙෂ්ඨ උපදේශක තනතුරට උසස් කරනු ලැබුවා.

තවද ඒ පූජනීය ස්වාමින්වහන්සේලාගේද අවසරය පරිදි ජ්‍යෙෂ්ඨ උපදේශක දෙපල යටතේ වැඩ කරන නවක නිලධාරී පිරිසක්ද එදින මහා සභා රැස්වීමේදී පත්කරගනු ලැබුවා.

එපමණක් නොව සියළු ඈත මෑත විසිර සිටින දායක පිරිස නියෝජනය වන පරිදි සෑම ප්‍රදේශයකින්ම නව කාරකසභික පිරිසක්ද තොරා පත්කර ගත්තා.

සමගියෙන්, සතුටින්, ශ්‍රද්ධාවෙන්, නුවණින් සසුන රකින්නට මේ සැවොම අධිෂ්ඨාන කරගත්තා. කමිටුව සතුටින්

විසිර ගියා. අපේ අවශ්‍යතාවයත් ස්වාමීන්වහන්සේගේ අදහසත් වුනේ මේ වැඩ පිළිවෙල සෙනසුනේ හා සසුනේ උන්නතියට මහත් රුකුලක් වේවි කියා. නමුත් සිදුවුයේ වෙනස්ම වෙනස් දෙයක්.

කොසොල් මහා රජුගේ අස දිස මහා දානයට පිටු පෑ අයත් සිටිය බව ඔබ අසා ඇති. මේ කතාවත් ඒ වගේමයි. මෙම සිදුවීමෙන් කිහිපදිනකට පසු පැරණි දාන දායකයන් කිහිප දෙනෙක්ම තම වාර්ෂික දාන වාරය අනවශ්‍ය බව කියා ලියුම් එවන්නට පටන් ගත්තා. ඇතැමුන් ඇනුම්පද කියා ලියා එවන්නටත් ගත්තා. අපි පුදුමයට පත් වුණා වඳින්න ගිය දේවාලේ ඔලුවට වැටුනේ ඇයි කියලා. පස්සෙ තමයි වැඩේ තේරුනේ.අපි ස්වාමීන් වහන්සේට කිවුවා.

"ස්වාමීනි මේ මොකද වුණේ? සමහර පරණ දායකයෝ එන්නෙ නැතිලු. ඒ අයගේ වාර්ෂික දානෙ ඕන නැතිලු. දැන් ඉන්න අය හිතුවක්කාර වෙලා සෙනසුන විනාශ කරනවලු. ධර්මය නොදත් විදේශිකයන්ට රැවටිලාලු. ඔය පොත්පවා ලියන්න පටන්ගෙන තියෙන්නෙ" (චූටි මහත්මා විසින් ගෙනත්දුන් ලියන ලද එවන් පොතක මුල් පිටපතක්ද ස්වාමීන් වහන්සේට යොමු කළා.)

අපි එහෙම කිවුවට ස්වාමීන්වහන්සේ නම් කලබල වුනේ නෑ.

"මහත්මයා දන්නවද කොසොල් මහ රජතුමා? එතුමාට හිටියා මහා නුවණක්කාර අග බිසවක් මල්ලිකාදේවී කියලා. වරෙක රට වැසියොත් එක්ක රජතුමා තරගෙට දානේ දුන්නලු. දවසක් රජතුමාට පුළුවන් උපරිමයෙන් දානය කළා, ඊළඟ දවසේ රටවැසියෝ ඊටත් වඩා උසස් වශයෙන් දානය කළා. දැන් ඊළඟ දවසේ දානමය පිංකම කරන්නේ කොහොමද කියලා රජතුමාට හිතාගන්න බැරුව කල්පනා කර කර හිටියා. ඒ කිච්චේ රටවැසියන්ට වඩා උසස් දානයක් සැලසුම් කරන්නේ කියලා. ඒ වෙලාවේ මල්ලිකා දේවිය පැමිණ නුවණින් යුතු අදහසක් ඉදිරිපත් කළා."

"මහ රජතුමනි, ඔබ මේ රටේ අග රජු ප්‍රදේශ පහකට. ඔබතුමන්ට තරම් දානය, වස්තුව රටවැසියන්ට කොයින්ද? මොළේ පාවිච්චි කලොත් හොඳ ලස්සන පිංකමක් කරගන්න පුළුවන්"

"මල්ලිකා දේවිය කිවුවා. ඒ අනුව හස්ති රාජයන් 500ක්, මුතුකුඩ සොඬයෙන් ඔසවා සිටියදී ඒ යට ලස්සනට සැරසූ ආසන මත මහරහතන් වහන්සේලා පන්සියනමක් වඩාහිඳුවා කළ පිංකම මහත්තයලට මතකද?"

"මේක වෙන කාටවත් කරන්න බෑ. ඒ පිංකම වෙන කාගේවත් පිංකමකට සමාන කරන්න බෑ. සසුනක එකම වතාවක් පමණයි එවැනි පිංකමක් කෙරෙන්නේ ඒ නිසා කියන්නේ අසදෘශ පිංකම කියලා."

ඒකට සහභාගී වෙච්ච බොහෝදෙනා සතුටු වුණා. නමුත් බුදුරජාණන්වහන්සේ එතනදී එක බණ පදයක්වත් දේශනා කලේ නෑ. දානය වළඳා අවසානයේ බුදුරජාණන්වහන්සේ රජ මැදුරෙන් පිටට වැඩියා. මහ රජතුමාද බුදුරජාණන්වහන්සේ වහන්සේ පිටුපසින්ම ගමන් කළා බුදුරජාණන්වහන්සේ නැවතුන තැන වන්දනා කර විමසා සිටියා.

"ඇයි මගේ බුදුරජාණන් වහන්ස? කවර වරදක් වුයේදැයි මට නොතේරේ. කියනු මැනවි අනුකම්පාවෙන්. කළ වරද."

**"කවර වරදක්ද මේ නොදනෙමි මෙ මා,**
**පමා දෝෂය මෙ මා කරපු කියනු මැන නොසඟවා**
**අසා සිටිනෙමි සොදින් හදාගන්නට වරද**
**සිරි දෙපා යුග නැමද අයදිමි සම්දුනේ."**

ආයාචනය පිළිගත්තා බුදුරජාණන්වහන්සේ රජුට මෙසේ සැල කරා.

"මහා රජතුමනි බොහෝ දෙනා පිංකම දැකල සතුටු වුණාට ඊරිසියාකාර, මෝහ අදුරෙන් මොට්ට වෙච්ච. ඔබේම

සේවකයෝ දෙදෙනෙක් ඔතන සිටිනවා. මම ධර්ම දේශනා කළානම් ඒ මොහොතේම ඒ අයගේ හිස පිපුරා අපායට යනවා.''

"මහත්මයා අපේ වැඩසටහනේ ඔය වගේ අය ඉඳල තියෙනවා. තනතුරු පට්ටම් බලාපොරොත්තුව. එහෙම මිසක් නුවණක්නම් අබමල් රේණුවකවත් නෑ. ඒ නිසාම අපි කරපු හොඳ වැඩේ තේරුම් ගන්න බැරුව ඔය මෝඩ ප්‍රචාර කරල තියෙන්නෙ. මටත් ඕව ගැන වටින් ගොඩින් ආරංචි වුණා. අපි කලබල වෙන්න ඔන්නෑ. කල් යනකොට ඕව හරියාවි. දානෙ දෙන්න බැරි කෙනෙක් නිකං ඉදීවි, පිං කැමති අලුත් අය එකතුවේවි, අපි ඉවසමු. අපි කරගත්තු විදියට ජ්‍යොෂ්ඨ අනුශාසක මහත්තුරු මුල් කරගෙන අපි වැඩ කරගෙන යමු.''

ස්වාමින්වහන්සේ අපිට කිවුවා. කාරක සභාවේ නියෝජිතයන් පත් කළේ සෙනසුනෙත් සාසනයේත් අභිවෘද්ධිය ගැන හිතලා. ඒ වගේම දායක පින්වතුන්ගේ පුණ්‍ය ශක්තිය, ඥාණ ශක්තිය ඉස්මතු කරලා දෙලොව දියුණුව ගැනත් හිතලා, නමුත් ඒ කිසිවක් හරිගියේ නෑ. අපි සිතූ තරම් උනන්දුවක් පත් කරගත් කාරක සභිකයන් තුළ තිබුනේම නෑ. හැමදාමත් එකතු වුනේ අප කිහිප දෙනෙක් පමණයි. පත්කරගත් කාරක සභිකයන් කිහිපදෙනෙක් හැර අන් අයගේ මුහුණු දකින්නට ලැබුනේ ඊළඟ වර්ෂයේ කඨින පිංකමේදී පමණයි. හැම වැඩක්ම කරන්න සිදු වූයේ අපි කිහිපදෙනාට පමණයි. ඒ නිසාම ඒ කිසිම දවසක මහා කම්ටු රැස්වීම් සඳහා කාලය නාස්ති නොකරන්නට අපි තීරණය කරා. අපි නිතර හමුවුණා අවශ්‍ය තැනදී ජ්‍යොෂ්ඨ උපදේශක මහත්තුරුන්ද සම්බන්ධ කරගෙන මේ වෙනතුරු ලස්සනට සෙනසුනෙහි කටයුතු කරගෙන යනවා.

# දාන ශාලාව

දැන් සෙනසුනේ මිදුලට ගොඩ වුණාම ලොකු වෙනසක් තියෙනවා. නමුත් පරණ තත්වය දන්නා අයට තමයි වෙනස පෙන්නේ. වෙනසක් දකින්න නම් අවස්ථා දෙකක් එහෙම නැත්තම් අරමුණු දෙකක් හෝ කිහිපයක් තියෙන්න ඕනනේ. ඉස්සර ඔය කන්දට ගොඩවෙනකොටම තිබුනේ කුණු ගොඩක්. දිරාගිය වැසිකිළි, පරණ දැල් ගහපු මඩුවක්, පුංචි මිදුලක් නමුත් දැන් කෝ ඒවා ඒ කිසිවක් නෑ. තිබුන තැනක්වත් හිතාගන්න බෑ. හරිම පිරිසිදු සුන්දර දසුනක් දැන් තියෙන්නෙ. ඇත්තටම අපි කිවුවා වගේ ඉස්සර ඔක්කොම කලේ අර ගිහි අය රැස් වෙන ශාලාවේ. එක පැත්තක කාන්තාවන්ගේ නවාතැන් කාමර, අනික් පැත්තේ කුස්සිය, මැද සාලේ තමයි හැමදෙයක්ම කරේ. දානෙ වැළඳුවේ, බණ කිව්වේ, රැස්වීම් තිබ්බෙ ඔක්කොම නමුත් ඒක ලොකු ප්‍රශ්නයක් ස්වාමින්වහන්සේලා එතෙන්ට වැඩිය, දායක පින්වතුන්ගේ නිදහසට බාධාවක්. කාන්තාවන් එහාමෙහා යනකොට ස්වාමින් වහන්සේලටත් හිරිහැරයක් ඒත් මොනව කරන්නද ප්‍රශ්නයට විසඳුම් ගන්න පුළුවන් අතපිරෙන්න බරපැන තියෙනවනම් අපේ පුංචි කමිටුවේ කවුරු කවුරුත් වියදම් කරල සිටින්නෙ ආයේ කියන්න කෙනෙකුත් නෑ. දවසක් ස්වාමින්වහන්සේ කියනවා.

“මහත්තුරු හැමදෙනාම ලබන ජනවාරි පළවෙනිදා උදේ එන්ඩ ඕන.”

අපිට හේතුව කිව්වේ නෑ. අපි එකඟ වුණා. කොහමටත් ජනවාරි පළවෙනිදා උදේ ආරණ්‍යට එන්න ලැබෙන එක කොච්චර දෙයක්ද. අපි එදා රැස් වුණා. එදා දානෙ තිබුනෙත් චූටි මහත්මයාගේ ගෙදරින්. උදේ දානෙ කටයුතු අවසන් වෙලා මිදුලට අපි එකතු වුණා. ස්වාමින්වහන්සේ මොකක්දෝ කොලයක් රෝල් කරගෙන එතනට වැඩියා මංජු, නිමල්, අසල්වැසි ළමයි කිහිප දෙනාත් එක්ව සිටියා ස්වාමින්වහන්සේ එකවරම කිවුවා.

“මහත්මයා දැන් අපි කරන්න යන්නේ අද අලුතෙන් පටන් ගන්න අවුරුද්දේ මුල්ම දවසේ අලුත් වැඩක් කරන්න. අපි

දැන් සෙත් පිරිත් සජ්ඣායනා කරනව. දාන ශාලාවක් හදන්න මූලික පස් පිදිල්ල කැපීමත් මුල් ගල් තැබීමත් ඔබට බාරයි.''

ඇත්තටම අපි පුදුම වුණා. වැඩේනම් අවශ්‍ය තමයි. නමුත් මේ වෙනකොට තඹ සතයක ආධාරයක් නැතුව කොහොමද කරන්නේ? ස්වාමින්වහන්සේ අපව වෙහෙසවනවාද? නෑ. නෑ. එහෙම වෙන්න බෑ. මේ ස්වාමින්වහන්සේ අපට බර පටවල නෑ. අපේ කැමැත්තෙන් කළ යමක් මිසක්. අපට වැඩ කියලත් නෑ. මොනවා හරි ක්‍රමයක් ඇති මේක කරන්න. අපි එදා වැඩ ආරම්භ කළා. දවසෙන් දෙකෙන් පරණ ශාලාවේ සුන්බුන් අයින් වී බිම සකස් වුණා. බලාසිටියදී ශාලාව ගොඩ නැගෙනවා, ටික දිනකට පසු අපි සෙනසුනට එන විට සුදු වතින් සැරසුණු පිරිසක් සෙනසුනේ සිටනු දුරදීම අපි දුටුවා. අපි හිතුවෙ සිල් පිරිසක්වක්දෝ කියලා. නමුත් ළඟට එනවිට අපේ අදහස වැරදි බව තේරුම් ගියේ ඒ සුදු වතින් සැරසී ඇති පිරිස විදේශිකයන් පිරිසක් නිසා. ඒ පෙබරවාරි මාසයයි. ගස් වල තඹ වන් වූ කොළ හා ඒ හැමතැනම විසිරිලා වැලි පොළව නොපෙනෙන තරම්. ඒ පැමිණ සිටි පිරිස කොළ අතුගාමින් කුණු අස් කරමින් පිරිසිදු කරනවා. තවත් පිරිසක් මුළුතැන්ගෙයි භාණ්ඩයක් භාණ්ඩයක් පාසා පිරිසිදු කරනවා. ඇත්තටම අපිටත් නැති වුවමනාවක් ක්‍රියාශීලී බවක් ඒ අයට තියෙන්නෙ. ඒක දැකල අපි සතුටු වුණා අපි හිමින් හිමින් ස්වාමින්වහන්සේ ළඟට ළං වුණා.

''අවසර ස්වාමින්වහන්ස මේ දායක පිරිසක් ඇවිල්ල ඉන්නේ?''

''ඔව් මහත්තයෝ මේ අපේ අම්ම, නංගි, එයාගේ දරුවෝ, නෑයෝ.''

ස්වාමින්වහන්සේ හිනාවෙවී කිවුවා.

''මැලේසියාවේ අපේ භාවනා මධ්‍යස්ථානයේ දායකයෝනේ මම වැඩියේ නැති නිසා බලන්න ඇවිත්. මේ අය තමයි මේ දාන ශාලාවට බර පැන යොදන්නේ ඉතිං දැකල සතුටු වෙන්න ඇවිල්ලා.''









"අවසර! මේ අය ඉන්නෙ කොහෙද? ස්වාමින් වහන්සේලටවත් වැඩ හිටින්න ඉඩකඩ නැනේ"

"ඔව්. මොනව කරන්නද? ලද හැටියට පුද කියල කියමනක් තියෙනවනේ. ඉඩනම් නෑ තමයි. එන්න ඉස්සෙල්ල මගෙන් ඇහුවම මම කිවුවා මෙහෙ ඉඩ නෑ කියල. ඒ වුණාට මේ අය ඔය කන්ද උඩ බෝ මළුවේ චෛත්‍ය මළුවේ කුඩාරම් ගහගෙන රෑට ඉන්නවා. දවල්ට මෙහෙ වැඩ කරනව."

"එහෙම ඉන්න පුලුවන්ද අවසර, කුඩාරම් වල පින්නේ සීතලේ?"

"පුළුවන් නිසානේ ඉන්නෙ නේද. ඇත්තටම මේ අය ඒ රටේදි නම් පොළවේ දූවිලි පිඩක් පාගන අය නෙමෙයි. වාහනෙන් ගිහිං බහින්නේ ගේ ඇතුලටම, සාප්පුවකට ගියාම බඩු ගන්න වාහනය නවත්තල යන්නේ ගොඩනැගිල්ලේ ඇතුලේමයි, හරියට අර ලංකාවේ හිල්ටන් ගොඩනැගිල්ලේ වගේ. ඒ වුණාට මෙහෙත් කිසි ගානක් නෑ. ඔය යසට ඉන්නෙ වෙනසක් නිසා කැමතිත් ඇති. මම ඇහුවා කොහොමද රස්නේද මෙහෙ කියල. එකත් ගානක් නැතිලු. එහෙදිනම් ඒ.සී. (වායු සමීකරණ) නැතුව බෑ. මෙහෙදී ගානක් නෑ. මේකට හේතුව මහත්මයා මේ අය බොහොම ශ්‍රද්ධාවන්තයි. ඒ ශ්‍රද්ධාව නිසාම ඉවසීමත් පුරුදු වෙලා. නමුත් පිටට ගියාම නම් වෙනස්. "දේසේ හැටියට වාසේ." හිනාවෙවී කිවුවා.

"ඇයි අවසර එහෙම කිවුවේ?"

"මම ඔය නුවර, අනුරාධපුර වන්දනා ගමනක ගියා. මේ අය සමඟ බෞද්ධ සිද්ධස්ථාන වලට පමණයි මේ අය යන්න කැමති වුනේ. හෝටලයකට එක්ක ගියාම සැපම තමයි සෙවුවේ. නවාතැන් කාමරයක පොඩි අඩුවක්වත් තියෙන්න බෑ. ඔක්කොම කතාකරගන්නකන් ඉඳලා අපි ගියා බස් එකෙන්ම දුටුගැමුණු විශ්‍රාම ශාලාවේ භික්ෂුන් සඳහා ඇති කාමරයකට මම වැඩියා." අපේ ස්වාමින්වහන්සේ කිවුවා.

අපි නැවත සෙනසුනට එන දිනයේදී ඒ අය සිටියේ නෑ.

"අවසර! නෑදැයෝ අපහු ගියාද?"

"ඔව් මහත්තයා ඇත්තටම මම කියන්නේ අම්ම කියලා. (මෙත්තා මාතා) මම දැන් රට යන්න පටන් අරං අවුරුදු ගණනක් වෙනවා. එදා ඉඳලම අද වෙනකල් මට අවශ්‍ය සියළුම දේ සපයන්නේ ඔය පවුලේ අය තමයි හැම වියදමක්ම. ඇත්තටම ඒ අය හිතාගෙන ඉන්නෙ මම පෙර ජාතියේ පුතෙක් වෙන්න ඇති කියලා. ඒ පවුලේ සාමාජිකයෙක් කියල. පුදුම ලැදියාවක් තියෙන්නෙ."

"අවසර! ඇත්තටම ඒ අයනම් බොහොම ආදර්ශමත්"

එහෙම කිව්වේ ළඟ සිටිය දොස්තර නෝනා **වෛද්‍යාචාරිනී සුමනා විමලරත්න** මහත්මිය.

"ඉතිං අවසර ආයේ ඒ ගොල්ලෝ එයිද?"

"ඔව් මේ ගොඩනැගිල්ල හදල ඉවරවෙන්න කලින් එනව කිවුවා."



ඉදිකිරීම් අඛණ්ඩව සිද්ද වුණා. දැන් ගෙවී යන්නේ සිංහල අවුරුදු කාලය 2013 වස් පින්කමට මෙය පූජා කරන්නත් ඕන. ඒ නිසාම ලහි ලහියේ වැඩ සිදු වුණා.

පුංචි කමිටුවේ උදෙ‍යා්ගයත් ස්වාමින්වහන්සේගේ ආශිර්වාදයත් නිසා 2013 වස් පිංකම සමග එය පූජා කරගන්නට අපට අවස්ථාව ලැබුනා. එවරත් අති පූජනීය නාඋයනේ මාහිමියන් වහන්සේ අපට අනුකම්පාවෙන් පිංකමට වැඩම කිරීම අප සැමට මහා සතුටක් වුණා.

## දාන ශාලා පූජාවේ ආනිසංස

බිම්සර මහනිරිඳුන් පවා මවිතයට පත්කරන්නට තරම් සැපවින්දා වූ තරුණයකු සිටියා යැයි පැවසුවහොත් ඔබද පුදුමවනු නිසැකයි. එපමණක් නොව ඇතැම්විට එය නොපිළිගනුද ඇත.

දිනක් යහළුවන් සමග ගංගාවේ දියකෙළිමින් සිටින තරුණයෙක්ගේ ඇසට පෙර නුදුටු දසුනක් හසුවුණා. "ඒයි මිතුරනි අර බලන්න. අර අර කවුදෝ මුනිවරයෙක් ලී දඬුගොඩක් අරගෙන කැලයේ සිට ගං ඉවුර දෙසට වඩිනව. අපි බලමු මොකද කරන්නෙ කියල". යහළුවන් සමග මුනිතුමන් ළඟට ගිය තරුණයා, "ස්වාමීනි! මේ කුමක් කරන්නේද? අපෙන් යම් සේවයක් අවශ්‍යවේද?" විමසුවා. එවිට එම මුනිතුමන්, "දරුව මම මේ ළඟ එන වස්කාලය ගතකරන්නට සෙවණක් සදමි. පැවිද්දන් වන අප වස්සමයේ වසාතැබීමට හැකි කුටියක වැඩසිටීම පෙර සිට එන මුනිවර සිරිතයි" පැවසීය. එවිට මෙම තරුණ පිරිසේ නායකයා, "ස්වාමීන්! එසේනම් අප එය කරන්නම්. අවසර දෙනු මැනවි" ආයාචනා කළා. එසේම ඒ පිං කැමති තරුණයා පවසන්නේ "ස්වාමීනි! අපට හිතසුව පිණිස අනුකම්පාවෙන් හෙට දින අප නිවසේ දානය පිළිගන්නා සේක්වා!"

බුද්ධිමත් නිසා මොවුන්හට යම් සංග්‍රහයක් කිරීම මුනිවර සිරිතයි. නමුත් ඒ කවර සංග්‍රහයක්ද? මුනිවරයන් විසින් තිලොවගසැප ලබාදෙනු විනා අන් කවර සංග්‍රහයක් කරන්නද? දිට්ඨධම්ම, සාම්පරායික සහ නිර්වාණ සුවය යන තිසැපත

දෙන්නට උපනිඃශ්‍රය වන පිනට උපකාරවනු වස් නිහඬව ආරාධනාව ඉවසූ සේක.

ඉන් සතුටට පත් තරුණ පිරිස තම නිවෙස් වලට ගොස් මේ අපූරු සිදුවීම දෙමව්පිය වැඩිහිටියනට දන්වා පසු දින දානය සකස් කළේය. එහිමිසද ඉඳුබලයෙන් නිසිකල්හි නිවස ඉදිරියේ පෙනී සිටි සේක. එදින සියලු දෙන එක්ව ඉමහත් සතුටින් හා නුවණින් දානය පිළිගැන්වූහ.

එකී කටයුතු අවසනැ මුනිවරයාණන්ගෙන් විමසා දැන සුදුසු තන්හිම නිසිලෙසටම මනරම්වූ කුටියක් ඉදි කළේය. එම කුටියට පරිවාර අංග ලෙස නුවණින් සලකාබලා සක්මන්මලු, දිවා විහරන ස්ථාන, පැන් පොකුණු, වැසිකිළි කැසිකිළි ඈ සියල්ල නොඅඩුව සකස් කළෝය. කුටියට පිවිසෙන දොරටුව අසල "මඩ දූහුවිලි පමණක් නොව වැලිකැටයක්වත් මේ උතුමන්ගේ දෙපාවල නොතැවරේවා! මෙපින් බලෙන් උපන් උපන් ජීවිතයක් පාසා මාගේ අතුල් පතුල් කපු පුළුන් පිඩක් සේ සුමුදුව මනරම් රත්පැහැයෙන් යුතුවේවා!" යැයි සිතා සියක් දහසක් වටිනා රත්ත කම්බලයක් පාපිස්සක් සේ ඇතිරීය. ඒ මත පා තබා වඩින මුනිවරයානන්ගේ රශ්මියත් රත්ත කම්බලයේ රශ්මියත් එක්ව සිත්සතන් පස්වනක් ප්‍රීතියෙන් බබුලුවන අපූරු දසුනක් විය. මුලු වස්සමය පුරාවට සිවුපසයෙන් උපස්ථාන කර අවසන සියලුදෙන එක්ව කඨින චීවර පූජාවක්ද කළහ. ඉන්පසු ඒ මුනිවරයානෝ අදිටන්කොට සියලු දෙන බලා සිටියදීම අහසින් ගන්ධමාදන පර්වතයට වැඩිසේක. එය දුටු සියල්ලෝම "අප සැම මහත් පිනක් කළේය"යැයි සතුටට පත්විය. මේ මුනිවරයානො අන්කිසිවකු නොව එකල වැඩසිටි පසේ බුදුරජාණන් වහන්සේය.

ඉන්පසු ඒ තරුණයා දිවිය පුරා එම සතුටින් ගතකර ඉන්පසු දෙව්මිනිස් සුගති සැප ලබා අප ගෞතම සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ සමයේ කාලචම්පා නුවර උපසිටු මැදුරේ උපත ලැබීය. එතැන් පටන් සිටු නිවසද මහත් සේ සශ්‍රීක විය. මෙලොවට බිහිවූ දරුවාට නම් තබන දිනයේ දෙමාපියන් සිතනුයේ මේ දරුවා අන් අය මෙන් නොව උපදින මොහොතේම තමාට හිමි නමද රැගෙන පැමිණියේය. සිරුර පුරා දඹරන් ආලේප

කළා වැනිය. අසමවූ පැහැ ඇති මේ දරුවාට "සෝණ" යන නම වටනේයැයි සිතා "සෝණ"යැයි නම් තැබීය.

දිව්‍යකුමාරයකු ලබන සැපයට බඳු සැපයක් ලබමින් සිටුමැදුරේ වාසය කරන්නට දෙමව්පියො කටයුතු සම්පාදනය කලෝය.

මෙම පිංවත් දරුවාට ආහාර දෙනු පිණිස කෙසේ කටයුතු කලේද යන්න මෙහි දැක්වන්නේ ඉතිරිය ඔබට සිතාගනු පහසුව පිණිසයි. අක්කර හැටක පමණ භූමි ප්‍රදේශයක් සකසා තුන් වර්ගයක දියෙන් එය පෝෂණයකරයි. ගොඩැලි සහිත තැනෙක් වෙත්නම් එය දියෙන් කිරෙන් සහ සුවදින් පෙඟවූ කළල් මඩයොදා සාරවත් කරයි.

සරුවට වැඩෙන ගොයම කිරිවදනා කල මුලු කුඹුර වටා කණු සිටුවා පන්පැදුරුවලින් උඩින් වටින් ආවරණයකරයි. එසේ කරනුයේ ගිරව් ආදී සතුන්ගෙන් ආරක්ෂාකිරීමටත් වී ඇට මෘදුවීමටත්ය.

අස්වනු නෙලන කල අටුකොටුවල උඩින්යටින් සුවඳ අතුරා සූදානම් කරයි. දහස් ගණණ් සේවකයෝ ගොස් අස්වනු නෙලා සුවඳ කොටුවේ තැන්පත් කරයි.

ඒවා ආහාර පිණිස සකසන කල්හි සහල්කර සුවඳපැනින් දොවා සුවඳ බත් සකසා සුවඳ හමන කුටියක තබන්නේය. ආහාර අනුභවකර සුවඳ පැනින් අතකට සෝදා රජකුමරකු සේ වාසය කරන්නේය. අත්පා සිනිඳු මුදු රත් නෙළුම්පත් බඳුය. කිසිදිනක රළු බිමක තබා සුමට බිමකවත් පා ස්පර්ශකර නැත. එනිසාම අතුල් පතුල්වල මණිකුණ්ඩලබඳු රෝමකූපයන්ගෙන් වැසී තිබුණි. මේ කවර අසිරියක්ද? එදා යහළුවන් සමග ඉමහත් සතුටින් හා නුවණින් පසේබුදුරජාණන් වහන්සේට කුටියක් සාදා පූජාකර එයින් නොනැවතී උපස්ථාන කිරීමේ පුණ්‍ය විපාක ශක්තියයි. *(අංගු. නි. ඒකක නි. ඇසුරිනි)*

කුටිසෙනසුන් දාන උපස්ථාන ශාලා පුජාකිරීමේ ආනිශංස සහිත මෙවන් අපමණ කතා පුවත් පෙළ අටුවා

ග්‍රන්ථවල දක්නට ඇත. මෙහි කුටිපුදකර දන්දී පින්කර සසර පැතුමන් වලට වඩා නිවන් ප්‍රාර්ථනය වටිනා බව සිහිතබා ගතයුතු. එකල සම්මා සම්බුදුරජාණන් වහන්සේ පහළ නොවීමත් මග කියාදෙන කලණ මිතු ඇසුර නොලැබීමත් කතාවේ සදහන් තරුණයාගේ ප්‍රාර්ථනාවට හේතුවයි.

අද බොහෝදෙනා සුළු පිංකමක් කළද පිනට වඩා නම ලොවට ප්‍රකාශ කිරීමත් ප්‍රසිද්ධිය පිණිස පිංකිරීමත් නිසිසේ නුවණ නොයෙදීමත් ආදී කරුණු නිසා පිං කළද යහපත් උසස් ඵල ලැබීමට බාධාවන් තමාම සකසාගනී. වත්මන ඇතැම් මිනිසුන් කොතරම් නුවණින් තොරද යනු ඇතැම්විට කුටිසෙනසුන් සාදන්නට කැමතිව පැමිණ නාම පුවරු ගැසීම අත්‍යාවශ්‍ය නොවේයැයි පැවසූවිට තම පරිත්‍යාග සිතද වෙනස්කර ආපසු යන අය අපට හමුවී ඇත. එපමණකින් නොනැවතී නාම පුවරුවක්වත් තබන්නට නොදෙන්නේයැයි තැනතැන දොස් නගමින් පව් පුරවාගන්නොද නැතුවා නොවේ.

## පිංකෙත මේ නාවිමනයි

**තුරු වදුලයි දම් අරණයි - පිංකෙත මේ නාවිමනයි.**
**ඒ විමනෙ සිට ගෙනෙනා - අපේ පැතුම බුදු සරණයි.**
**සැමටම සම් බුදු සරණයි - සැමදා සදහම් සරණයි.**
**සැමටම මහ සඟ සරණයි - ලොවටම තෙරුවන් සරණයි.**
**වටකළ නිල් කඳුසිඛරයි - පාමුල කෙත්යාය සරුයි**
**නිල් අහසයි වලාකුළුයි - සැම තැන බුදු අසිරි මවයි.**
**කඳුයායෙන් කෙත් යායෙන් - වන වදුලෙන් තුරු සෙවණෙන්**
**සිරි සිරි බෝපත් හඬදී - එන මදනල හරි සිසිලයි.**
**සිරි බෝ සමිඳුන් සෙවනේ - සිරි දළඳා රැස් දිලූනේ**
**ඒ රැස් දහරා අතරින් - සිරි සදහම් හඬ ඇසුනේ.**
**ඕලු නෙළුම් නිල් මානෙල් - පාටපාට මල් කැකුළු**
**හිරු කුමරුට හිනා වෙවී - කරනව වාගේ මුකුළු**
**ගිරා මලිති බටිති රැන් - නාදය පැතිරෙයි මියුරු**
**නිවිනා ගිනිගත් සිත දැක - බුදු හිමි සිටිනා අයුරු.**

# 2012 කඨින පිංකම - සංඝ පිරිස පුළුල් කිරීම

එදා සිල් සමාදන් වෙලා සිටි පෝය දවසක් ධර්ම සාකච්ඡාව ඉවර කරලා ලොකු ස්වාමීන් වහන්සේ කුටියට වඩින්නට ඉහල විහාරය දෙසට ගමන් කළා. ඒ වෙලාවේ මම සිටියේ ඉහල විහාරය ළඟ. මට එකවරම පුංචි ප්‍රශ්නයක් හිතට ආවා. ඒ නිසා මම ස්වාමීන්වහන්සේට කතා කළා.

“අවසර ස්වාමීන්වහන්ස, ටිකක් වැඩ සිටියනම්” උන්වහන්සේ නතර වුණා.

“ඇයි මහත්තයා ප්‍රශ්නයක්ද?”

“එහෙමයි, දහම් ප්‍රශ්නයක් නම් නෙමෙයි නමුත් අධර්මයකුත් නොවෙයි.”

“හොඳයි අහමුකෝ බලන්න.”

“අවසර! දැන් අවුරුදු දෙකක් ගෙවුණා. තාම ඔය ස්වාමීන්වහන්සේ දෙනම විතරයි තාවකාලිකව ඉඳහිට පිටින් වඩින ස්වාමීන්වහන්සේලා සිටිනවා නමුත් ටික දවසින් ආයේ යනවා. ස්ථිර බවක් නෑ. අයේ අලුත් මුහුණක් පෙනෙනවා ටික දවසකින් එකත් නෑ.”

“ඔහොම තමයි මහත්මයා. මේ මම පෙන්නේ නැද්ද. මේ මාසේ මේ සෙනසුනේ ඊළඟ මාසේ ලංකාවෙත් නෑ. ආයේ මාස තුනකින් එනවා මාසයක් වැඩ සිටිනවා අපහු නෑ. ඔහොම තමයි හැමදේම මොනවද මහත්මය මේ ලෝකේ ස්ථිර? අපිට පෙනන ටිකනේ ඔය. නොපෙනුනාට හැම මොහොතේම ඔය ටික වෙනවා මේ ඇති වෙනවා. මොහොතින් නැතිවෙනවා.”

ස්වාමීන්වහන්සේ ඒ සරල දේ මහා ගැඹුරකට අරගෙන ගියා. එදා එතනින් කතාව නතර කළත් මගේ ප්‍රශ්නය නම් ඉදිරිපත් කරන්නට බැරි වුණා. කමක් නෑ වෙන වෙලාවක ඔකටම එන්න ඕන. හරි මගේ වාර්ෂික දානෙ දවස ලඟයි. එදාට පුළුවන් කතා කරන්න.

දවස් ගෙවී ගියා වාර්ෂික දානෙ දවස ආවා. එදා පිංකමේ කටයුතු කරන අතරේ මම ස්වාමින්වහන්සේ හමුවී එදා කියාගන්නට බැරිවූ අදහස ඉදිරිපත් කළා.

"අවසර ස්වාමින් වහන්ස එදා මම විහාරේ ලඟදී කියන්න ගිය දේ සම්පූර්ණ කරන්න වුණේ නෑ."

"ඒ මොකක්ද මහත්තයා ඉතිං දැන් කියන්න."

"මට කියන්න ඕන කලේ ස්වාමින්වහන්ස මේ සෙනසුනෙන්ම පුහුණු වෙලා පැවිදි වෙන ස්වාමින්වහන්සේලා හිටියොත් හොඳයි නේද කියලා. ආගන්තුක අය ආවට ස්ථිර නැනෙ. මේ එනව මේ යනවා."

**"එකනම් ඇත්ත මහත්තය. නමුත් මේ ස්ථානය බාර දෙනකොටම මම කිව්වේ. මෙතන මම දියුණුකරන්නම් සංඝයා වහන්සේලා නම් මට නෑ. අපේ ගුරු උතුමන් වහන්සේ වන නාඋයනේ මහා ස්වාමින්ද්‍රයන් වහන්සේ කිවුවා එකට කමක් නෑ අපේ ස්ථානෙන් අවුරුද්දකට ගොඩක් අය පැවිදි වෙනවා. වාර කීපයකදීම ඒ අයට භාවනා පුහුණු වෙලා විවේකීව ඉන්න වෙනත් තැනක් ඕන වුනොත් වැඩ සිටින්නට පහසුකම් සලසුවම ඇති කියලා. ඒ පොරොන්දුව නිසා තමයි මම මෙහෙට වැඩියේ මේක බාර ගත්තේ ගෝලයන් හදන්න තරම් මම සූදානමක් නෑ. එක තැනක නැනේ. රටින් රට ඉඳගෙන පුලුවන්ද මහත්තයා ඕව කරන්න."**

"එත් අවසර සමාවෙලා මං කියූ අදහස ගැන හිතල බලන්න හොඳයි නේද?"

මම එහෙම කියල ටික දවසකින් තරුණයෙක් ආව බව ස්වාමින්වහන්සේ කිවුවා. ඒ පිලිබඳ විස්තර මා මෙලෙස කියන්නම්. ටික දිනක් යන විට සෙනසුනට තරුණ මහත්මයෙක් ආවලු. වන්දනා කළ ඔහු,

"ස්වාමින්වහන්ස මම මෙහි ටික දවසක් නවතින්නද?"

“මේ මහත්මයා කොයි ඉඳලද?”


“මම ගල්ගමුවේ.”

“මෙහෙ ගැන දන්නේ කොහොමද?”

“අපේ ගමේ තියෙනවා නාගපබ්බතය කියලා ආරණ්‍යක්. එහේ ස්වාමින්වහන්සේ තමයි මාව මෙහෙට යොමු කලේ.”

ස්වාමින්වහන්සේට අනන්‍යතාවය කියූ නිසාත් නාගපබ්බතේ වැඩ සිටියේ තමන් වහන්සේ හොඳින් දන්නා ස්වාමින්වහන්සේ නමක් නිසාත් ඒම තරුණයා නවත්වා ගත්තා. ඔහු නමින් **නිශාන්ත** හොඳින් ඉගෙන ගෙන විශ්වවිද්‍යාල අධ්‍යාපනයෙන් පසු සිංගප්පූරුවේ රැකියාවකද යෙදී, ඒ සියල්ල බොරු මායාවක් බව දැන විවේකය සොයා පැමිණි අයෙක්. අවුරුදු දෙකක් පුරා සෙනසුනේ සියළු කටයුතු වලට උපකාර වුණා. හොඳින් ගත කළා. ගුණවත් කම, අවංක කම, ශ්‍රද්ධාව, වීර්ය, දක්ෂකම සියල්ල හොඳින් තිබුණා. ඒ නිසාම වසර දෙකකට පසු පැවිදි කරන්නට තීරණය කළා. මීතිරිගල ධර්මායතනයේ අති පූජනීය නාඋයනේ මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ විසින් පැවිදි කරනු ලැබුවා.

නිතර ධර්මප්‍රචාර කටයුතු සඳහා පිටරට වඩින අපේ ස්වාමින්වහන්සේ මෙහි වැඩ සිටින මාස කිහිපයේදී පාලි භාෂාව, අභිධර්මය සහ භාවනා කටයුතු කියාදුන්නා. වත් පිළිවෙත්ද කලට වෙලාවට නිසි කල පුරුදු කළා. රට වඩින සෑම විටම නාඋයන අරණ්‍යවාසී පූජනීය **නිකපිටියේ ගුණරතන** ස්වාමින්වහන්සේ, පූජනීය **බද්දේගම වජිරනන්ද** ස්වාමින්වහන්සේ, පූජනීය **ගල්ගමුවේ සුමන** ස්වාමින්වහන්සේ වැනි උගත් සිල්වත් ස්වාමින්වහන්සේලා අප සෙනසුනෙහි වඩා හිඳුවා නවක ස්වාමින්වහන්සේගේ ධර්ම විනය දැනුම පුළුල් කළා. මේ හැමදෙයක්ම කළත් සියල්ල වෙනස් වන බව පවසන අපේ ස්වාමින්වහන්සේ සෙනසුනටවත්, ගෝලයින්ටවත්, දායකයින්ටවත් කිසි විශේෂ බැඳීමක්නම් තිබුනෙ නෑ. සැමවිටම මධ්‍යස්ථ සිතින් වැඩ වාසය කළා.



*අඳුර නසා පායන සඳ හරි ප්‍රියංකරයි- සඳේ එලිය සැම මිදුලෙම එකම එක වගෙයි.*
*සුදෝ සුදට නිල් අහසට හරිම ලස්සනයි - සඳවටකර ඇති තරු කැට සැවොම ඒ වගෙයි.*

## කැපකරු මාරුව

කැපකරු මාරුව තමයි ලොකුම අමාරුව. එකත් මහා පුදුම කතාවක්.

***"නවණ්ණ රූපෙන නරෝ සුජානෝ***
***න විත්තතේ ඉත්තර දස්සනෙන***
***සුසඤ්ඤ තානඤ්හි වියඤ්ජනෙන***
***අසඤ්ඤතා ලෝක මිමන් චරන්තී***
***පතිරූප කො මත්තිකා කුණ්ඩලොව***
***ලෝහඩ්ඩ මා සොව සුවණ්ණ ජන්නෝ***
***චරන්ති ලෝකේ පරිවාර ඡන්නා***
***අන්තෝ අසුද්ධා බහි සෝබමානා."***

*(කෝසල සංයුක්තයෙන්)*

දවසක් ස්වාමින්වහන්සේ අහනවා "මහත්මයා අහල තියෙනවද මේ ගාථාව, *නවණ්ණ රූපෙන නරෝ සුජානෝ.*"

"නැහැ අපේ ස්වාමින්වහන්ස."

"මේක දිග කතාවක් මහත්තය."

"කමක් නෑ අපේ ස්වාමින්වහන්ස අහන්න කැමතියි."

"මේකෙන් කියන්නේ මනුස්සයෝ ලේසියෙන් අඳුනගන්න බෑ කියන එක."

"එදා බුදුරජාණන්වහන්සේ වැඩ සිටියේ විශාකා උපාසිකාව පූජා කළ පූර්වාරාමයේ. කොසොල් රජතුමා යනවලුනේ හැමදාම වන්දනා කරන්න. එහෙම ගිහිං බුදුරජාණන්වහන්සේත් එක්ක කතා කර කර ඉන්නවා. දවසක් එහෙම ඉන්නකොට පූජකවරු පේලියක් මහා පිරිසක් බිම බලාගෙන පූර්වාරාමේ ඉදිරිපස පාරේ යනවා. පෙනෙන හැටියට විවිධ ආගම් දර්ශන වලට අයත් පිරිසක්. ජටිලයෝ හතයි ඒ අයගේ කෙස් වැවිලා නියපොතු වැවිලා, ඊළඟට නිගණ්ඨයෝ හතයි ඇගේ නූල් පොටක් නෑ නිර්වස්ත්‍රයි, අචේලකයෝ හතයි, ඒකසාටකයෝ හතයි, පරිබ්බාජකයෝ හතයි එක පෙළට ගමන් කරනවා. මේක දැකපු හැටියේම බුදුරජාණන්වහන්සේ සමග කතා කරමින් සිටි කොසොල් රජතුමා දණ බිම ඇනගෙන අත් එකට තියාගෙන වැඳගෙන කියනව "වහන්ස මම කොසොල් රජතුමා" ඒ අය එතනින් පාස් වුන හැටියේ නැවත බුදුරජාණන්වහන්සේ දෙසට හැරිලා වන්දනා කරලා අහනවා මේ ලෝකේ රහත් හෝ ඒ මගට පිළිපන් අය සිටිත්නම් ඒ පිරිස ඒ ගිය අයයි කියලා. ඒ කතාවට බුදුරජාණන්වහන්සේ එකඟ වුණේ නෑ. කෙලින්ම ඇහුවා "ඔබ කොහොමද එක කියන්නේ? රජතුමනි, ගිහි කම්සැප විදිමින් දරුමල්ලන් හදමින්, හැඩ වැඩ විලාසිතා දරන මල් සුවඳ විලවුන් භාවිත කරන, කොටින්ම කියනවනම් කාමභෝගිව සිටින ඔබ කොහොමද රහත් අය අඳුනන්නේ ඒ අය අඳුනන්න ලේසි නෑ. "එහෙනම් කොහොමද හඳුනාගන්නේ? කාටද පුළුවන් හඳුනා ගන්න කෙනෙක්ව ස්වාමීනි. "

***සංවාසෙන බෝ මහාරාජ සීලං වේදී තබ්බනං***
සිල්වතා හඳුනාගන්නේ ඇසුරු කිරීමෙන්
***තඤ්ච බො දීසෙන අද්ධුනා න ඉත්තරනං***
එහෙම පුළුවන් වන්නේ බොහෝ කලක් ඇසුරෙන් පමණයි.
***මනසි කරෝතා***
හොඳ සිහියෙන් ඉඳලයි
***පඤ්ඤවතා*** "නැණවතාට පමණයි තේරෙන්නේ ඒ වගේම සුවච බව පවිත්‍ර බව දැනගන්න කතාකරන්නම ඕන. ඒත් දිගු කලක් විමසිලිමත්ව නුවණින් තමයි කරන්න ඕන."

"ඥාන ශක්තිය දැනගන්න පුළුවන් විපතකට මුහුණ දෙන විදියෙන්, නුවණ දැනගන්නනම් සාකච්ඡාව තුලින්මයි. මේ කිසීම දෙයක් කෙටි කලකින් බැහැ දිගු කලක් සිහියෙන් නුවණින් කරන්න ඕන. එහෙම නැතුව කොහොමද කෙනෙක් අඳුරන්නේ?" බුදුරජාණන්වහන්සේගේ මේ දේශනාව රජතුමා පිළිගත්තා. පිළිගෙන කිවුවා. "භාග්‍යවතුන් වහන්ස ඇත්තටම ඒ පිදිය යුතු අය නෙවෙයි. වෙස්වළාගත්ත මගේ චර පුරුෂයෝ පිරිසක් දැන් ගිහිල්ලා ඔය වෙස් මාරු කරනවා. සාමාන්‍ය මිනිසෙකු විදියට කම්සැප විදිනවා" රජතුමා එසේ කී විට බුදුරජාණන් වහන්සේ මෙහි මුලින් දැක්වූ ගාථා දෙක දේශනා කරා. තේරුම රූපෙන් මිනිසෙක් හරියටම අඳුරන්න බෑ. පොඩ්ඩක් දැකලා මිනිහෙක් විස්වාස කරන්න එපා. කිසීම සංවර කමක් නැති මිනිස්සු මහා සංවර විලාශයෙන් මේ ලෝකේ හැසිරෙනවා. පිටත සෝභමාන වුණාට ඇතුළ හරිම අපිරිසිදුයි. පිටත රනෙන් ආලේප කළ නමුත් මැණික් වලින් හැදූ නමුත් ඇතුලත බාල යකඩ දමා රැවටු දෙයක් වගේ.

දිග බණක් අද කිවුවා, ලොකු විස්තරයක් ඇයි මෙහෙම කියන්න හේතුව, මට ප්‍රශ්නයක් කුමක් හෝ සැඟවිලා තියෙනවා. ඒ නිසා මම විමසුවා.

"ස්වාමින්වහන්ස මේ කතාව කිව්වේ මොනව හරි ගැටලුවක්ද?"

"ඔව් මහත්තයා. ගැටළුවක් නැතුවමත් නොවෙයි නමුත්......"

ස්වාමින්වහන්සේ කියන්න හැදූ යමක් ගිලගත්තා. මම අයෙත් විමසා බැලුවා. එවිට උන්වහන්සේ කීවේ,

"මහත්තයා. මං මේ බැලුවෙ අපි මේ වඩින්න පෙර ඉඳලනේ මේ පාලක ලේකම් තුමා ඉන්නෙ. තනිවම හතරපස් දෙනෙක්ගේ වැඩ කරනවා ඕන්න බලන්න කරන වැඩ. ගොඩක් දවසට දායකයෝ එන්නේ නෑ. මං හිතන්නේ මාසෙකට හතර පස් වතාවක් විතර තමයි දානේ දෙන්න දායකයෝ එන්නේ. අනිත් හැමදාම මෙහෙ උයනවා. දර හොයන්නෙත් ඔය මනුස්සයා, කඩේ යන්නෙත්, බඩු ගේන්නෙත්, උයන්නෙත්, පිරිසිදු කරන්නෙත් මේ මනුස්සයමයි කොච්චර වැඩද. බොහොම රසට සැරට උයනවා, දායකයෝ නාවට දායක මුදල් මනි ඕඩර් කරලා එවන බව තමයි භාණ්ඩාගාරිකතුමා කිව්වේ."

"උයනවට වෙනම ගානක් ගෙවනවලු, ඒ මොනව වුණත් අනේ අපිට කිසි අඩුවක් කරන්නේ නෑ. මට ප්‍රශ්නේ ඇයි මේ දායකයෝ එන්නේ නැත්තෙ කියන එක. අපි වළඳලා හිටියට දායකයින්ට දහම් බිදක්, ගුණදහමක් දීගන්න බැනේ එන්නේ නැතුව."

එහෙම කිවුවම තමයි මට මතක් වුනේ මෙතන කුමක් හෝ රහසක් තිබෙන බව. මට මතක් වුණා අපි ආ පළවෙනි දවසේ ඔය කැපකරු තුමා කතාකළ අපූරුව.

"ඉතිං අපි බලමුකෝ මොකද වෙන්නේ කියලා. හිටපු මිනිහ නිසා යවන්නත් බෑ. හොඳයි කමක් නෑ" කියා ස්වාමින්වහන්සේ නිහඬ වුණා.

මාස දෙකකට වරක් ධර්මක් ප්‍රචාරය සඳහා පිටරට වඩින අපේ ස්වාමින්වහන්සේට මෙවර පිටරට වඩින දිනේ ලංවෙලා තිබුණා. සියල්ල සූදානම් කර පිටත් වන්නට පෙර දිනේ සන්ධ්‍යා වන්දනාවෙන් පසු පුංචි කතාවක් වුණා.

"මම මේ කියන්නේ පාලක ලේකම් තුමා ගැන. මිනිහ වැඩ කළාට මෙතන මොකක් හරි ගැටළුවක් තියෙනවා. කාලයක් හිටපු නිසා යවන්නත් බෑ. මං කල්පනා කළා මිනිහා ඔය විදිහට

ඉන්න දීල තව කැපකරු කෙනෙක්ව ගන්න ඕන කියල. එහෙම වුණාම සිදුවෙන දේ හොයාගන්න පුළුවන්. අපි ඒ පැත්තට යන්නේ නෑ. දායකයෝ කතාකරන්නේ එතුමාටනේ.''

ඒ කතාවට අපි සැමත් එකඟ වුණා. ස්වාමින්වහන්සේ එහෙම කියලත් පසුදා සිංගප්පූරුවට වැඩියා භාවනා වැඩසටහනකට. ආපහු ආවේ මාසෙකට පස්සෙ. ආපු දවසෙම රාත්‍රියේ නොසිතූ යමක් සිදුවෙලා අපි කවුරුත් දන්නේ නෑ. උන්වහන්සේ කියනකන්. ස්වාමින්වහන්සේ ලංකාවට වැඩිය කියල ආරංචි වුණා. අපි පසුවදාම ආව සෙනසුනට. කොහොමත් අපි ඊට උඩදී දවසෙත් ඇවිත් ගියේ. ඇයි අනිත් ස්වාමින්වහන්සේ හමුවෙන්න, ලොකු ස්වාමින්වහන්සේ ඇතත් නැතත් අපේ සුපුරුදු ගමන අපි හැමදාම ආවා. අපි නාවත් චූටි මහත්මයා ඇවිත් යනවා.

අපි ස්වාමින්වහන්සේ බලන්න ආවම උන්වහන්සේ බොහොම සතුටින් අපිට පුංචි තෑග්ගක් දුන්නා. ඒ හිසට දාගන්න පුළුවන් ටෝච් එකක්. සතුටින් කතා කළා ගමනේ විස්තර, අපි කතා කළා සෙනසුනේ විස්තර අන්තිමේ ඒ සියල්ල දහම් කතාවන් වුණා. ස්වාමින්වහන්සේ සෙනසුනේ නැති කාලේ පොඩි පොඩි ප්‍රශ්ණ තිබුණා ඒ කැපකරුතුමගේ පැත්තේ අපි ඒවා කියන්න ගියේ නැහැ. නමුත් ස්වාමින්වහන්සේම ඒ ගැන කතා කළා.

“මහත්මයා, කොහොමද පහුගිය කාලේ?'' ස්වාමින්වහන්සේ විමසුවා.

“අපේ ස්වාමින්වහන්ස ඒ කිවුවේ සෙනසුන ගැනද?'' අපි ඇහුවා.

“ඔව් මහත්මයා, මට මේ පොඩි පොඩි දේවල් දැනගන්න ලැබෙනවා.''

ඒ ටික වෙලාවේ කවුද අප්පා මේවා කියන්න ඉන්නේ? ලංකාවට වැඩලා පැය කිහිපයයි ගත වුනේ. අපිට ලොකු ගැටළුවක් වුණා. දැන් ඉතිං හංගන්න පුළුවන්යැ. කොහොමටත්

ස්වාමින්වහන්සේලාට හංගන්න බෑ. මට මතක් වුණා පරණ සිද්ධියක්. ඒකත් මෙතනට අදාළ නැතත් ලස්සන කතාවක්. මේ හංගන්න බැරි එක ගැන.

දවසක් අතිපූජනීය මඩිහේ පඤ්ඤාසීහ මහා ස්වාමින්වහන්සේ ගමනක් වඩිනවා. ගමන දුර නිසා කාරෙකක වඩින්නේ. පැය කිහිපයකින් ස්වාමින්වහන්සේට කාර්එක තුලම නින්ද ගිහිං රියදුරුතුමා දැක්කා ස්වාමින්වහන්සේ ඇස් දෙක පියාගෙන කිසිම කතාවක් නැතුව වැඩ සිටින අයුරු . පාර පුරාම සුනඛයන් දුවනවා පනිනවා නිදාගන්නවා කොහොමටත් උන්ගේ සිරිත් ඔක්කොම කරන්නේ පාරෙනේ, ඒ කිව්වේ කන්නෙ බොන්නෙ, නිදාගන්නෙ, සමිති සමාගම්, පවුල් වැඩ, රණ්ඩු, මංගල උත්සව, රියදුරු තුමාට ගානක් වුණේ නෑ. ඔය නිදාගෙන සිටි සුනඛ ගොඩක් උඩින් රිය පදවාගෙන ගියා. එකවරම ස්වාමින්වහන්සේ ඇහුවා,

"මොකක්ද ළමයෝ ඒ සද්දේ?"

රියදුරුතුමාට කියන්න පුලුවන්ද සුනකයෝ හැප්පුනා, යට වුණා කියල. ස්ථානෝචිත පිළිතුරක් දුන්නා වැඩිය හිතන්නේ නැතුව.

"අපේ හාමුදුරුවනේ, පාරේ හැමතැනම මිනිස්සු පොල්ලෙලි දාලා."

ස්වාමින්වහන්සේ ආයිමත් ඇස් පියාගත්තා. රියදුරුතුමා සිතුවා ඇති යන්තම් බේරුනා දැකල නෑ වැඩේ. තව ටික දුරක් යන විට අයෙමත් බලු රැනක් පාරෙ යුද්ධ ප්‍රකාශ කරගන්නවා. එකවරම ස්වාමින්වහන්සේ මෙහෙම කිවුවා.

"ළමයෝ ඔන්න ඉස්සරහ පොල්ලෙලි වගයක්. ප්‍රවේසම් වෙන්න."

එක ඇහුවම තමයි රියදුරාට තේරුණේ මේ නිදාගන්නවා නෙවෙයි කියලා. ඇතිවූ ලැජ්ජාවට ආයෙනම් ඒ වගේ බොරු නොකියන්න හිතාගත්තලු.

ඔය කතාව මතක් වෙච්චි මං කොහොමද අපේ ස්වාමීන්වහන්සේට මේව හංගන්නේ, ඒ වුණත් නොදන්නා විදියට මම ඇහුවා.

"ඇයි අවසර, ඔබවහන්සේ එහෙම ඇහුවේ?"

අපේ ප්‍රශ්නයට උත්තර දීමට මැලි නොවූ ස්වාමීන්වහන්සේ මෙසේ කිවුවා.

"මහත්මයා දන්නවද මම ඇවිල්ල ටික වෙලාවකින් ඒ කියන්නේ මහා රෑ එකොළහ හමාරවත් වෙන්න ඇති කවුදෝ රළු හඬකින් කතා කරනවා.

"ලොකු හාමුදුරුවනේ..! ලොකු හාමුදුරුවනේ..!"

මම ටිකක් හඬ අහගෙන හිටියා. හුරුපුරුදු කතා විලාශයටනම් බීල ඉන්න මැදි වයසේ කෙනෙක්. මම එක වරම දොර ඇරිය.

සරම කැහැපට ගහගෙන කමිසයක්වත් නැති අවුරුදු 30ක් තරම් වූ මනුස්සයෙක් මම ඇහුවා "ඇයි මේ වෙලාවේ?"

ඒ මනුස්සය කිවුවා.

"මම ආවේ ලොකු හාමුදුරුවෝ හමුවෙන්න මේක දෙකින් එකක් කරගෙන යන්න."

"මට මුකුත් තේරෙන්නේ නෑ. මම දන්නෑ මොකද වුණේ. ඒ නිසා මම ඇහුවා. "

"ඔබට වැරදිලා මෙහෙ ඇවිත් තියෙන්නෙ. මේ ආරණ්‍යයේ ඔබ ඉන්නෙ."

නමුත් ඒ මිනිහට වැරදිලා තිබුනෙ නෑ. මිනිහ කියනවා.

“හරි මම දන්නව හාමුදුරුවනේ, මේක අපේ ගම අපේ ගමේ ඉඳගෙන පිටින් ආපු එවුන්ට සෙල්ලන් දාන්න දෙන්න බෑ.”

මම ඇහුවා “මොකක් ගැනද ඔය කියන්නේ?”

එවිට අර මිනිහ කිවුවා.“හරි හාමුදුරුවනේ මෙන්න මේකයි ස්ටෝරිය. අහගෙන ඉන්න. ඔය හාමුදුරුවන්ගේ කැපයා, ඒ කිච්චේ කැපකරුවා මාත් එක්ක වලියක් දාගත්තා. එහෙම කරල දැන් නඩුවකටත් පටන්ගෙන මාව හිරේ දාන්නලු හදන්නෙ. මම කියන්නේ මේකයි. වහාම ඔය කැපය එලවන්න ඕන.” මිනිහා සැරෙන් කිවුවා.

මම කිවුවා “ඔය කියන කිසිම දෙයක් මම දන්නේ නෑ. කැපකරුව හිටියත් නැත්ත මට ප්‍රශ්නයක් නෑ. මම ජීවත් වෙන්නේ දායකයෝ දෙන දෙයින්. කැපකරු තුමාගේ වගකීම තියෙන්නෙ කොමිටියේ මහත්තුරුන්ට. ඒ ගොල්ලෝ තමයි පඩි ගෙවන්නේ. ඒ හින්දා මට කියල වැඩක් නෑ. ඔය ගමේ ඉන්න චූටි මහත්තයට කියල බලන්න. නමුත් මිනිහගේ අදහස ඒක මගේ වැඩක් කියලා. ඒ නිසා මිනිහ තර්ජනය කළා.”

“හරි ලොකු හාමුදුරුවනේ එහෙමද, එහෙනම් හිතා ගන්න මේ කුටියේ ඉස්සරත් හිටිය ලොකුහාමුදුරු කෙනෙක් කෝ මොකද වුණේ දන්නවද? අදත් නෑ වෙච්ච දෙයක්. තමන් වහන්සේටත් වෙන්නේ ඒ ටික තමයි තේරුණාද? පරිස්සම් වෙන්න ඈ?” මිනිහ කිවුවා.

“ඒ වුණාට මට කිසිම බයක් නෑ. බීල හිටපු මිනිහ ඒ කිච්චේ සිහියෙන් නෙවෙයිනේ. නැතත් මම කවුරු රකින්නද, මොනව නැති වෙන්නද?” ස්වාමින්වහන්සේ කිවුවා.

“හරි! මම අදම ප්‍රශ්නේ ඉවර කරන්නම්. මේ දැන්, එතකොට හරිනේ. මම දැන් ගිහිං කැපය හමුවෙන්නම්.” එසේ කියූ මිනිහා පිණ්ඩපාත ශාලාවට යන්න සූදානම් වෙද්දී ස්වාමින්වහන්සේ මෙහෙම කිවුවා.

"එතනට ගියොත් මොනව වෙයිද කියන්න බෑ. ඔය ප්‍රශ්නේ දුර දිග යන්නත් පුළුවන්." ඒ නිසා මම කිව්වා.

"මේ අහන්න, කැපකරුතුමා හමුවෙන්නේ දැන් යන්න එපා. අද දායකයෝ පිරිල. ඇහෙනවා නේද ඒ පැත්තේ සද්දේ. ඔය විදියට ගියොත් දායකයෝ තමයි තමාට ගහන්නේ. ඇයි බීලා සිහි නැතිව මේ සෙනසුනට ආවට. දැන් ගෙදර ගිහිං සිහියෙන් එන්න ප්‍රශ්ණ විසඳගන්න."

ඒ මගේ වචන ටික මිනිහ පිළිගත්තා ඇත්තටම මටත් පුදුම හිතුනා.

"හොඳයි හාමුදුරුවනේ මං පස්සෙ බලාගන්නම්"

එහෙම කියපු මිනිහා මට වඳිනකොට මෙන්න තව ඒ වගේම කළු මිනිහෙක් කොට කලිසමක් ඇඳපු. උඩුකය නිරුවත් කෙනෙක් කැලෙන් මතු වුණා. මිනිහත් වැඳලා යන්න ගියා.

මං ළඟ සිටිය මා සමගම පැමිණි නාඋයනේ ස්වාමින්වහන්සේ නමක් මේ සිදුවීමට පුදුම වෙලා. කොහොම වුණත් මටනම් මෙය හොඳ අවස්ථාවක් වුණා. ඒක මම ඊළඟට කියන්නම්. ස්වාමින්වහන්සේ අපිට ආමන්ත්‍රණය කළා.

"මහත්තයා, මට පුදුම මේ සෙනසුනේ ඉන්නවා ඔය කැපකරුතුමා කන්න දීල හදන සුනඛයෝ හතර පස් දෙනෙක්. එකෙක් හරි වසයි, ඌ එතුමා ඉන්න ගොඩනැගිල්ල මුර කරනවා. අනිකානම් නාකි අම්මණ්ඩි කෙනෙක්. ඒ වුණාට ඌ ඔය ඉස්සරහ දාන ශාලාව ළඟ තමයි ඉන්නෙ කොලයක් වැටෙනකොටත් ගහක් සෙලවෙනකොටත් සෙලවෙනකොට බුරනවා. අනික් එවුන් අතන මෙතන. මේ එක සතෙකුටවත් මේ දෙන්න පෙනිලා නෑ. තිත්ත කළුවරේ එලියක්වත් නැතුව කොහෙන් ආවද කොහොම ආවද හරි පුදුමයි."

"ඊටපස්සෙ උදේ දානෙට ඔය පිණ්ඩපාත ශාලාවට වැඩියා, ඒ දවස් වල අලුත් ශාලාව නැනෙ. අර පරණ ශාලවෙමයි

වළදන්නේ. දානෙ වළඳලා කැපකරුතුමාට කතා කළා, මනුස්සය කාමරේ ඉඳල ආවා. අතක බාහුව බැන්ඩේජ් කරලා. මම ඇහුවා,

"කැපකරුතුමා ඇයි ඔය අතක් වෙලාගෙන තුවාලයක්ද?"

එතුමා කියනවා. "ඔව් අවසර පොඩි තුවාලයක්. ඒ තරම් ප්‍රශ්නයක් නෑ."

මම කිවුවා."එහෙමනම් කමක් නෑ මටනම් ප්‍රශ්නයක් තියෙනවා."

"ඒ මොකක්ද අවසර?"

"ඔබතුමාව ප්‍රවේසම් කරන එක මට දැන් ප්‍රශ්ණයක්."

"ඇයි අවසර එහෙම කිව්වේ?" මිනිහා ඇහුවා.

"දන්නවද ඊයේ මහා රෑ කොල්ලෝ දෙන්නෙක් ආවා? මෙතනට එන්නමයි හැදුවේ. තමා හමුවෙන්න. අද දෙකින් එකක් කරනවා කිවුවා. මං බොහොම අමාරුවෙන් මෙතනට එන එක නැවැත්තුවේ. ඊළඟට ඒ ආපු මිනිහා මට තර්ජනය කළා. මෙසේ කියූ විට කැපකරුතුමාගේ ඇස් ලොකු වුණා ඇහි බැමි උඩ ගියා මුහුණෙන් ඉරියව්වෙන් සැකයත් භීතියත් ඉස්මතු වුණා.."

මිනිහ බොහෝම කලබලෙන් කිවුවා.

"මොකක්ද අවසර කිව්වේ."

"ඒ මනුස්සය කියන්නේ. කැපකරුතුමා මෙහෙන් යවන්න කියලා. මහා ගොඩක් චෝදනා කරා. ඒවා මට වැඩක් නෑ. මට තියෙන ප්‍රශ්නය මෙතන ආයේ ඉස්සර වගේ ජීවිත හානියක් වෙයිද කියලා. මොකද මිනිහ මට කිවුවා ඉස්සර මෙහෙ හිටපු ලොකු හාමුදුරු කෙනෙක්, දන්නවද වෙච්ච දේ. තමාටත් ඒ ටික තමයි මම කරන්නේ. ඊටපෙර කැපකරු එලවන්න කිවුවා.

“කැපකරු තුමා, මම මැරෙන්න බය නෑ. නමුත් මෙහෙ බොහොම අමාරුවෙන් දැන් ආයේ ගොඩ නැගෙන වෙලාව. අයෙමත් මිනීමැරුමක් එහෙම උනොත් මේ භූමියට කවුරුත් එන එකක් නෑ. ” එවිට එතුමා ටිකක් තැති ගත්තා වගේ. “අවසර මම එහෙනම් ගෙදර යන්නම්. ආයේ අවසරට කරදරයක් වෙන්න දෙන්න බෑනේ. මම නම් උන්ට බය නෑ.” කැපකරුතුමා කිවුවා.

“කැපකරුතුමා මේ අහන්නකො. ඔබතුමා අපි මෙහාට එන්නත් පෙර රැකගෙන හිටියේ මම කැමති නෑ කීයටවත් ඔබතුමා පිටට යනවට. නමුත් මේ ව්‍යාකූල අවස්ථාව ටිකක් මග හරින්න වෙනවා. ඒ කාගේත් ආරක්ෂාව ගැන හිතලා. මම හොඳ යෝජනාවක් කරන්නම් ඔබතුමා නාඋයනට යන්න එහෙ හොඳ පහසුකම් තියෙනව. මාස තුනක් එහෙ දස සිල් වෙලා ඉඳල ආයේ එන්න.”

ස්වාමින්වහන්සේ එහෙම කිවුවට මිනිහට ඕන සීලයක් නෑ. එහෙම හැදෙන්න ඕන කෙනෙක් නෙමෙයි. ඒ නිසා ඒ මනුස්සය කිවුවා.

“නෑ අවසර මට ඔය කොහේවත් යන්නේ නෑ. මම ගෙදර යනවා.”

පසු දිනම ඒ කැපකරුතුමා යන්න ගියාලු.

**බැලූ බැල්මට රන් රුවක්**
**ඇතුලෙ ලෝකඩ සෙම්බුවක්**
**රවටනා ඇස්බැන්දුමක්**
**වැඩක් නැති හිස් බම්බුවක්**
**වැඩක් නැති හිස් බම්බුවක්**

**එපා රැවටෙනු දුටු සැනින්**
**එපා ලං වෙනු මුලා වී**
**අසංවර මිනිසුන් ලොවේ**
**සැරිසරයි වෙස් ගත්ලෙසින්**
**සැරිසරයි වෙස් ගත්ලෙසින්**

සිංහ වෙස් ගත් කොටළුවෙක්
සිංහ හම පොරවූ නමුත්
සිංහයෙකු වනු හැකිද කිසිදා
අහස පොලවට යා වුණත්
අහස පොලවට යා වුණත්

කපටි වංචා බොරු එපා
මෝඩ ගති හුරුවනු එපා
දුලබ වූ මනු ලොවේ ඉපදී
අපා මග සරසනු එපා
තමාටම තම වල කපාගෙන
පමා වී දුක් වනු එපා
තමාටම තම වල කපාගෙන
පමා වී දුක් වනු එපා

## කළ කම් පල දේ

යො දණ්ඩෙන අදණ්ඩෙසු, අප්පදුට්ඨෙසු දුස්සති;
දසන්නමඤ්ඤතරං ඨානං, ඛිප්පමෙව නිගච්ඡති.

(යමෙක් දඬුමුගුරු ගෙන අහිංසකයනට පහරදෙයිද නොකිපුණු අය කෙරෙහි කිපෙයිද එයට විපාක ලෙස කරුණු දහයකින් එකක් වහා පලගෙන දෙයි.)

වෙදනං ඵරුසං ජානිං, සරීරස්ස ච භෙදනං
ගරුකං වාපි ආබාධං, චිත්තක්ඛෙපඤ්ච පාපුනෙ

රාජතො වා උපසග්ගං , අබ්භක්ඛානඤ්ච දාරුණං;
පරික්ඛයඤ්ච ඤාතීනං, භොගානඤ්ච පභඞ්ගුරං.

අථ වාස්ස අගාරානි, අග්ගි ඩහති පාවකො;
කායස්ස භෙදා දුප්පඤ්ඤො, නිරයං සොපපජ්ජති.

*(ධම්මපද - දණ්ඩ වග්ග)*

# බුදුරජාණන්වහන්සේ බලන්න අපි ගිය ගමන

සාමූහිකත්වය, එකමුතුබව කොතනත් අවශ්‍ය දෙයක්. ඒ සඳහා විවිධ පාර්ශවයන්ගෙන් කටයුතු කරන්න ඕන මග පෙන්වීම ලේසි නෑ. විවිධ චරිත ඇසුරු කරනවිට. එහෙම වුණත් අතීතයේ සිටන් සිරිතක් තිබුනලු වස් අවසානයේ බුදුරජාණන්වහන්සේ බලන්න වඩින එක. ඔය කඨින චීවර පූජාව පටන්ගැන්ම උනෙත් එහෙමනේ. කඨින ආනිසංස දේශනා වලදී ස්වාමින්වහන්සේලා පැහැදිලි කරන්නේ. වස් කාලේ අවසන් වුණාම සෑම අරන්‍යයෙකම ස්වාමින්වහන්සේලා බුදුරජාණන්වහන්සේ වහන්සේට වන්දනා කරන්න වැඩිනවලු. ඒ නිසාලු මිහිඳු මහ රහතන් වහන්සේ ලංකාවට වැඩලා පළමු වස් කාලෙ අවසන් වන විට ආපසු වඩින්න තීරණය කලේ. නමුත් ඒ වන විට බුදුරජාණන්වහන්සේ පිරිනිවන් පාල අවුරුදු 300කට ආසන්නයි. දේවානම් පියතිස්ස රජතුමා ඇහුවා.

“අවසර ස්වාමින්වහන්ස, ඔබවහන්සේ වැඩමවීම මුළු ලංකාද්වීපයටම යහපතක් වුණා. ඒ නිසා තව දුරටත් වැඩසිටින සේක්වා.”

“මහරජ, මට බුදුරජාණන්වහන්සේට උපස්ථාන කරන්න, වන්දනා කරගන්න ආපසු වඩින්න ඕන.”

එවිට රජතුමා පුදුම වෙලා ඇහුවා.

“ස්වාමීනී, බුදුරජාණන්වහන්සේ පිරිනිවන් පාලා ගොඩක් කල් නේද?”

මිහිඳු මහ රහතන් වහන්සේ එවිට පිළිතුරු දුන්නා.

“මහරජ, ඇත්ත තමයි. නමුත් සර්වඥ ධාතුන් වහන්සේ සහිත දාගැබ් තියෙනවා. අපි ඊට උපස්ථාන කරන්නේ, වඳින්නේ බුදුරජාණන්වහන්සේට සේම ගෞරවයෙන්”

ඒ අනුව තමයි ලංකාවේ මිහිඳු මහරහතන් වහන්සේ වැඩිය පසු ඇති වූ ප්‍රථම චෛත්‍යය වන ථූපරාමයත් අනෙකුත්

සෑම චෛත්‍යයක්මත් ඉදිවුනේ. අදත් ඒ සිරිත එලෙසම පවතිනවා. වස් අවසානයේ අපි අනුරාධපුරයට යන්න සූදානම් වුණා. බුදුරජාණන්වහන්සේ බලන්න. මේ යෝජනාව ගෙනාවේ අපේ දෙවනි ස්වාමින්වහන්සේ. ගමනට ලොකු ස්වාමින්වහන්සේ එකතුකරගන්න බැරි වුණා. ඊට හේතුව වස්කාලේ අවසන් වූ විගස උන්වහන්සේට පිටරට වඩින්න සිදු වුණ නිසා.

ලොකු ස්වාමින්වහන්සේ නැති වුණාට අපේ ගමන අඩුවක් වුණේ නෑ. දෙවනි ස්වාමින්වහන්සේ හරිම දක්ෂයි පිංකම් වැඩ වලට. ඒ නිසා ලස්සනට සංවිධානය වුණා. මූලික බරපැන අපේ අබේගුණවර්ධන මහත්මයාගෙන්. වාහන පහසුකම් එතුමා යෙදුවා නමුත් අපිට ගැටළුවක් වුණා. දානය සපයන්නේ කොහොමද කියන එක. වෙලාවට, ඒවා සපයන්න ඕන වෙලාව පහු වුණොත් ස්වාමින්වහන්සේලා බඩගින්නේ. අපි ඒ ගැන ස්වාමින්වහන්සේලාගෙන් විමසුවා.

“අවසර ස්වාමීනි, අනුරපුර යනකොට දානය කඩෙන් ගන්නද?”

“ඒක කොහොම හරි බැරියැ.” ස්වාමින්වහන්සේ කිවුවා.

අපි යොදාගත් පරිදි ගමන පිටත් වුණා. ගල්ගමුවේදී අපි මේ පාරේ යමු. ආණමඩු පාරට හැරෙව්වා, එයින් අතුරුපාරකට ගියා කැලේ මැදින්. පාර වැරදුනාවත්ද?, නැත්තම් කෙටි පාරක්ද? ප්‍රශ්නයක්.

“අවසර ස්වාමීනී, දානෙ වෙලාව වරදියි මේ කැලේ පාරේ ගියොත්” අපි කිව්වේ ලොකු වගකීමක් අපට ඇති නිසා.

“කමක් නෑ යං යං.” ස්වාමින්වහන්සේ කිවුවා.

කැලේ මැදින් හැරී හැරී ටික දුරක් ගිහිං නතර වුණේ තවත් අරණ්‍යකට, එහි නම සඳහන් වී තිබුණා ගල්ගමුව නාගපබ්බත විහාරය කියලා. අපි මදක් විවේක ගත්තා. ස්වාමින්වහන්සේ දානය වැළඳුවා. ඉන්පසු අපටද ආහාර ලැබුණා. ටික වෙලාවකින් පසු කවුරුත් සෙනසුන බලන්න ගියා.

ගල්ලෙන් විශාල ගණනින් යුතු වන රොදක්. නමුත් කැලයට යට වෙලා. ඒවා භාවිතා වෙන්නේ නෑ. වැඩ සිටින ස්වාමින්වහන්සේ හැකි පමණින් ඒ ලෙන් ප්‍රතිසංස්කරණය කරනවා. අපි එහි වැඩ සිටින ස්වාමින්වහන්සේගෙන් ඇහුවා.

"ස්වාමීනී අවසරයි. මේ ස්ථානයට නාගපබ්බතය කියන්නේ ඇයි?"

"මහත්මයා, "**නාග**" කියන වචනය නයාටත් යොදනවා. ඇතාටත් යොදනවා ඇතැම් තැනක බුදුරජාණන්වහන්සේටත් යොදනවා බුධ නාග කියලත් දානවා."

"එහෙම වුණත් මෙතෙන්ට ඒ නම යොදන්නේ අන්න අර උස ගල් පර්වතය නිසා. බලන්න ඒක ඇතට පෙන්නේ නයි පෙනයක් වගේ නේද. ඒ නිසා ඉස්සර ඉඳල ඔය නම කියනවා. ලස්සන වැඩේ ඒක නෙමෙයි උදේ පාන්දර මොණරු ඔතෙන්ට එනවා ඇවිත් ඉර පායන දිහා බලං කතා කරනවා. එක දැක්කනම් ඔබතුමන්ලාටත් මොර පිරිත් මතක් වෙයි." අපි සෙනසුන පුරා ටික දුරක් කැලේ පීරමින් ඇවිදගෙන ගියා නටඹුන් වී තිබූ ගල්ලෙන් දකින විට අතීත දුටුගැමුණු මහා රජ සමයට සිත ගියා. ඒ කාලෙ මේවා ලස්සන රමණීය අරණ්‍ය සේනාසන. දහස් ගණනින් ස්වාමින්වහන්සේලා අද කැලයෙන් යට වෙලා. ඇත්තටම කැලේට යටවෙලා කිවුවත් වැරදි. අපි කතා වුණා සංවේගයෙන් යුතුව.

"මහත්තය මේවා ඉස්සර කොයි වගේ තියෙන්න ඇත්ද නේද?"

"ම්හ්." මිත්‍රයා කිව්වෙ එච්චරයි.

"දැන් කැලේට යටවෙලා වැල් බිහිවෙලා නේද?"

"ම්හ්." එකටත් එකමයි පිළිතුරු දුන්නේ.

"මම හිතුව මහන්සිවෙලා වෙන්න ඇති කියල. වෙහෙසෙන අය නෙවෙයිනේ."

"මහත්මයට වෙහෙසද, වතුර ටිකක් දෙන්නද?" මම මගේ කුඩා වතුර බෝතලය ගනිමින් ඇසුවා.

"නෑ මහත්මයා මහන්සිය නෙවෙයි. මං මේ කල්පනා කලේ ඔය කිවුවා වගේ ඉස්සර රමණීය වූ සෙනසුන් අද කැලයෙන් යට කරගෙන. මට මතක් වුණේ මේ යන රටාවටනම් තව ටික කලකින් මුළු බුද්ධ සාසනෙත්, රටත් මිසදුටු කැලයෙන් වැහෙනව." බොහොම සංවේගයෙන් කීවා.

අපි ටික වෙලාවකින් අනුරපුර යන්නට පිටත් වුණේ සෙනසුනේ ස්වාමින්වහන්සේට වන්දනා කර ආශීර්වාද ලබාගෙනයි. අනුරපුරට ලංවෙනවිට හවස් වී තිබුණා. සැඩ හිරු රැස් නිවී යන්නට ලංවෙලා තිබීම නිසා රුවන්වැලි මහා සෑරැඳු ළඟ සිසිලත්, මද පවනත් ගත සිත වෙහෙස නිව්වා. එහිදී අප රැගෙන ගිය පූජාවන් තැන්පත් කර වන්දනා කළා. උපකාර කළ සැමට ආශීර්වාද කළා.

**බුදු ගුණය සිහි වුණා -කෙලෙස් සිත් වැනසුනා**
**සැදෑ ගුණදම් මැවී- මගේ සිත සැනසුනා**

**කාත් කවුරුත් නැති - හුදකලා ජීවිතේ**
**ජරා මරණයේ- කම්කටලු දුක් මාවතේ**
**තනිකමක් නොමැත කිසිවිටකවත් මගේ සිතේ**
**වැඩ සිටින තුරා බුදු සමිඳු මගේ හදවතේ**

**දුකින් වැලපෙන දිනේ ඔබයි පිහිටක් වුනේ**
**මගේ බුදු සමිඳුනේ වදිමි මම සැමදිනේ**
**මා මෙලොව ඉපදුනේ පිළිසරණ හිමි වුනේ**
**කුළුනු නෙත් යොමු වුණේ පෙර පින්ද මතු වුනේ**

**ඔබේ මහා ගුණ සයුර සිහි කරනු බැරි වුනත්**
**එයින් බිඳ කුත් පවා සිහි කරන විට මෙමා**
**දෝරේ ගලනා සතුට පිට කරනු තැන් සොයා**
**මා නෙතු යුගල පුරා කඳුළු කැට එක් වුණා**

# මහා ථෙර කුටිය

අපිට තාම තියෙන්නෙ පුංචි කුටි දෙකක් පමණයි, බැරිවෙලාවත් ලොකු ස්වාමින්වහන්සේ වැඩියොත් මද විවේකයටවත් ගැලපෙන තරමේ කුටියක් ඇත්තේ නෑ. එය මහා අඩුවක්. අපේ හැම දෙයම සකස් වෙන්නේ පුංචි කමිටුවෙන්. ඒ කිව්වේ අපේ හතර පස් දෙනාගෙන් එදත් වෙනද වගේම අපි හැන්දෑවේ එකතු වුණා. අබේගුණවර්ධන මහත්මයත්, මමත්, ශාන්ති මහත්මයත් කඳු මුදුනේ පුංචි විහාරයට ඒ ස්වාමින්වහන්සේලා සමගින් වන්දනාවට සැන්දෑවේ කඳු මුදුනින් අඩ අඳුරේ ඇසෙන වන්දනාව සමහර දවසට කලුවරේම අපි අහගෙන සිටිනවා. එය හරිම ආස්වාදයක්, සතුටක් නිසා.

එදා වන්දනාව අවසන් වුණා. සඳ එලිය හොඳට වැටිලා පළාතම බබලනවා. අපි ගල් තලාව මත ඉඳගෙන ඈත බලාගෙන සිටියා. අඩ අඳුරේ සඳ එළියේ පෙනෙන මහා කඳු වලල්ලේ නිසංසල බව දිහා. මුලින්ම අපේ සාමාජිකයෙක් කවුද හරියටම මතක නෑ. කතාවට ආරම්භ කළා.

"අපි දැන් ඊළඟට මොකද කරන්නේ?"

කාගෙන්වත් පිළිතුරක් නෑ. මම කිවුවා,

"අපි ස්වාමින්වහන්සේගෙන් අහමු."

සෙනසුනේ ලොකු ස්වාමින්වහන්සේත්, දෙවැනි ස්වාමින්වහන්සේත් දෙනම වහන්සේම ගල් තලාවේ මදක් ඉහලින් ඇහෙන දුරින් වැඩසිටියේ වන්දනාව අවසන් වෙලා. ලොකු ස්වාමින්වහන්සේ ඇහුවා.

"ඇයි මහත්මයා, තවත් වැඩක් ඕනද?"

"ඔව් අපේ ස්වාමින්වහන්ස" අපි එකහෙලාම අවංක සිතින්.

"හරි මහත්මයා දැන් අපිට ඕන අපේ වැඩිහිටි ස්වාමින්වහන්සේ නමක් වැඩියොත් වැඩ හිටින්න පුළුවන් කුටි සෙනසුන් ඉඩකඩ ඇති කුටියක්. අපේ කුටි හරිම පොඩියි. 8 x 8 කුටියක ඇදයි මේසේයි තිබ්බම හැරෙන්න ඉඩ නෑ. ඒ නිසා ගැලපෙන විදියේ කුටියක්", ස්වාමින්වහන්සේ කීවා.

අබේගුණවර්ධන මහත්මා එය සනාථ කරමින් එහි වැදගත් කම ස්ථිර කරා. හදන්නට එකඟ වුණා.

"ඉතිං ඕකට පහසු දර්ශනීය තැනක් ඕන නේද?" අපි ඇසුවා.

එහි තීරණයද ලොකු ස්වාමින්වහන්සේම දුන්නා.

**"කුටියක් හදනකොට තැන සුදුසු වෙන්නත් ඕන. ඒ වගේම මේ කැලයට හානියක් නොවෙන්නත් ඕන. ඒ නිසා මගේ අදහස කුටි හදනවනම්. ඉස්සර ඔය කුටි ගරාවැටිච්ච තැන් තියෙනව ඒ තැනක්ම සුද්ද කරලා හදමු නේද?"**

උන්වහන්සේගේ අදහසට අපි කවුරුත් එකඟ වුණා.

"ඉතිං අවසර කොතැනද හොඳ?"

"මහත්මයා, අපි මුලින්ම ඉලක්ක කරන්න ඕන නාඋයනේ ලොකු ස්වාමින්වහන්සේ. ඒ නිසා පරිසරය හොඳ වාතාශ්‍රයක්, ඒ වගේම වහනයක් එන්නට පුළුවන් කමක් මූලික විය යුතුය. කුටියත් ඇතුලත සක්මන සහිතව හදන්න ඕන නිසාත් උපස්ථායක ස්වාමින්වහන්සේලාට පහසුවට දෙමහල් විය යුතු නිසාත් මාගේ අදහස මෙම ගල් තලාවේ වම් පස කාමර හතරේ දිග කුටිය,. බලන්නකෝ වහල කැඩිලා, බිත්ති පුපුරලා, වේ හුඹස් බැදලා, දොර ජනෙල් දිරා වැටිලා. අපි ඔතන සුද්ද කරලා ගමු." ස්වාමින්වහන්සේ අදහසක් මතු කළා.

"අවසර! ඔතනට ලොකු ස්වාමින්වහන්සේට වඩින්න පුලුවන්ද?" අපි ඇහුවා.

"දැන්නම් බැහැ. අපි පාර හදමු මේ ගල් තලාවට. ගල් තලාවෙන් කුටියට පාලමත් හදමු. කුටිය ඇතුලෙම වාහනය නවත්වන්න."

එය ඇසූ අපි විශ්මයට පත් වුණා. හරිම ලස්සනයි අදහස. නමුත් ගැටළුවක් මතු වුණා. ඒ විදියට හැදුවොත් බිම් ප්‍රමාණය අනුව කුටිය තුල ඉඩකඩ වාහනය සඳහා යොදන්න වෙනව. පාලමටත් අධික වියදමක් එ නිසා අපි අපේ අදහස ප්‍රකාශ කළා.

"අවසර! අඩි 12ක් 15ක් වෙන් කරන්න වෙනවා වාහනයට, ඒ වගේම ඒ ප්‍රදේශයේ කොන්ක්‍රීට් තට්ටුව ඉතා ශක්තිමත් වෙන්න ඕන. ඒ නිසා ඊට වෙනස් ක්‍රමයක් බලමුද?"

"හොඳයි මහත්මයා, මං කිවුවේ මට ආ අදහස. එහෙනම් ගල උඩ වාහනය නවත්වලා අඩි 10 පා ගමනින් කුටියට වඩින්න පුංචි පාලමක් හදමු ආරක්ෂක වැටක් එක්ක."

ස්වාමින්වහන්සේගේ ඒ අදහසට අපි එකඟ වුණා. මුල් ගල තියන්නට දිනය වෙන්කරගන්නේ 2011 කඨින පිංකමත් එක්කමයි. එකට හේතුව, නාඋයනේ මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ වඩින නිසා. තාම වස් කාලෙ පටන්ගත්තෙත් නෑ. පොසොන් පෝය දවස තමයි සාකච්චා වුණේ. හොඳ දවසක් කියල තමයි මට තේරුනේ. ඒ වගේම සාකච්ඡා කරලා දවස් කිහිපයයි ගත වුණේ. මෙන්න ලොරියකින් කොන්ක්‍රීට් කණු ගෙනල්ල සෙනසුනේ පහල ළිඳ ලඟ ගොඩ ගහල. මම කැපකරුගෙන් ඇහුවා.

"කවුද මේව ගෙනාවේ, මොනවටද?" කියලා. කැපකරුතුමා කිවුවා.

"මහත්මයා මොනවටද නම් දන්නේ නෑ. අර අත්තනගල්ලේ උසාවියේ මහත්මයා තමයි ගෙනාවේ" කියලා.

එහෙම කිවුවම මම දැනගත්තා මේ වැඩ පටන්ගන්න තමයි මහාථෙර කුටියේ කියලා. තාම කන්ද උඩට යන්න පාරක් ඇත්තෙත් නෑ. දැම්මම කණු ගෙනත් වැඩ පටන් ගෙන.

**අබේ මහත්මයා ඒ වාගේ හොඳ සත්පුරුෂයෙක්. වැඩක් හිතුනොත් ආයෙ කල් දමන්නේ නෑ. ඒ වෙලාවේම පුලුවන්නම් කරනවා. එහෙම නැණවත්, ධෛර්යමත් මගේ ජීවිතයට හමුවෙච්ච හොඳ චරිතයක්. හැමටම මේ ලක්ෂණය නෑ. කලාතුරකින් අයෙකුට තමයි එහෙම ගුණ පිහිටන්නේ.**

සමහරු කතා කළාට වැඩේ පස්සට අදිනවා. “කතාව දෝලාවෙන් ගමන පයින්” කියන කියමන වගේ. එහෙම වෙන්නේ හිතේ තියෙන කෙලෙස් බර නිසා. පිනක් කරන්න ගියාම පමා කරවනවා. ඒ කෙලෙස් මතුවෙලා සමහරවිට ලෝභකම ද්වේශය එන්නත් පුළුවන්. සැකයත් ඒ වගේමයි. හොඳ නිදර්ශනයක් ලොකු ස්වාමින්වහන්සේ බණට කියල දුන්නා.

මං හිතනවා ඔබ අහල ඇති කෙටියෙන් කිව්වොත් අර එකම එක සළුවක් තිබුන බමුණා. එකම සළුව නිසා තිබුනෙ ඒකසාටක කියලනෙ කිව්වෙ. එතුමා බණ අහද්දී ශ්‍රද්ධාව මතු වුණා. ඒ නිසාම සතුට ඇති වුණා. පූජා කරන්න දෙයක් සිතුවා. තම සළුව පමණයි තිබෙන්නේ. හිතුන බුදුහිමි පා මුල තබලා පූජා කරන්න. ආයේ හිතුන මෙච්චරයි තියෙන්නෙ කොහොමද ඒක දීල කියල. එහෙම හිතල තුන්වෙනි පාර කොහොමහරි ලෝභය බිඳගෙන පූජා කළා. ඒ සතුටට දිනුවා කියල කෑ ගැහුවේ. එය ඇසූ කොසොල් රජු තෑගී දුන්න. මතකද ධම්ම පදයේ ගාථාව?

*අභිත්ථරේථ කල්‍යාණේ - පාපා චිත්තං නිවාරයේ*
*දංදංහි කරෝතෝ පුණ්‍යං - පාපස්මිං රමතී මනෝ*

පමා උනොත් පිං කරන්න - කෙලෙසුන් එයි සිත වහන්න
වෙර වීරිය සිතට ගන්න - කෙලෙස් මරා නිවන් යන්න
කෙලෙසුන් ජය ගන්න බැරී - මෝහ සිතයි අඳුර පිරී
නැණ නුවණින් වෙලා දිරී - නිවන් දකිමු සතුට පිරී

කතාව වෙනතකට ගියා. කමක් නෑ අපි කතාකලේ අබේගුණවර්ධන මහත්මයා ගැනනෙ එතුමා මේක වැඩේ විතරක් නොවෙයි මුළු ජීවිතයම එහෙම තමයි.

දැන් ඉතිං ප්‍රශ්නය මේකයි, මුල්ගල් තියන දිනයත් හරි. වියදම් දරන ක්‍රමයත් කොටසක් සඳහා සම්පූර්ණයි. නමුත් මොනව වුණත් මෙහි ලොකු වගකීමක් පුංචි කුටියක්නම් අවශ්‍ය දේ ශ්‍රමදාන මගින් ගෙනියන්න පුළුවන්. නමුත් මේක ලොකු කුටියක් ඒ නිසා මේවා කොහොම ගෙනියන්නද ප්‍රශ්ණ ගැන සිතන්න වුණා.

ටික දවසක් යනවිට, පොල්ගහවෙල අසෝක කරුණාරත්න මහත්මා පැමිණියා. තමාගේ වාර්ෂික දාන වාර ගැන කතා කරන්න. එතුමා දුටුවා පහල පාරෙ තත්වය එය ප්‍රතිසංස්කරණය කරන්න රුපියල් දහදාහක් දීල තිබුණා. එය උපයෝගී කරගෙන වෙහෙරට පාර හදන්න පටන් ගත්තා. එවිට යක්කල සමන් මහත්මා, මිනුවන්ගොඩ වජිර ප්‍රියන්ත මහත්මා, බුලත්සිංහල ඩීන්ස් දයාල් මහත්මා මුලිකව බරපැන යොමු කර විවිධ පිරිස් වල ශ්‍රම පරිත්‍යාගයෙන්ද එය සම්පූර්ණ කළා. ශ්‍රම පරිත්‍යාග කිරීම පිළිබඳව දැනගන්නට ලැබුන පරිදි කැලණියේ විශ්‍රාම ලත් විගණාධිපති (නම නොදනී) තුමා ඇතුලු පිරිස බුලත්සිංහල ඩීන්ස් දයාල් මයා ඇතුලු පිරිස කටානේ දිලීප මයා ඇතුලු පිරිස, නවතල්වත්තේ පුෂ්පකුමාර මයා ඇතුලු පිරිස, නිට්ටඹුවේ තිලින මහත්මා ඇතුලු මිත්‍ර පිරිස, බලතව සමීර මහත්මා ඇතුලු එම ළමා මිත්‍ර පිරිස සහභාගි වුණා.

ඒ අනුව සෙනසුනේ ඉහල ගල්පොත්ත දක්වාම පාර සකස් කරගන්න හැකියාව ලැබුණා. 2013 වස් අවසාන පිංකම දිනේ, අප පුංචි කම්ටුවේ මිත්‍ර පිරිස එක්ව නාඋයනේ ලොකු ස්වාමින්වහන්සේ සෙත් පිරිත් සජ්ඣායනා කරද්දීම මුල්ගල් තබා වැඩ ආරම්භ කළා. එදින වැඩ ආරම්භ කළත් සෙනසුනේ අත්‍යවශ්‍ය වෙනත් කටයුතු නිසා එය දවසින් දවස පමා වුණා. ඒ කාලය තුල 2013 වසරේ මුල් භාගයේත්දී පහල දාන ශාලාව සංඝාවාසය සහ වසන්ත මහත්මාගේ ගිලන් කුටිය ආදිය සඳහා අපගේ කාර්මික ශිල්පීන් වන මංජු මහත්මා ඇතුලු පිරිසට යෙදවෙන්න වුණා. 2013 මුල් කාලයේ නැවත වැඩ ආරම්භ කර

කුටියේ කටයුතු අබේගුණවර්ධන මහත්මා, යක්කල සමන් ට්‍රේඩ්ස් අධිපති සමන් එදිරිසිංහ මහත්මා, වෛද්‍යාචාරිනි සුමනා විමලරත්න මහත්මිය, සහ එතුමියගේ හිතෛෂී පිරිසගේ මූලික සහභාගීත්වයෙන් සහ එදිනෙදා දාන දායක පිරිස ලබාදෙන ගොඩනැගිලි ආධාර මුදලින් වැසිකිළි පද්ධතිය සහ උපස්ථාන කුටි සෙසු කාමර හයක ඇතුලත සක්මන් මලු වලින් යුක්ත මහා කුටියක් සාදා නිම කරන්නට හැකි වුණා. හැමදෙනාම මහත් සතුටින් 2013 කඨින පිංකමේදී කුටි සෙනසුන් කීපයක් සමගින් මේ වටිනා සිහිවටනයද අති පූජනීය නාඋයනේ මහා මාහිමිපාණන් වහන්සේ සහ අති පූජනීය හැවැන්පැලැස්සේ චන්ද්‍රවංශ ස්වාමින්වහන්සේ ඉදිරියේ සහ සතුකොට පූජා කළා.



## අටුවා පෙළ පොත්

1998 වනවිට අංග සම්පූර්ණව සෙනසුන තිබුණායැයි මුල් පොතෙහි සඳහන් වූවත් ලොකු ස්වාමීන් වහන්සේ කියන විදියට නම් මේ සෙනසුනේ මුලදි වැඩ සිටිය කෙහෙල්ඇල්ලේ ස්වාමින්වහන්සේට අවසාන කාලය වන විට දැඩි ලෙස ගිලන් වුණාලු. ඒ නිසා උන්වහන්සේ වෙනුවෙන් සුදුසු කුටියක් තිබුනේ

සෙනසුනට ඇතුල් වෙන ආසන්නයේ. අපේ ස්වාමින්වහන්සේලා මුලින්ම වැඩ සිටියේ එතන. එය දෙමහල් කුටියක්. නමුත් අපි පැමිණෙන විට ඉහල කුටියේ වහලය සෑම තැනම රිලවුන් කඩා දමලා වැස්සට වතුර දෝරේ ගලා යමින් තිබණේ. ඒ වගේම එය විවෘත ඉහල මාලයක්. ඒ නිසා කුටි සකස් වෙනකම් අපේ ස්වාමින්වහන්සේලා සිවුරු වලින් ආවරණය කරගෙන වැඩ සිටියා.

එහි බිම් මහල හරිම සීතලයි, වැසි සමයේ සිවුරු පවා පුස් බදින තරමට සීතලයි. මහා ඉඩෝරයක් එන අගෝස්තු මාසයේ කඳු මුදුන දහදිය දමන පිච්චෙන රස්නය තිබුනට ඒ කුටියනම් සීතලම කුටියක්. මං හිතනවා අපේ ඉස්සර හිටපු බුද්ධිමත් මහත්තුරු රත්නායක මහත්මා, පියදාස මහත්මා වගේ අය ඒ නිසාම වෙන්න ඇති හැම ඍතුවටම ගැලපෙන්න එතන ගිලන් කුටිය හැදුවේ. කෙසේ නමුත් ඉහල විහාරය ජරාවාස වෙලා යද්දී කලින් වරින් වර වැඩ සිටි ස්වාමින්වහන්සේලා සියළුම වටිනා පරණ දහම් පුස්තක මේ එවකට තිබූ එකම කුටියේ ගොඩගසා තිබුණා. නමුත් වැසි සාමය ගැන නොසිතා කළ දෙයක් නිසා සියළුම පොත් කාවන්ගේ රජ දහනක් වී තිබුණා. ඒ නිසාම ස්වාමින්වහන්සේලාට හදිස්සියට බණ පදයක් බලාගන්නවත් පොතක් නෑ.

නාඋයන මුල් සෙනසුන මතක් කළ විට කාරුණික නෙත් යොමු කළ අති පූජනීය මීගොඩ සංඝසෝභන ස්වාමින්වහන්සේ පොත් කිහිපයක් ලබාදුන් නමුත් එහිද සම්පූර්ණ බවක් තිබුනෙ නෑ. එය සෙනසුනට මහත් අවශ්‍යතාවයක්. දිනක් සංස්ථාවේ නාඋයන වාසී පූජ්‍ය බෙලිහුල්ඔය ඥාණසිරි හිමියන් තවත් තරුණ පිරිසක් එක්ක හදිස්සියේම වැඩියා. ඒ පැමිණි පිරිස සෙනසුනට අවශ්‍ය සියළුම ධර්ම ග්‍රන්ථ එදා රැගෙන ඇවිත් තිබුණා. සතුටින් අපේ වත්මන් ස්වාමින්වහන්සේට පූජා කළ බව උන්වහන්සේ පසු දිනක අපට සැල කලේ සදහම් සතුට පිරි මුවින් යුතුවයි.

ඒ පැමිණි පිරිස අතර එවකට කෑගල්ල මහ රෝහලේ සේවය කළ වෛද්‍ය ලසිත් මලලසේකර මැතිතුමා, පිළියන්දල පෞද්ගලික ආයතනයේ සේවය කරන ඉංජිනේරු චමින්ද

මහත්මා සහ මිතුරු පිරිස සිටි බවයි අපට මතක් කලේ. මෙය සිදු වූයේ 2011 වසරේ මුල් භාගයේ.

මේ කතාව වෙනතකට ගන්නේ ඇයි. හේතුව නම් ඊට සම්බන්ධ තවත් කතාවකට මුලපුරන්නටයි.

සෙනසුනට ගිලන් කුටියක අවශ්‍යතාවය උපරිමෙන් තිබුණා. ලෙඩක් දුකක් වුණාම කඳු මුදුනේ කුටි වල වැඩ සිටින විට, එය ගිලන් ස්වාමින්වහන්සේට පමණක් නොවෙයි උපස්ථායක පිරිසටත් අපහසුයි. ඒ නිසා දාන ශාලාව අවටින් කුටියක් තිබීම වඩා පහසුයි. මේ අවශ්‍යතාවය තිබියදීම අපේ මුලින් කතාවේ පූජනීය ඤාණසිරි ස්වාමින්වහන්සේ වැඩියා. දින කිහිපයක් නතරවී සිටීමට. ඒ කාලය තුලදී පසුගිය වසර කිහිපයේ දියුණුව දුටු එකී ස්වාමින්වහන්සේ සතුටු වුණා. මේ අතර අපගේ දෙවැනි ස්වාමින්වහන්සේ ඊළඟ අවශ්‍යතාවය වන ගිලන් කුටිය ගැන මතක් කළා. පුදුමයි කියන්නේ, අපගේ පූජ්‍ය ඤාණසිරි ස්වාමින්වහන්සේ හමුවී කමටහන් ගන්නට පැමිණි දහම් මිතුරකු වූ නුවර වසන්ත මහත්මා (එතුමා වෘත්තියෙන් ඉංජිනේරු මහත්මයෙක්. කලක් ඇමරිකාවේ සේවය කළ කෙනෙක්.) ඉල්ලීමක් කළාලු,

**"අවසර ස්වාමීනී. මම කැමතියි හොඳ පින්කමක් කරන්න. මම එකතු කරපු මුදලක් තියෙනවා ඒ සඳහාම. ඒ නිසා මට ඊට මගක් සලසා දෙන්න"** කියල.

ඉල්ලීම මත අපේ පූජ්‍ය ඤාණසිරි ස්වාමින්වහන්සේ එතුමාට මෙම ගිලන් කුටියේ අවශ්‍යතාවය සඳහන් කළ විට සතුටට පත්ව මුදල් වැය කළා පමණක් නොව තම සගයින් සමඟ පැමිණ ශ්‍රමයද පරිත්‍යාග කරමින් කළ අගනා පුණ්‍යකර්මය මා සියැසින්ම දුටුවා. ඒ අනුව දෙමහල් පරණ කුටියේ දිරාගිය උඩුමහල සම්පූර්ණම ඉවත් කර, බිම් මහලද උපාසක කුටිය සහිතව ප්‍රතිසංස්කරණය කර, ගිලන් අවස්ථාවකදී වාහනය දක්වා රෝද පුටුවකින් යා හැකි පරිදි පාලම් පාරක්ද ඉදි කරමින් එම පිංකම කලේ මහත් සතුටින්. කුටිය ඉදිකළා පමණක් නොව එම කුටියට අවශ්‍ය සියළුම උපකරණද සහිතව 2013 කඨින පිංකම

දිනයේම සඟසතු කිරීමට පින්වත් මහතාට හැකි වූ බව ස්වාමින්වහන්සේ අපට දැනුම් දුන්නා.

## සදහම් සිතුවිලි

*සුදු සෙලවන් වලා ගැබ පුන් සඳයි සිනාසෙන්නේ*
*මුතු මාල මෙන් දිලෙන පිනි කැට සඳ රැසින් දිලෙන්නේ*
*මට පාළුවක් නොවේ සදහම් පිපාසෙයි දැනෙන්නේ*
*ඇයි තාම නැතිද සම්බුදුනි හද කුටිය වෙත වඩින්නේ*
*සිහින මාලිගාවේ මා රැඳී සිටි වෙලාවේ*
*බුදු සම්දුන් වැඩ සිටියා*
*සිත් පුළින තලාවේ*
*මගේ පැතුම් සඵල වන්න - බුදු සම්දුනේ වඩින්න*
*ඔය කරුණාබර වදන් වලින් - අපිට පිහිටවන්න*

මෙහි අන්තර්ගත අර්ථයෙන් ගෙනෙන චිත්ත රූප රටාව 2013 වසරේ පූජා කිරීමට යෙදුන ධර්මශාලාවේ ඉදිකිරීම් හා සම්බන්දයි.

පූර්ණ චන්ද්‍රයා ඇති පසළොස්වක පොහොය දවසේ නිසල රාත්‍රී සඳ එළියේ ගල්තලාව මත රැඳී සිටිද්දී සිතට දැනුනේ වෙනත් අයට දැනෙන පාළුවක් නොවෙයි. සඳ එළියට තුසර බිංදු දිලිසෙද්දී අහස් ගැබේ තරුකැට දිලිසෙද්දී, සඳ එළියට පොකුණු ජලය දිලිසෙද්දී, අහසෙත් පොලවෙත් ජලයෙත් හැමතැනම සම්බුදු අසිරිය මැවුණා. ඒ නිසා ඒ උතුම් සම්බුදුරජාණන්වහන්සේ සිහිවෙනවා. පාළුව වෙනුවට දහම් බිඳක් අසන්නට ඇත්නම් කියා සිත කියනවා. ඉතිං මගේ බුදු සම්දුනි, මගේ සිතට නිවන් රසය ලැබුණොත් එය මට මහත් සතුටක්. හරියට බුදුරජාණන්වහන්සේ වැඩියා වාගේ. කවද්ද ඒ දවස උදා වෙන්නේ යනු මෙහි අර්ථයයි. මෙය ස්වාමින්වහන්සේට එවන් දිනක එවන් රැයක සිතට දැනුන අදහස් මාලාවකි.

# සෙනසුන් පූජා 2014

වැඩ සිටින ස්වාමින්වහන්සේලාගේ කැපවීමත්, පුංචි කම්ටුවේ උත්සාහයත් නිසා සෙනසුනේ ගොඩනැගිලි පමණක් නොව ආධ්‍යාත්මික අංශවලින්ද සංවර්ධනය සිදු වුණා. ප්‍රසිද්ධියට කිසිලෙසකින්වත් ප්‍රිය නොකළ, හුදකලා ජීවිතයම අගය කළ අපේ ලොකු ස්වාමින්වහන්සේ විදේශ රටවල ධර්මප්‍රචාරයට යනවා හැරුනුවිට ලංකාවේ සිටින කාලයෙන් වනසෙනසුනෙන් පිටතට වඩින්නේ ඉතා කලාතුරකින්. ඒ වයෝවෘද්ධ මවු පියන් දකින්නටත් ගුරු උතුමන් වහන්සේ වන අති පූජනීය නාඋයනේ ස්වාමින්වහන්සේ වන්දනා කරගන්නටත් පමණයි. එසේ නමුත් දිනපතා සෙනසුනට දානය පිළිගන්වන්නට පැමිණෙන දායක පිරිසට දහම් අවබෝධය ලබා දීමට හෝ, නිවන් දකින රිසියෙන් භාවනා පිලිබඳ අසා දැනගැනීමට කැමති කවුරුන් හෝ පැමිණි විටත්, පොහොය දිනයේ සිල් සමාදන් වන පිරිසටත් ධර්මයෙන් පෝෂණය කරන්නට ලොකු ස්වාමින්වහන්සේ කිසිවිටකවත් මැලි වූයේ නෑ. උන්වහන්සේ සැමවිටම උත්සහ කලේ තම විවේකය රැකගනිමින් නිසි පරිදි ධර්මය බෙදා දීමටයි. නමුත් ඒ පිළිවෙතට වර්තමානයේ සෙනසුනක් කරගෙන යාම ලේසි පහසු දෙයක් නෙමෙයි. ඒ නිසා තමයි ඊට සරිලන පරිදි බාහිර හා සමාජීය කටයුතු සඳහා දක්ෂ වූ මිත්‍ර හිමි නමක් සැමවිටම සෙනසුනෙහි වැඩ සිටීමට උන්වහන්සේ සැලසුම් කලේ. උන්වහන්සේ මෙසේ බාහිර සම්බන්ධතා වලින් තොර හුදකලාව නොහොත් වන සෙනසුනට සීමා වූ භික්ෂු ප්‍රතිපදාව නිසා බාහිර මිනිසුන් තබා අවට ගම්වල බොහෝ දෙනාද සෙනසුනේ ලොකු ස්වාමින්වහන්සේ කවුද කියා දැනට අවුරුදු ගණණක් ගෙවී යන මේ මොහොතේද නිසැකව නොදන්නාහුය.

කෙසේ නමුත් පිරිහීගොස් තිබූ වාර්ෂික දාන දායකත්වය දිනෙන් දින පරිපූර්ණ වීමත්, පොහොය දිනට පැමිණෙන සිල් පිරිස වැඩි වීමත්, සති අග එක් දින භාවනා සඳහා පැමිණෙන පිරිස වැඩිවීමත් වගේම බාහිර සෙනසුන් වලින් නේවාසිකව යම් කලක් රැඳී සිටීමට වඩින භික්ෂුන්ද දිනෙන් දින වැඩි වූහ. ඒ නිසාම එසේ වඩින සුපේෂල ශික්සාකාමී සඟරුවනට සුදුසු නවාතැන් පහසුකම් ලබාදීම දායක අපගේ යුතුකම සහ අපේක්ෂාව වුණා.

එසේ නමුත් සම්මාදම් කිරීමට කිසිසේත් අකමැතිකම නිසා ඊට පිළියම් කරමින් සිටියදී පූජ්‍ය ඤාණසිරි සමිඳුන්ගේ මිත්‍ර පිරිසක් වූ කඩුවෙල තරිඳු මහත්මාද, ඇමරිකාවේ රවී මහත්මාද මේ මහඟු කාර්යය සඳහා මූලික වුණා. ඒ අනුව දාන ශාලාවෙන් ඉතා ඈත වූ නිසංසල පරිසරයක ඉදිකිරීම් කටයුතු සඳහා සැලසුම් කළා. වාහනයක් තබා පා ගමනින්වත් යාමට නොහැකි ඒම ප්‍රදේශයට සියළු බාධක නොතකා වැලි,ගල්,ගඩොල්,සිමෙන්ති, යකඩ පමණක් නොව සදා නිමකළ කොන්ක්‍රීට් කණු පවා රැගෙන යාමට ඒ තරුණ පිරිසගේ ශ්‍රම පරිත්‍යාගය අගය කළ යුතු කරුණක්. ඊට හේතුව කය නොවෙහෙසන පරිසරයක කුඩා කල සිටම හැදුන වැඩුන මේ තරුණයන් මේ භාර ධූර ක්‍රියාවට නිරත වූයේ කර්මඵල විපාක දන්නා නුවණ නිසාම බැවිනි. ඒ අනුව ඇතුලත සක්මන් මළුව සහිත විවේක කුටියක් තනා නිමකිරීමට ගතවූයේ දින කිහිපයක් පමණි.

## කැපකරුතුමෙක් සෙවීම කළුනික වගෙයි

ඉස්සර කාලෙ වගේ නෙවෙයි දැන්. හැම තැනම වෙනස් වෙලා. ඒක පරිහානිය පැත්තට වෙනසක්. හවස් වෙද්දී පමණක් නොව දවස පුරා බොන්නේ නැත්තම් සමාජයේ කොන්වෙනවා කියල හිතෙනවා, හවසට ටීවී බැලුවෙ නැත්තම් කෑම ගන්නෙ නෑ වගේ හිතට දැනෙනවා. පෝය දවස තියෙන්නේ විනෝද ගමන් යන්න. ඉස්සර එහෙමද? නෑ, මේ තත්වය ලොකු කුඩා ගම් නගර හැම තැනම ව්‍යාප්ත වෙලා වසංගතයක් වගේ. මෙහි ආදීනවය කුමක්ද? ගුණ ධර්ම සිත් සතන් වලින් ඈත් වෙන එක එපමණක්ද? නෑ. තිරිසන් ගති ලංවෙන එක. එනිසා මේ වෙනස කොච්චර භයානකද?

මම මේ කතාවෙන් කියන්නේ ඉස්සර කාලෙ පංසලේ ඇබිත්තයෙක් (ගිහි සහායකයෙක්) හිටියා. සමහරවිට කිහිප දෙනෙක්. ඒ අය පඩියට වැඩ කළ අය නොවේ. තෙරුවන් කෙරෙහි ගෞරවයෙන් ජීවිතය කැපකරල පිං පිණිස වැඩ කළ අය. අද තත්වය කුමක්ද? පිනට තබා රජයේ උසස් වැටුපකට සමාන වැටුපක් දීල කන්න බොන්න සියළු පහසුකම් දුන්නත් වන සෙනසුනක කැපකරුකමට එන්න කැමති අය නෑ. ඇයි ඒ?

විනෝද වෙන්න නෑ, මත්ද්‍රව්‍ය ගන්න බෑ, ටීවී එක නෑ, ඕප දූප කතා කරමින් ඉන්න නෑ, රස්තියාදු නෑ ඉතිං කැමති නෑ.

මේ ගෙවීගිය කාලය තුල, ආ ගිය කැපකරු ගණන බොහොමයි. දැන් මාස කිහිපයක් තිස්සේ කැපකරු කෙනෙක් නැහැ. විවේක වෙලාවට ශාන්ති මහත්මා, කටානේ සුනිල් මහත්මා සහ එම මැතිනිය වැනි අය උදවු කළා. නමුත් සැමවිටම සිටින්නට ඉඩක් නෑ. ඇත්තම කියනවනම් මේ කතා ලියන මට එක දිනකවත් ස්වේච්ඡාවෙන් ඉන්නට හැකියාවක් අවසරයක් මාගේ වගකීම් යුතුකම් ඉඩ දුන්නේ නෑ. ජීවිත ඒ තරම් අවිවේකයි.

නමුත් දිනපතා සෙනසුනට ගෙවීගිය අවුරුදු කිහිපයේම දිවා කාලයේ පැමිණි ස්වේච්ඡවෙන් කුටි සෙනසුන් පිරිසිදු කරන හුදෙක් අන් අය නොකරන බර වැඩට කැමති තරුණයෙක් සිටියා. සිහින් සිරුරක් ඇති පෙනුමෙන් සද්දන්තයෙකු නොවූ මොහුගේ සැදැහැ ගුණය, නුවණ, අධිෂ්ඨානය, ඉවසීම, අවංකබව, පරිත්‍යාගය මේ ආදී ගුණයන් සද්දන්තව හිමිවී තිබුණා.



රාත්‍රී කාලයේ තම රැකියාවට යාමටත් දිවා කාලයේ සෙනසුනට උදවු කරන්නටත් පුරුදුව සිටි මේ තරුණයාගේ ක්‍රියා කලාපය වසර 3ක් පුරා ලොකු ස්වාමින්වහන්සේ අධ්‍යනය කළා.

ගෙවී ගිය කාලයේ කරන ලද ඉදිකිරීම් අතර මේ තරුණයාගේ දහඩිය නොහැලූ එකදු කටයුත්තක් නොමැති බවයි ලොකු ස්වාමින්වහන්සේ ප්‍රකාශ කලේ.

මේ කාලය වන විට ලොකු ස්වාමින්වහන්සේට වටින් ගොඩින් ආරංචි වුණා මේ තරුණයා වැඩ කළ කොම්පැණිය වෙනත් රටකට ගෙනයන නිසා රැකියාව අහිමිවන බව. එයින් තීරණයක් ගත් ලොකු ස්වාමින්වහන්සේ තරුණයා ගෙන්වා එදා පටන් මෙතෙක් එම ආයතනයෙන් ඔහු ලද වේතනයට සමාන වූ වැටුපක් මාසිකව ගෙවා එදා සිටම කැපකරු කමට පත්කරගත්තා.

ඔහු කැපකරු සේවයේ සිටි කාලය තුල සෙනසුනේ මහත් දියුණුවක් ඇති වූයේ පිරිස සමග සුහද සීලීව කටයුතු කිරීම හා පිරිසට පිනෙහි අගය කියාදීමට ඔහුතුල තිබූ දක්ෂකම නිසායි. ඒ කාලය තුල සෙනසුනේ සංවර්ධනය සියළු අතින් තව තවත් නංවන්නට ස්වාමින්වහන්සේලාට එය මහත් උපකාරයක් වුණා. නමුත් ඒ දක්‍ෂ කැපකරුතුමාද එහි රැඳී සිටියේ 2013 සිට 2015 වස් අවසානය දක්වා පමණයි. ඉන්පසුව විදේශගත වීමට අවස්ථාව ලද හෙයින් සෙනසුනෙන් බැහැරව ගියා. නමුත් හදිසි අනතුරකට භාජනයවීම නිසා එයටද මං ඇහිරුනු බව පසුව දැනගන්නට ලැබුණා. ඔහුගේ සේවා කාලය අතරතුර සිදුවූ දේ අතර,

1. මුළුතැන් ගෙය හා ඒ අවට ඉතා පිරිසිදු බවින් යුතුව තැබීම සහ දායකයින් දැනුවත් කිරීම.
2. නව සීමා මන්දිරය ගොඩනැංවීමට සම්බන්ධීකරණ කටයුතු.
3. ආනන්ද බෝධීන් වහන්සේ සඳහා ප්‍රකාරයක් බැන්දවීම සහ ඒ සඳහා තමාද ශ්‍රමයෙන් කැපවීම.

මෙවන් ක්‍රියා රැසක් ඒ කාලය තුල සිදු වූ බවත් සෑම පිංකමක්ම උසස් හා නිවැරදි ලෙස සිදු කිරීමත්, නව තරුණ පිරිස් සෙනසුනට එක්වීමත්, මේ කාලය තුල සිදුවූ විශේෂ සිදුවීමයි.

කඨින පිංකම් ලංවනවිට අපිට එක එක දේවල් හිතේ මැවෙනවා. එදා අපි කතාකලේ අපි ගිය අවුරුද්දේ සහභාගි වුණා අරණ්‍යක වස් පිංකමට. බලන්න ආසයි ස්වාමින්වහන්සේලා

පිණ්ඩපාතේ වැඩියා. මං හිතන්නේ පනස් නමකට වැඩියි. ඉතිං අපිත් ආරාධනා කරලා මෙවර පිංකම ලස්සනට කරමු.

"හොඳයි, වෙන මොනවද අපි කරන්නේ?"

"හරි මම කියන්නම්, ස්වාමින්වහන්සේලා වඩිනවානම් සර්ව රාත්‍රික පිරිතක් කියවමු."

"ඔව් ඒක ස්ථානෙටත් හොඳයි. මං හිතන්නේ අවුරුදු ගණනකින් එහෙම දෙයක් වෙලා නැතුව ඇති. මණ්ඩපයක් කුලියට ගේනවද?, හදනවද?"

"අපි මෙහෙ හදමු. ඔය මංජු මහත්තය හරිම දක්ෂයි ඕවට."

"හ්ම්, අපි කතා වුණාට බැනේ ස්වාමින් වහන්සේලාගෙන් අවසර ඕනනේ."

අපි දෙවනි ස්වාමින්වහන්සේට අදහස කීවා.

"හොඳයි ලොකු ස්වාමින්වහන්සේට කියන්න" කීවා. අපි ලොකු ස්වාමින්වහන්සේට කීවා.

"මහත්මයා හොඳ අදහස. නමුත් මේ අවුරුද්දෙ නම් නොවේ."

"ඇයි අවසර එහෙම කීවේ?"

"ස්වාමින්වහන්සේලා කොහෙද වැඩ සිටින්නෙ? ඒ නිසා කල් දමමු. දැනට පුළුවන් පමණින් පිංකම කරමු." ලොකු ස්වාමින්වහන්සේ කීවා.

නමුත් ටික කලක් යන විට දාන ශාලාව අවට නිදහස් පරිසරයේ ලොකු කුටි දෙකක් කඩිනමින් ඉදි වුණා.

"අවසර! කොහොමද මේවට බර පැන?"

"මේවා සැදැහැති මිත්‍රයෝ දෙපලක් තමයි කරන්නේ. අපේ දාන ශාලාව සාදවා පූජා කළ අයගේ යාළුවො. ලඟදි ඒවි."

"මැලේසියාවේ කොයි පළාතේද අවසර? "

"එක් අයෙක් පිනැන් කියන ලස්සන දූපතේ **චිංග් චූයි බී** සොයුරිය සහ එරික් සොයුරා. අනෙක් අය ගුරුන් කියන ප්‍රදේශයේ ටං **කිංග් ලියොන්** මිත්‍රයා තමයි මේ උදව් කලේ."

මේ කුටිද කඩිනමින් සකසා පූජා කිරීමට හැකි වූ නිසා පිංකම් අවස්ථා වලදී ආගන්තුකව වඩින මහා සඟරුවනට නවාතැන් පහසුව සපයා දීමට හැකිවීම මහත් සතුටක් වුණා. පසු කලක එම කුටි තව දුරටත් පුළුල් කර වැඩි පිරිසකට වැඩ සිටීමේ පහසුව සැලසීමට නිට්ටඹුවේ බණ්ඩාර මහත්මා සහ පිරිසක්, පැල්මඩුල්ලේ ශාන්ත මහත්මා, ලක්ෂිත, ජීවන් යන අයද මූලික වුණා. එමෙන්ම මාහේනේ ලකිත් (සුචිත්ත හිමි) සහ කටානේ සුජන්ද (සුඡන්ද හිමි) යන මේ සියළු මහත්වරුන් මෙහිලා විශාල සේවයක් කර බව ස්වාමින්වහන්සේ අපට දැන්වූවා.

**සීමා මාලකය**







වස් පින්කමට ස්වාමින්වහන්සේලා වැඩම කරනවා. විශේෂයෙන්ම අපි අමතක කරන්නේ නෑ අතිපූජනීය පහළවිටියල ජනානන්ද මහා ස්වාමින්ද්‍රයන් වහන්සේටත්, හැවැන්පැලැස්සේ චන්දවංශ ස්වාමින්වහන්සේටත් ආරාධනා කරන්නට. ස්වාමින්වහන්සේලා පින්කමට වැඩියම කුඩා ස්වාමින්වහන්සේලාගේ විශේෂ විනයකර්මයක් සිදු කරනවා. ඊට හේතුව ලොකු භික්‍ෂුන් වහන්සේලා පිරිසක් එකතු වෙන්නේ වස්පින්කම දවසට පමණක් නිසා. විනයකර්ම සිදුවෙන්නේ සීමා මාලකයක් තුළමයි. ඔබ අහල ඇතිනේ සීමා මාලක ගැන. විහාරස්ථානයක තිබෙන උසස්ම අංග විදිහට ගිහි අපි දන්නේ

චෛත්‍යරාජාණන් වහන්සේ, බෝධීන් වහන්සේ, පිළිම වහන්සේ, ධාතු මන්දිරය මේ වාගේ තැන්. එය අපිට වැදගත් වන ස්ථාන වන්දනා කරන්න, බුද්ධ උපස්ථාන කරන්න. අපි සමීපව ඇසුරුකරන තැන්.

ඒ වුණත් අපේ ස්වාමින්වහන්සේ කිවුවා සාසනික වශයෙන් බලද්දී ඉතා වැදගත් තවත් ස්ථානයක් ගැන. ඒ සීමා මාලකයයි. මම ඒ ගැන වැඩිය දැන සිටියේ නැහැ. මේ කරුණ කිවුවම තමයි මටත් ඒ ගැන දැනගන්න ඕනෑ වුණේ.

"අවසර ස්වාමීනි, ඔය සීමා මාලකය විහාරස්ථානයකට නැතිවම බැරිද?"

"මහත්මයා, එයත් අත්‍යවශ්‍ය අංගයක්. නැතුවම බැරි නැහැ. නමුත් එවන් අවස්ථාවල භික්ෂුන් වහන්සේලාගේ විනය කර්ම සඳහා සීමා මන්දිරයක් තිබෙන විහාරස්ථානයකට වඩින්න වෙනවා. හේතුව විනය කර්ම බොහොමයක්ම සිදුකරන්නේ සීමා මාලකය තුල නිසා. ඒක අපේ නීතියක් නොවෙයි අපේ ශාස්තෘන් වහන්සේ අතීතය බලල පෙර බුද්ධ සාසනවල සිදු කළ පිළිවෙතක් අනුව පැනවූ බුද්ධ නීතියක්."

"හොඳයි අවසර, ඔය සීමා මාලකයේ සිදුවෙන්නේ මොනවද?"

"මහත්මයා වැඩි විස්තර නැතිව කෙටියෙන් කියනවනම් පැවිදිවෙන්න සිටින උපාසකතුමාගේ හිසකෙස් බූ ගෑමේ සම්මුතිය ලබන එකට සාසනික වචනය **භණ්ඩු කර්මය** එතන ඉඳල තිබෙන අන් සියළු ක්‍රියා උපසම්පදාව, ඉන්පසු සිල් පිරිසිදු කිරීම්, දුසිල් භික්ෂුන් වහන්සේලාට දෙන දඬුවම් නියම කිරීම, සෑම දෙයක්ම කරන්නට පුළුවන් සීමා මන්දිරයක් තුලදී පමණයි. ඉන් පිටදී කළාට එය බලයක් නැති, හරයක් නැති දෙයක් වෙනවා."

"ඒකද අවසර, මේ අවශ්‍යතම අංගයක් කීවේ?" මම ඇහුවා.

"ඔව් ඒක තමා. ඒ නිසාම එය සාසන පැවැත්මට අවශ්‍යම දෙයක්."

"ඉතිං අවසර මේ සීමා කියල වචනයක් දුන්නේ ඇයි?"

"මහත්මයා, සීමා කියන්නේ සරලව කියනවනම් සීමා වෙච්ච ප්‍රදේශයක්. සීමිත තෝරාගත් පිරිසකට පමණක් සහභාගී විය හැකි ප්‍රදේශයක්. බාහිරයෙන් සහමුලින්ම වෙන්වූ ප්‍රදේශයක් කියන එකනේ."

"බුදුරජාණන් වහන්සේ වදාලා ආකාරයට මේක සම්මත කරගත්තම ගොඩනගා ගත්තම එය බාහිරයෙන් වෙන්වූ විශේෂ ස්ථානයක් වෙනව. විනයකර්ම අවස්ථා වල, සිල්වත් භික්ෂූන් වහන්සේලා රැස්වෙන නිසාත්, ගිහි පිංවතුන් පිංවතියන් සහභාගී නොවෙන නිසාත් සීමිත පිරිසක් සහභාගී වන ප්‍රදේශයක් වෙනවා."

මේ විදියට ලොකු ස්වාමීන්වහන්සේ විස්තර කළාට මට පුංචි සැකයක් මතු වුණා. ඇයි මම දැකල තියෙනව ගංගා වල, වැව් වල, මුහුදේ වෙරළාසන්නයේ ලස්සනට සරසල උපසම්පදා විනයකර්ම උත්සවශ්‍රීයෙන් සමරනවා. සමහරවිට කඨින චීවරය පූජා කළාම පාරුවකින් ගඟ මැදට ගිහිං මොනවදෝ පිළිවෙතකට එය ස්වාමීන්වහන්සේ නමකට පවරනවා. ඒ නිසාම මම විමසුවා.

"ස්වාමිනී අවසර, විහාරස්ථානයේ අංගයක් කීවට මම දැකල තිබෙනවා උපසම්පදා කටයුතු වෙනත් ස්ථාන වල ඒ කිච්චේ ස්ථානයෙන් පරිබාහිරවත් කරනවා."

"ඇත්ත තමයි මහත්මයා. අපේ සංඝයාත් උපසම්පදා පිංකම් වුනත් කරන්නේ අම්බලංගොඩ මාදූ ගඟේ සකසන ලද විශේෂ ස්ථානයක. ඒකත් සීමාවක් තමයි. නමුත් ඒවා තාවකාලික සීමා. ඒ වෙලාවට ඒ සඳහා පමණක් සම්මත කරගත්ත සීමා."

"ඔය සීමා වර්ග කිහිපයක්ම තියෙනවනේ. ගොඩබිමක සේනාසනයට අනුබද්ධව සම්මත කරගත්ත සීමාව එය සම්මුති

වශයෙන් ස්ථිරයි. එහෙම කිවුවේ සියල්ල අනිත්‍ය ලෝකේ ස්ථිර දේ කොයින්ද? හදන ගොඩනැගිලි ආදියත් ක්ෂණයක් පාසා වෙනස් වෙනව තමයි. නමුත් ක්‍රමානුකූලව සම්මත කළාම එය සම්බුද්ධ සාසනය පවතින තුරාම ඒ සම්මත බිම් ප්‍රදේශයේ මහා පොළව යටටත් අහස උසටත් එම සීමාවේ බලය පිහිටනවා. ජලයේ සම්මත සීමා ඒ අවස්ථාවට පමණයි බලය පවතින්නේ. ඉන්පසු අහෝසි වෙනවා. මෙතනදී ජලය කිවුවම අපි හදපු කෘතිම ජලාශයක සම්මත කරන සීමාවක් නම් බද්ධ සීමාවක්ම තමයි. ජාතස්සර සීමාවක් වන්නේ ස්වභාවික ජලාශයක, ගඟක, පොකුණක, මුහුදේ වැනි ස්ථාන වල සම්මත කරගත්ත සීමා.''



''අවසර! කතාවනම් දිගට යනව. නමුත් මේක අපිට අලුත් දෙයක්, අනුකම්පා කරලා අපිට තව විස්තර ටිකක් කියාදෙනවනම්.'' අපි එසේ ඇසුවේ ස්වාමීන්වහන්සේට විවේකය අවශ්‍ය ඇතියැයි අපි සිතූ නිසා.

''කමක් නෑ මහත්මයා අහන්න. මේවා අනිවාර්යයෙන් දැනගන්නට ඕන කරුණු.''

''එහෙනම් අවසර, සීමාවක් සම්මත කරගන්නේ කොහොමද කියල අපිට විස්තර කියල දෙනවද?''

මේ ප්‍රශ්නය අවස්ථාව ලැබුණු නිසාම ඇසුවා නෙවෙයි. අපෙත් යටි සිතේ එවන් පිංකමක සංඥාවක් මතුවෙච්චි නිසා. මං අහල තිබුණා තායිලන්තය, බුරුමය වැනි රටවල ඉස්මුදුනින් පිළිගන්නා සසුනේ වැදගත්ම පූජනීයම තැන සීමාව කියල. ඒ නිසා ඒ අය සීමාවක් හදනවනම් අපි චෛත්‍යක් හදනකොට වගේ සියළු සේසතම ජීවිතයම වුණත් දෙන්න කැමතියි කියල.

අපේ කතාව අතරේ ස්වාමින්වහන්සේට ගිලන්පස පිළිගැන්වූවා. ගිලන්පස වැළඳූ ස්වාමින්වහන්සේ නැවතත් සීමාවක් සම්මත කරන අයුරු පැහැදිලි කළා. මට දැනුන විදියට එය මෙසේය.

"මහත්මයා, මේක ඉතාමත් වැදගත් භාරදූර කාරණයක්. වගකීමෙන් කරන්න ඕන දෙයක්. අහස උසට ගොඩනැගිල්ලක් හදනකොට පොළව යටට උමගක් හදනකොට කොච්චර හිතන්න ඕනද? ඉතා කුඩා සියුම් දේ පවා මුලු ගොඩනැගිල්ල විනාශ කරන්න හේතු වෙනවා."

"ඒ වගේම අහස උසට, පොළව යටට අසීමිත වූ මේ බිම් ප්‍රදේශය සම්මත කිරීම මුලින්ම හොඳ අවධානයෙන් සිහියෙන් ගුරු උපදේශ ලබමින්ම කළයුතු දෙයක්."

"ඉස්සෙල්ලම බිම තෝරා ගැනීම, අපේ ගුරු දෙවෝත්තම පා අවුක් සියාඩෝ (බුරුම රටේ මහා නායක හිමියන්) කියා දුන්න විදියටනම් සෙනසුනේ උසම තැන තෝරාගන්නට ඕන. ඊට ගෞරවයක් වශයෙන් ඊළඟට ඒ ප්‍රදේශයේ ප්‍රමාණය භික්ෂූන් වහන්සේලා 21 නමකට හෝ ඊට වැඩියෙන් අත්පසේ ඉඳගන්නට අත්පස කිච්චේ ඇහේ ගැවෙන නොගැවෙන මට්ටමට වැඩසිටින්නට ඉඩ තිබෙන්නත් ඕන. එම ප්‍රදේශය හඳුනාගැනීමට ඒ අවට කොන් අටකින් සුදුසු සංඥා තිබෙන්නටත් ඕන. අපි ඒවට කියන්නේ "**සීමා නිමිති**" කියල. ඉස්සරකාලේ ස්වාභාවික නිමිති යොදාගන්නේ, ඔය කල් පවතින අරටු සහිත ගස්, නොසිඳෙන ජලාශ, ගංගා, ඇළ දොළ, හුඹස්, පර්වත වගේ දේවල්. දැන්නම් ඒ සඳහා අටකොනට සකස් කළ ගල් කණු යොදා ගන්නවා. ඒවා මහා උසට නොතිබුනාට,

ලස්සන කැටයම් නොතිබුනාට කමක් නෑ. සමහරු ගෞරවයට කැටයම් කොටනවා. ''



"හකුරු පියන් දෙකක උස ඒ කියන්නේ වියත් දෙකක උස තිබුනම ඇති. කොන් අටටම ඕන."

"ඊළඟට තියෙන්නේ බිම සම්මත කරගන්න එක, නමුත් මෙතනදී එකක් මතක තියාගන්න ඕන තේරුණාද?"

අපෙන් ඇසුවේ මං හිතන්නේ දිගටම විස්තර කරද්දී අපේ අවධානය තිබේද බලන්න වෙන්න ඇති. ඇත්තටම ඒක හොඳයි. අපිත් ඉතිං හිටි ගමන් මනෝ පාරටත් යනවනේ අපි අහගෙන ඉන්නෙ බව කියන්න "එහෙමයි අවසර, තේරුණා." කියල පිළිතුරු දුන්නා.

(ස්වාමින්වහන්සේ කියාදුන් තොරතුරු සංක්ෂිප්ත සටහනක ගත්විට මගේ දැනුමේ ප්‍රමාණයට මෙසේයි. මේ කරුණු වල යම් යම් අඩුපාඩු තිබීමට හැකි නමුත් ගිහි ජීවිතය ගතකරන අයට මේ දැනුම ප්‍රමාණවත්. පුළුල් විස්තරයක් අවශ්‍යනම් විනයධර භික්ෂූන් වහන්සේ නමක් හමුවී කතා කරන්න.)

# සීමා

1. බද්ධ සීමා - සුපරිශුද්ධ ලෙස සම්මත කල සීමාවයි. ඒ සඳහා,
    1. චතුවර්ගික භික්ෂුන් හෙවත් අවම වශයෙන් භික්ෂූන් 4 නමක් විසින්
    2. එකොලොස් විපත් නැතිව
    3. සම්පත්ති තුනට අනුව සම්මත කලයුතුය.

    a. මහා සීමා හෙවත් සමාන සංවාස සීමා - බෙදී වෙන්වූ සංඝයා වහන්සේලා නැවත එක්වීම පිණිස අනුදැනවදාල සිමාවයි. මෙය උපරිම යොදුන් තුනක් දක්වා විශාල විය හැකි සිමාවයි.
    b. ඛණ්ඩ සීමා - මහා සීමාව තුළ සම්මත කරන කුඩා සීමා. කුඩාම සීමාව භික්ෂූන් වහන්සේලා 21ක් නමකට ලඟින් ලඟින් (අත්පස) ඉඳගැනීමට (වැඩසිටීමට) ඉඩතිබිය යුතුය.
    c. තිචීවර අවිප්පවාස සීමා - උපසපන් භික්ෂූන් වහන්සේ විසින් අරුණ උදාවන කල්හි තුන්සිවුර ලඟ තබාගත යුතුය. එය බුදුරජාණන්වහන්සේ පැනවූ සික පදයකි. නමුත් මෙම සීමාවක් තුල වැඩසිටිනවිට එම සිකපදය අදාල නොවේ.

2. අබද්ධ සීමා - තාවකාලිකව සම්මත කරන සීමා
    a. ගාම සීමා- කිසියම් ග්‍රාම භෝජකයකුට අයිති ප්‍රදේශයයි.
        i. නගර සීමා - නගරය සීමා කරගෙන ඇති ප්‍රදේශයයි
        ii. නිගම සීමා - නියං ගමකට අයත් වන කුඩා ගමයි
        iii. විසුංගාම සීමා - නීත්‍යානුකූලව සාදන අලුත් ගමයි
    b. උදකුක්ඛේප සීමා -
        i. නදී සීමා - නදියක සම්මත කරගන්නා ලද සීමාව
        ii. ජාතස්සර සීමා - ජලාශවල සම්මත කරගන්නා ලද සීමාව
        iii. සමුද්ද සීමා - මුහුදේ සම්මත කරගන්නා ලද සීමාව
    c. සත්තබ්බන්තර සීමා - විශාල වනාන්තරවල සම්මත කරගන්නා ලද සීමාව

අයෙමත් කතාව පටන් ගත්තා. “අවධානය තියෙන්නට ඕනෑ කරුණු වලින්, ප්‍රමාණය ගැන කිවුවනේ. ඊළඟට මේක සම්මත කරන්නේ කවුද? ගිහි අයට මේක කරන්න බෑ. පිරිසිදු, සිල් නොකැඩුණු භික්ෂූන් වහන්සේලා හතරනමක් හෝ වැඩියෙන් අවශ්‍ය වෙනවා. ඒ විතරක් නෙමෙයි. නොගැලපෙන කරුණු එකොළහක් (11) තියෙනව මගහරින්න. ඔය ප්‍රමාණය ගැන, නිමිති ගැන, සම්මත කරන ස්ථානය ගැන, සම්මත කරන පිළිවෙල ගැන. පොතකින් බලාගන්නකෝ මහත්තයලා ඔක්කොම විස්තර දැන් ඕන නැනෙ. ඒ නොගැළපෙන කරුණු අතහැරලා ඊළඟට විශේෂයෙන් කරන්න ඕන ලඟපාත ස්ථානයකට අදාළ සීමාවක් ඇතොත් එයින් වෙන් කිරීමට පරතරයක් තැබීම. අපි ඒකට කියන්නේ උපචාරයක් තියෙනවා කියල. මහත්මයලට තේරුණාද?”

අයෙත් ඒ අවධාරන ප්‍රශ්නය ඇහුවා. ඇත්තටම අපට තේරුණේ නෑ. අපි කිවුවා,

“නැහැ අවසර, ඒ කිවුවේ කුමක්ද?”

“ඔව්, මම දැනගත්තා තේරුණේ නෑ කියලා ඔය ඇස් රවුම් වෙනකොට, නළලෙ රැලි වැටෙනකොට. හොඳයි මෙහෙම හිතන්නකෝ ඉඩම් මනිනකොට රිසිවේෂන් (RESERVATION) එක කියල ඉඩම් දෙකක් අතර පරතරයක් තියෙනවා නේද? ඒක එක ඉඩමකටවත් අයිති නැහැ. හිස් අවකාශයක් වගේ. එයම තමයි උපචාරය කියන්නේ. ඔය පන්සලේ ආරණ්‍යයේ සීමාවේ පිටපැත්තේ ගල්පේළි 2ක් තියෙන්නේ වටේටම.”

“ඒ අතර අඩි 3ක විතර පරතරයක් ඇති. ඒක තමයි **උපචාරය.** එහෙම කරන්නේ එතන අද සීමාවන් නැතිවෙන්න පුළුවන්, කැලයක් වෙන්න පුළුවන් නමුත් ඉස්සර කොයි කාලෙක හරි අසල විහාරස්ථානයක් තිබිල සීමාවක් සම්මත කළා නම් එහි බලය තාම තිබෙනවා. එය වෙන් කරන්න තමයි ඒ ඉඩ තිබ්බේ. එහෙම කරල නිමිති කීර්තනය කරනවා කියල එකක් කරනවා. ඒ කියන්නේ අර සංඥා ලකුණ එකකින් පටන් ගෙන දායක ඇත්තන්ගෙන් අහනවා මෙතන නිමිත්ත කුමක්ද? දායකයෝ කියනවා මේ තියෙන්නෙ මෙතන නිමිත්ත. ඊළඟට

ඊළඟ එකට යනවා. එහෙම නොවැරදී එකින් එකට අහමින් ගිහිං අටවෙනි එකින් පසු නැවත පළවෙනි එක අහනවා. මේක මාරු කරන්නත් බෑ. පිළිවෙලට එකින් එක එක ළඟ නිමිති අහමින් අටටත් අටෙන් පසු එකටත් යා යුතුයි. හරියට ලකුණෙන් ලකුණ ආරක්ෂා වැටක් බැන්දා වගේ.”



“මට කියන්න අමතක වුණා. මේ වෙනකොට මහත්මයා අසල්වාසී විහාරස්ථාන වලට දැනුම් දීල කැමැත්ත ගැනීම කළ යුතුයි. එසේම ඒ කාලය ඒ ප්‍රදේශයේ හරහා කොහෙවත් වැඩීම නොකරන ලෙස ඉල්ලා සිටිය යුතුයි. එපමණක් නොව, ප්‍රදේශයට ඇතුල් වන සෑම පාරකම ඇතුළුවන පිටවන තැන් වල දායක පිරිස රැඳී සිට එසේ ගමන් කරන භික්ෂූන් දැනුවත් කළ යුතුයි.”

“ඒ කරුණු සියල්ල සම්පූර්ණනම් ඊළඟට කරන්නේ සීමා උද්ධරණය, ඒ කිවුවේ භික්ෂූන් වහන්සේලා එකතුවෙලා තෝරාගත් ප්‍රදේශය තුළ සිට බුදුරජාණන්වහන්සේ වදාළ වාක්‍යයක් සජ්ඣායනා කරනවා. එවිට එතන පැරණි, අති පැරණි සීමාවක් තිබුනත් අහෝසි වෙනවා. ඉන්පසු ළඟින් ළඟින් ඉඳගෙන පෙරසේම බුදුරජාණන්වහන්සේ වදාලා වාක්‍යයක් සජ්ඣායනා කර සම්මත කරගන්නවා.”

"දැන් මෙය හරියටම කළා නම් මෙය මේ මහා පොළව තිබෙන තුරු පවතින සීමාවක් වෙනවා. මොනවහරි තැනකින් පොඩ්ඩක් හරි වැරදුනොත් එය සීමාවක් වෙන්නේ නෑ. මෙය තුල තමයි මම මුලදී කී සියළුම විනයකර්ම කරන්නේ. තේරුණා නේද? මෙය සම්මත කරල ගොඩනැගිල්ල හදන්න පුළුවන්. හදල සම්මත කරන්නත් පුළුවන්."

**මේ පැහැදිලිකර දුන් කරුණු අනුව අපට පෙනී ගියේ සීමාව සසුනේ කොතරම් වටිනා තැනක්ද? නමුත් අද එය අපි දන්නේ නෑ කියන්නේ කොයි තරමට දහමින් ඈත් වෙලාද?** ඇත්තටම මේ දැක්වුයේ ඉතා සුළු කරුණු කොටසක් පමණයි. මෙය මීට වැඩි ඉතා සංකීර්ණ දෙයක්. කිසිත් නොදත් අපිට මේ ටිකත් වටිනවා. හේතුව මේවා හරියට තිබුනොත් භික්ෂූන් වහන්සේත් රැකෙනවා, භික්ෂූන් වහන්සේ රැකුනොත් සාසනයත් රැකෙනවා.

එදා දවසේ සාකච්ඡාව පැය ගණනකට පසු නිමා වුණා. අපි ගෙදර ගියේ වෙනදට වඩා බොහෝ රෑ වෙලා. නමුත් වෙනසක් නෑ. නින්දට ගියාට නින්ද යන්නෙත් නෑ. ඇයි? මගේ හිත වැඩ කලේ සීමාවක් හදල පූජා කරන්නට නමුත් මට මේ අවස්ථාවේ තිබෙන ප්‍රශ්නත් එක්ක, හිතනවා මිස කරන්නට පුළුවන් කමක් කිසිසේත්ම ඇත්තේ නෑ. ඒ මදිවට කැපකරු හැමතිස්සෙම කියන්නෙත් සීමාවේ වටිනාකම.

අපිට දින කිහිපයක්ම සන්ධ්‍යාවේ සෙනසුනට එන්න බැරි වුණා. චූටි මහත්තයානම් ලඟපාත නිසා දිනපතාම පැමිණියා. ඒත් දවසක හදිස්සියේම මට දුරකථන පණිවිඩයක් ලැබුනා. ඒ ලොකු ස්වාමින්වහන්සේගෙන්.

"මහත්මයා අපි තවත් වැඩකට මුල්ගල් තබනවා. හෙට උදේ එන්න." කියා.

පසුදින පැමිණෙනවිට ශාන්තිරත්න මහත්මා, වෛද්‍ය සුමනා විමලරත්න මහත්මිය, චූටි මහත්මා සැවොම රැස්වී සිටියා. ස්වාමින්වහන්සේ පෙර දිනක කී ලෙසටම සෙනසුනේ උසම තැන තිබූ ගරාවැටුණු කුටිය ඉවත් කර පිරිසිදු කර තිබුණා. නුලක්

සහ මිටියක් අත ඇතිව මංජු මහතා සහ පිරිස සිටියා. මම තේරුම් ගත්තා මගේ සිහිනය සැබෑ වෙච්ච බව. සුදුසු වෙලාව එනතුරු කවුරුත් බලා සිටියා. ලොකු ස්වාමින්වහන්සේ ඒ කාලයෙන් ප්‍රයෝජනය ගෙන මෙසේ කීවා.

"මහත්මයා මේක අපි මේ කරන්නේ ශාසනයට උපකාරයක් වගේම ගුරු උපහාරයක්. ඇයිද දන්නවද? පූජනීය විටියල ස්වාමින්වහන්සේ, පූජනීය හැවැන්පැලැස්සේ ලොකු ස්වාමින්වහන්සේ එපමණක් නොව පූජ්‍ය නාඋයනේ ස්වාමින්වහන්සේත් කීපවිටක්ම කීවා සෙනසුනේ මැද හරියේ සීමාවක් තිබුනොත් හොඳයි කියා. ඊට හේතුව දැනට ඇති සම්මත සීමාව ගොඩක් දුරයි. වැහිකාලෙට, රාත්‍රියට යන්න බෑ. වයෝවෘද්ධ ස්වාමින්වහන්සේ නමකටනම් කොහොමවත් වඩින්න බෑ. ඒ නිසා මම කල්පනා කළා කොහොමද මේක කරන්නේ කියල."

"දවසක් අපේ දොස්තර අම්මා (එහෙම කියන්නේ වෛද්‍යාචාරිනී සුමනා මහත්මියට) පැමිණ තවත් මැණි කෙනෙක් එක්ක මට කීවා. අපේ මේ නංගි කැමතියි කුටියක් හදල පූජා කරන්න. පියතුමාට පිං අනුමෝදන් කරන්නත් එක්ක." මම සාමාන්‍ය කුටියට යන වියදම මෙතෙක් හැදූ කුටි වල වියදම අනුව කීවා. ඒ අනුව රුපියල් ලක්ෂ අටක වියදමක් දරන්න හැකි බව ඇය ප්‍රකාශ කළා. ඒ උපකාර කළ මැණියන්ටත් මග සැලසූ දොස්තර අම්මාටත් වඩාත් පිං අනුමෝදන් වෙන්න ඒ මුදලින් තමයි මේ ආරම්භ කලේ. සීමාවක අවශ්‍යතාවය තියෙනවා. මෙවන් තැනක ඉදිකිරීම් වලට විශාල මුදලක් වැය වෙනවා. කෙසේ නමුත් මෙයින් අපිට අඩකට වැඩිය වැඩ කරගන්න පුළුවන් වෙයි. ඉතිරිය ඊළඟ පියවරේදීනේ." ස්වාමින්වහන්සේ කිවුවා. සුබ වෙලාව එළඹී තිබූ බැවින් කවුරුත් ලං වුණා. ස්වාමින්වහන්සේ සෙත් පිරිත් සජ්ඣායනා කළා. සුබ මොහොතින් වැඩ ඇරඹුනා. දිනපතාම රාත්‍රියේ අඛණ්ඩව එම ස්ථානේ සෙත් පිරිත් සජ්ඣායනා කළ බව ස්වාමින්වහන්සේ හමුවීමට පැමිණි අපට දැනගන්න ලැබුණා. එදා පටන් දිනපතාම එහි ඉදිකිරීම් සිදු වුණා.

මේ දුෂ්කර ස්ථානයට කොන්ක්‍රීට් පාර සකස් කිරීමට බලතව සමීර මහත්මා ශ්‍රමයෙන් බොහෝ උපකාර වුණා. යක්කල සමන් ට්‍රේඩර්ස් අධිපති සැදැහැති සමන් එදිරිසිංහ ගරු උපභාණ්ඩාගාරිකතුමා තම සේවක පිරිස සමග ශ්‍රමයෙන් ධනයෙන් දෙකෙන්ම උපකාර කළා. ගල් වැලි සිමෙන්ති ඇදීමේ පහසුව පිණිස නිට්ටඹුවේ සේනාධීර මහත්මා විසින් මොටර් සයිකලයක් පූජා කළා. බොහෝ දෙනාගේ ශ්‍රම පරිත්‍යාගය ලැබුණා. ඒ පිරිස අතර,

1. මෙනේරිපිටියේ පාසල් දරුවන් පිරිස
2. නිට්ටඹුවේ සේනාධීර මහත්මා සහ මිතුරු පිරිස
3. කටානේ විජේසිරි මහත්මා ඇතුලු පිරිස
4. කටානේ අශේන් මහත්මා ඇතුලු පිරිස

බොහෝ සෙයින් උපකාර වුණා. අඛණ්ඩව ඉදිකිරීම් සිදුවූ අතර ඉතිරි බරපැන ලබාගැනීමට එවකට සිටි කැපකරු තිලිණ මහත්මාගේ උපකාරය ඉමහත් රුකුලක් වුණා.ඒ අනුව සීමාවේ අගය දායක පිංවතුන්ට දන්වා අවශ්‍ය ආධාර ශක්ති ප්‍රමාණයෙන් පරිත්‍යා කරන්න දිරි ගැන්නුවා. දාන දායක පිරිස අතර කඩුවෙල තරිඳු මහත්මා සහ මිත්‍ර පිරිස මහත් වු පරිත්‍යාග සිදු කළා. තව දුරටත් සම්මත කිරීමේ මහා පිංකම් කටයුතු ඒ අය විසින් මුලිකව සිදු කිරීමට බලාපොරොත්තුව සිටිනවා.

ඒ අනුව තව දුරටත් අත්‍යවශ්‍ය වූ විහාර අංගයක් සම්පූර්ණ කිරීමට 2014 කයීන මහා පිංකම වන විට හැකියාව ලැබුණා. උදවු කළ සැමට මේ කුසලය නිවන් පිණිස හේතුවේවා!

## ලක්දිව ප්‍රථම සීමා සම්මතය

සීමා සම්මතය ගැන කියන්නට පෙර ලක්දිවට සදහම් ප්‍රතිලාභය සිදුවූ අයුරු සිහිපත්කිරීම වඩාත් උචිතයයි මම සිතමි. ඒ කිමැයිද යත්, තේරුම් ගැනීමේ පහසුව උදෙසාමයි.

පොසොන් පුර පොහෝ දිනක මිහිඳු මහරහතන් වහනසේ වැඩියා ඔබට මතකයි. මුව කෙළියේ විනෝද වෙමින් සිටි තිස්ස රජු සදහමට පැහැදුනේ රජවාසලේ දහම් දෙසන්නට

ආරධානා කලේ, රටවැසියන් පිරෙනවිට වාසල ඉඩ නොමැතිව අත්හල සරසවා දහම් දෙසුමට රජු සියල්ල සැකසුවේ, අනුලාදේවිය අගබිසව ඇතුළු 500ක් පිරිස සකදාගාමීව නිවන් ප්‍රත්‍යක්ෂ කළේ ආදීවූ කාරණා රැසක් සිදුවූ අයුරු දැන් දැන් සිතට නැගෙනවා ඇති. එදින දේශනා අවසැන මිහිඳු මහ රහතන් වහන්සේ මිස්සක පව්වට වඩින්නට සූදානම් වුණා. රජ උයන නන්දන වනය ශබ්ද වැඩිනිසා නිසල පරිසරයක් වූ සිසිල් පැන් පොකුණින් පිරි මහාමේඝ වනයේ වැඩසිටින්නට ආරාධනා කළා. එය පිළිගත් මිහිඳු මහරහතන් වහන්සේ එදින එහි වැඩසිටියා.

පසුදින පැමිණි රජු විවේක සුවය විමසූවිට බොහොම විවේකයැයි පවසා වේළුවන පූජාව දේශනාකොට ආනිසංස පහදා දුන්නා. රජපිරිස සමඟ මහාමේඝ උයනේ වඩින මිහිඳු මහ රහතන් වහන්සේ තැනතැන මල් පුදමින් පැන් ඉසීමත් වන්දනා කිරීමත් සිදුකළ අතර ඒ ඒ තැන්වල භූමි චලනද සිදුවුණා. මේ ආශ්චර්යය කුමක්දැයි විමතියට පත් රජු මහරහතන් වහන්සේගෙන් විමසා සිටියා. එවිට එම ස්ථානවල පෙර බුදුරජාණන් වහන්සේලා වැඩසිටි බවත් මතු ඒ තැන්වල චෛතිය ඉදිවන බවත් සැළ කළා. තිස්ස රජු එය කරවන්නට කැමැත්ත ප්‍රකාශ කළ විට මිහිඳු මහරහතන් වහන්සේ සඳහන් කලේ "මහ රජතුමනි, ඔබට කරන්නට තවත් බොහෝ දෑ ඇත. මාගේ ශාස්තෘ වූ සම්බුදු පියාණන් වහන්සේ වදාළේ ඔබගේ මුණුපුරකු වන ගාමිණී අභය රජු මෙය කරවන බවයි" එය ඇසූ තිස්ස රජු එකරුණ ලියා ශිලා ස්ථම්භයක් කරවූවා. දින ගණනක් පුරා දහම් දෙසමින් බොහෝ සැදැහැතියනට මග ඵල මතුකරවූවා.

දිනක් රජු මිහිඳු මහරහතන් වහන්සේ වැඩසිටි මහාමේඝයේ තිස්සාරාමයට පැමිණ "ස්වාමීන් වහන්ස, දැන් බොහෝදෙනා මේ උතුම් ධර්මයේ රසය වින්දනය කරනවා. දැන් ඉතිං මේ ලක්දිවෙත් ඒ උතුම් සම්බුදුසසුන පිහිටියා නොවේද?" එවිට මිහිඳු හිමි පැවසුවේ, "නැත මහරජතුමනි, බුදුසසුන පිහිටන්නට නම් තවත් කරුණු කිහිපයක් සම්පූර්ණ විය යුතුයි. ඉන් පළමු කරුණ නම් සීමාවක් තුළ පොහොය ආදී විනයකර්ම කරන තුරා සසුන ප්‍රතිෂ්ඨාපනය නොවෙයි" ඒ අනුව රජුගේ මූලිකත්වයෙන් සහ මිහිඳු හිමිගේ අනුසාසකත්වයෙන් සීමාවක් සම්මත කරන්නට කටයුතු සම්පාදනය කළා.

මහ රජුගේ අණ පරිදි ඇතුළුනුවරත් පිට නුවරත් මනාසේ අලංකාරකොට සියළු රටවැසියන් දැනුවත් කරනු පිණිස අඬබෙර කරුවන් (පණිවුඩ කරුවන්) යොමු කළා. නියමිත දින සියළු ආකාරයෙන් රථ සරසා, මැති ඇමතිවරුන්ද බලසේනාවද වාහනද සහිතව සපිරිවරින් සියළු සත්කාර කොට තෙරුන් වහන්සේ වෙත එළඹ ඉමහත් ගෞරවයෙන් වන්දනා කර ආරාධනා කළා.

ඉන්පසු මිහිඳු මහ රහතන්වහන්සේ කදම්බ නදියේ (මල්අතු ඔය) තොට අසල සිට සීමා ලකුණු කරන්නට ආරම්භ කරන ලෙස රජුට අනුශාසනා කළා. මහපිනැති මහරජතුමා ඒ සඳහා ස්වර්ණමය වූ විශේෂ නගුලක් සූදානම්කර තිබුණා. නගුලට යොදාතිබුණේ මහා බලසම්පන්නවූ ජව සම්පන්න වූ පදුම සහ කුඤ්ජර යන මංගල හස්ථිරාජයන් දෙදෙනායි.

මිහිඳු මහරහතන්වහන්සේද, මහරජතුමාද, ක්ෂත්‍රිය පිරිසද, බලසේනාවද, සපිරිවරින් සීමාව දක්වමින් ගමන් කළා. මෙය සිදුවන උතුම් අවස්ථාව මහත් විසිතුරු ආකාරයෙන් සූදානම්කර තිබුණා. රජ මැති ඇමති බලසෙන් සේම, සමසේ අලංකෘත පූර්ණ ඝටයෝද, විවිධ විසිතුරු ධජ පතාකයෝද, චන්දන කල්කයෙන් පිරි පාත්‍රයෝද, ස්වර්ණ රජත යෂ්ඨිහුද, පුෂ්ප දාම පුෂ්ප සැරසිලි, රඹ ඡත්‍ර ආදීන් සහිත සුරූපී ස්ත්‍රීහුද, පිරිවරකොට සිටියහ. තවද නානාවිධ තූර්ය සහිත සංගීත මඩුලුවල මියුරුවූ රාවයද, දෙසවන් විනිවිද යන මනරම්වූ ප්‍රශස්ති ගී ගායනාවන්ද දස දිසාවනට පැතිර ගියෝය. රැස්වසිටි සැදැහැති ජනතාවගෙන් නැගුනු සාදු නාදය දසත නින්නාද විය. මේ අයුරින් කිසිකලෙකත් නොවූවිරූ සියල්ල සපිරි මහා පූජාවක්, සීමා නිර්ණය කරන මොහොතේ සිදුවිය.

සීමා ලකුණු කිරීම කදම්බ නදීතොටෙන් පටන්ගෙන නුවර විහාරය ඇතුළුව නැවත නදී තොටින්ම අවසන්විය. එහි සීමා සලකුණු ලෙස නදී, පාසාන, තොටුපල, කඳුගැට, ගස් සහ ස්වභාවික වළවල් යොදා ගැනිණ. (එය මහා වංශයේ සඳහන් ලෙසට මෙසේය. විජයාරාම උයන, ගජකුම්බ පාසාණය, අභය බලාක පාසාණ, මහා සුසාන පාසාණ, දීඝ පාසාණ, කම්මාරක ගාම .......ආදී වශයෙන්)

මෙසේ ලකුණු කර සීමා නිමිති සටන කාලයේ ලක්දිව බුදුසසුන ප්‍රතිෂ්ඨාපනය වූවා කියා දෙවිමිනුසුන් සැම සාදුනාද පැවැත්වූවා. මිහිඳු මහ තෙරුන් වහන්සේ විසින් නිමිති කීර්තනය කළසේක්, සීමා සම්මත වූයේ සම්බුදු සසුන ලක්මවට හිමියැයැ කියාපාන්නක් සේ මහා පෘථුවියද චලනය වී සනාථ කළා.

මේ ලක්දිව ප්‍රථම සීමාව සම්බුදු සසුනේ මුදුන් මුල සීලයේ බලකොටුව අනුරපුර මහමෙව්නා උයනේ ප්‍රතිෂ්ඨාපනය කිරීම පිළිබඳ මහා වංශයේ, සඳහන්වන තොරතුරුවල සංක්ෂිප්ත සටහනකි.

## 2014 කඨින පිංකම

පිංකම ලස්සනට සංවිධානය වුණා. සමන් ට්‍රේඩර්ස් අධිපති සමන් එදිරිසිංහ මහතා මුලික බර පැන ඉසිලුවා. මේ පිංකමේ මුලික බරපැන උසුලන තුන්වන වාරයයි. මෙතුමාගේ සහ එම මැතිණියගේ විශේෂත්වය නම් අපරිමිතවූ පරිත්‍යාගශීලීත්වයයි. වස් ආරාධනාව ස්වාමීන්වහන්සේලාට කළ දින පටන් නිතර පැමිණ සොයාබැලීම, අවශ්‍යතා සැපයීම, සතියකට වරක් රු.10,000 ක මුදලක් සේනාසන කටයුතු සඳහා ලබාදීම සෙනසුනේ කිසිවකුගේ ඉල්ලීමකින් හෝ දැනුම්දීමකින් තොරව සවකීය සන්තානයේ මතුවූ පරිත්‍යාග චේතනාව නිසාම සිදුකරනවා. එනිසා ඒ කාලය තුල සෙනසුනේ නඩත්තු කටයුතු පිළිසකර කිරීම් ඉතා පහසුවී වස්අවසන පිංකම විසිතුරු වෙනවා.

ඒ අතර සෙනසුනට ප්‍රධාන පාරේ සිට කැලය මැදින් පිවිසෙන මාර්ගය සම්පූර්ණයෙන් කැඩී බිඳී ගල් ගැලවී වාහනයක් තබා පාගමනින්වත් යා නොහැකිව තිබුණා. එය පෞද්ගලික පාරක් නොවීමත් ප්‍රාදේශීය සභාවට අයත් වීමත් නිසා එහි පිළිසකර කටයුතුවලට කිසිවකු යොමුවූයේ නැහැ.





මේ වන විට කඨින මහා පිංකමට සියල්ල සූදානම් වී තිබුණා. මෙවර කඨින පිංකමේ විශේෂ පූජා අතර, නව සීමා මන්දිරය සඟසතුකොට පූජාකිරීමට එහි මූලික බරපැන යෙදවූ වෛද්‍යාචාරිනී සුමනා මහත්මියගේ ඥාති සොයුරියත්, කඩුවෙල තරිඳු මහත්මා ඇතුලු පිරිසත් ඉතා සතුටුව බලාපොරොත්තුව සිටියා. ඉහත දැක්වූ පරිදි ඒ දුෂ්කර කාර්යයේදී ශ්‍රම පරිත්‍යාග කළ ලොකු කුඩා සැමද බලාසිටියා.

ඒ පමණක් නොව ඒ මහා පිංකමට සමගාමීව විදුලි ඉංජිනේරු රෝහණ රිදීගම්මන මහත්මා සහ පිරිස සර්වඥධාතූන්

වහන්සේලා, රන් පැහැ කරඬුවක් සමග පූජා කරන්නට යෙදී තිබුණා.



මේ සියළු පූජාවන් නිසා මෙවර බොහෝ මහා සංඝරත්නයද වැඩම කරගැනීමට ආරාධනා කර තිබුණා. සියල්ල එසේ නමුත් පාර අබලන් කම සැමගේ සිතට මදිකමක්. වහා ක්‍රියාත්මක වූ බුලත්සිංහල නන්දසිරි පෙරේරා මහත්මා එම මාවත පිළිසකර කිරීමේ කටයුත්ත භාරගත් අතර, එවකට සිටි මහාමාර්ග නියෝජ්‍ය අමාත්‍ය ගරු නිර්මල කොතලාවල මහතාගේ කාරුණික සහයෝගයත් එම මහඟු පිංකම ලස්සන කරන්නට මහත් උපකාරයක් වුණා.

මේ සියල්ල සම්පූර්ණ වෙද්දී වර්තමාන මහෝපාධ්‍ය අති පූජනීය පහළවිටියල ජනානන්ද මාහිමිපාණන් වහන්සේ සහ නාඵගන ආරණ්‍ය සේනාසනාධිපති අතිපූජනීය හැවැන්පැලැස්සේ චන්ද්‍රවංස ස්වාමින්වහන්සේලාගේ අනුසාසනා පරිදි පිංකම සිදු වුණා.




02/11/2014

## සාදු සාදු වඳිනෙමු........

*සුර ,නර ,නා , ඔබුන් පුදන . තිලොවග සමිඳු,*
*දෙලොවම සනසා නිවනට මං පෙත් සැදූ,*
*සිත් සැදැහැ මලින් පුරවා ගුණ සුවඳින් සෝදා,*
*සාදු සාදු නමදිමු සම්බුදු හිමි ධාතු.*

*කකුසඳ කෝනාගම කාශ්‍යප මුනි සිටි පෙර,*
*සාක්‍ය සීහ ගෝතම ත්‍රයිලෝක ශිවංකර,*
*මේ මහා භද්‍රකල්පයෙ වැඩසිටි ඒ මුනිවර,*
*සාදු සාදු නමදිමු බැතියෙන් අපි සිහිකර.*

*සතර අත නීතර පෙනෙනා දෙනයන පිනවන,*
*අහස් ගැබ සිසාරා සුදු පැහැයෙන් විහිදුන,*
*සම්බුද්ධ රාජ ශ්‍රී .ගෞතම සමිඳුන් සිහිවන,*
*සාදු සාදු වඳිනෙමු චෛතිය දැන බුදුගුණ.*

## ආනන්ද බෝධි රෝපණය

"දේවයන් වහන්ස! හස්ථිරාජයා මින් ඔබ්බට යන්නට කැමැත්තක් නෑ."

"සේවකය! එසේ නොකියන්න. මා මේ ගමන යා යුතුමයි. හස්ථි රාජයාට අණකරන්න".

සක්විති රජුගේ ආජානීය හස්ථි රාජයා පිට රජු සපිරිවරින් ගමනක යෙදුණා. එක් තැනකදී හස්ථියා නතර වුණා, හස්ථියා මෙහෙයවන්නා රජුට සැල කළා. නමුත් ගමන යා යුතුමයි. ඒ නිසා උත්සහ කරන්නට රජු ප්‍රකාශ කළා.

ඉතාමත් හීලෑ මේ හස්ථි රාජයාට තව දුරටත් අණ කරනවිට හිමින් සීරුවේ අහසෙන් බිමට පහත් වුණා. වටපිට බැලූ රජු ඇතුළු පිරිස මවිත කරවන දසුනක්.

"පුරෝහිත මේ බලන්න, මේක අපූරු දසුනක්. මා නම් මෙවැන්නක් මීටපෙර දැක නෑ. පුරෝහිත බලන්න මේ වන පියස මැද බොහොමත් පිරිසිදු භූමි ප්‍රදේශයක්. කදිමයි නේද? කිසිවකු නැති, ජන ශූන්‍ය මෙහි කවුරුන්ද මෙසේ පිරිසිදු කරන්නේ?"

"දේවයන් වහන්ස! එය අරුමයක් නොවේමැයි බලනු මැනවි වටපිටාවේ ඇති සුන්දර තුරු ලතාවන් සියල්ල මේ භූමි භාග්‍ය දෙස බලා නමස්කාර කරන අයුරු."

"සැබෑමයි පුරෝහිත, ඒ කවර හේතුවක්ද? දේවයන් වහන්ස, මේ මහා පිං බිමක්, ආශ්චර්යමත් භූමි භාගයක්, මේ මිහිතලය මත මෙවන් භූමියක් තවත් කොතැනකවත් ඇත්තෙ නෑ. ඒ අපේ ශාස්ත්‍රයේ සඳහන් අයුරුයි. "

"පුරෝහිතෙ! මටනම් මෙය කිසිසේත් වටහාගනු නොහැකියි. මට නොඟසවා පවසන්න. කවරනම් හේතුවක් නිසා මෙය ශ්‍රේෂ්ඨ වන්නේද? අසම වූ ආශ්චර්ය භූමියක් වන්නේද?"

"දේවයන් වහන්ස! සවකීය ඥාණයෙන් සහ වීර්යයෙන් මෙලොව ජයගන්නෝ අති දුර්ලභය. සියළු රසයට උතුම්වූ සියළු සුවයට උතුම්වූ ඒ විමුක්ති රසය විමුක්ති සුවය විඳින්නෝද ඒ මහා මුනිවරුය. එවන් මුනිවරු බවට පත්වන බෝසත් කුමරුන් මෙලොව උපදිත්ද එදිනම සහජාත වස්තුවක් ලෙස බෝධීන් වහන්සේ පහලවන්නේ. එවන් මහා උතුමන් විමුක්ති සුවයට පත්වන්නේත් යම්තැනෙකද, ඒ මෙම පින් බිමෙහි මිස අන් කිසිදු තැනක නොවෙයි."

"මා මිත්‍ර පුරෝහිත! ඔබගේ දැනුම නම්, උත්කෘෂ්ටයි විෂිශ්ටයි, පරම උදාරයි. අපගේ කීකරු හස්පීරාජයා භූමියට සංක්‍රමනය වූයේ මේ ආශ්චර්යය නිසාමයි. මට එය දැන් හොඳින් වැටහුණා පුරෝහිත තුමනි!"

"මා කෙරෙහි දරන විශ්වාසයට ස්තුති වේවා දේවයන් වහන්ස! සැබවින්ම උත්කෘෂ්ටද, විශිෂ්ටද, පරම උදාරද වන්නේ මේ අවිජහිත භූමියයි."

"එසේනම් පුරෝහිතුමනි! ඒ ඔබ පවසන මුණිවරුන් සිහිකර මෙහි වන්දනා බුහුමන් දැක්වීම අපගේ යුතුකමයි. එය අපේම යහපත පිණිසම වන්නේ නොවේද? මා ප්‍රිය ඇමතිවරුනි! ප්‍රිය මිත්‍රවරුනි! අප මෙහි වන්දනා ගරු බුහුමන් කළ යුතුයි. වහා සූදානම් කරන්න."

බෝ සෙවණේ සම්බුද්ධ වන්දනාව ආරම්භවූයේ ඉතා ඈත කාලයේ සිටයි. එය සනාථ වන්නේ ජාතක පොතේ හමුවන කාලිංග බෝධි කතා වස්තුවෙන්. ඒ කතාවට අනුව සක්විතිරජතුමා ඇතුලු පිරිස භූමිය පිළිසකර කර සියළු වතාවත් සපුරා සියලු බුදුරජාණන් වහන්සේලා සිහිකර වන්දනා කළා.

වර්තමානයේ ඇතමෙක් අන්තොටුවන් සේ බෝධිවන්දනාව හෙවත් බෝධීන් වහන්සේ අසල බුද්ධ වන්දනාව ප්‍රතික්ෂේප කළද අතීතයේ සත්පුරුෂ උතුමන් සුදුසුයැයි පිළිගත් සත්ක්‍රියාවකි. ඊට හේතුව බෝධිවන්දනාව නිසා තම සිත තුල ශාස්තෘන්වහන්සේ කෙරෙහි ගෞරවය ඇතිවීමත් සමග මතුවන කුසල් සිත් ගොනුව සිත අඳුරුකරන අකුසල් සිත් මැඩගෙන සිතට සතුටක් ආලෝකයක් ලබාදෙන නිසාය.

දිවමන් බුදුරජුන්ට ගරුබුහුමන් දක්වන්නට මල්සුවඳ ආදිය රැගෙන සැදැහැවතුන් පැමිණියා. නමුත් ඇතැම් අවස්ථාවල බුදුරජාණන්වහන්සේ සෙනසුනේ වැඩසිටියේ නෑ. ගෙනෙන ලද පූජාභාණ්ඩවලට කුමක් කරන්නේදැයි සිතා කිසිවක් සිතාගත නොහැකිව දෙව්රම් වෙහෙරේ තැන තැන තබා සුන්වූ බලාපොරොත්තු සහිතව ආපසු යන්නට ගියා. දෙව්රම්වෙහෙර සාදවා පූජාකළ අනේපිඬුසිටුතුමා මෙය දුටුවා. විහාර භූමියතුළ සැමතැනම වියළී ගිය මල්ගොඩවල් අමිහිරි දසුනක්.

"ස්වාමීන් වහන්සේලා වැඩසිටින දවසට හැමදාම වත්පිලිවෙත් කරලා සුද්ධ කරනවා. නමුත් සෙනසුනට යන එන අය මේවා දමල හැඩිකරනවා. ඇයි මෙහෙම වෙන්නේ?

අනේපිඬුසිටුතුමා විමසිලිමත් වුණා. එහුට මනාසේ වැටහීගියා කාරණාව. එනිසාම ධර්ම භාණ්ඩාගාරික පූජනීය

ආනන්ද මහා ස්ථවිරයන්වහන්සේ හමුවුණා. වන්දනා කර බොහෝමත් ගෞරවයෙන් හා සංයමයෙන් යුතුව සැළ කළා.

"ස්වාමීනි! විහාර භූමිය පුරාම හැමතැනම මල්ගොඩවල්. ඒවා අතර බොහොමයක් අළුත් ඒවා නොවේ. පරවී වියළී ගිහින්. මේ අපේ මිනිස්සුන්ගේ වැඩ. නමුත් ස්වාමීනි දොස් කියන්නටත් බැහැ. ස්වාමීනි ඒ අය එන්නේ බොහොමත් ශ්‍රද්ධාවෙන් බුදුරජාණන් වහන්සේ දකින්න වන්දනා කරන්න. ඒ අය අතර බොහෝ දුරකතර ගෙවා එන අයත් සිටිනවා. නමුත් බුදුරජාණන් වහන්සේ සෙනසුනේ වැඩසිටියේ නැත්නම්, බලාපොරොත්තු සිඳීගොස් සිත් තැවුලෙන් ගෙනෙන ලද දෑ විහාරයේ ඒ ඒ තැන්වලම තබා යන්නට යනව.

"එය සැබෑවක්මයි සිටුතුමනි. මමද මෙය බොහෝවිට දැක ඇත්තෙමි. එනිසා අපි මේ ගැන වහා පියවරක් ගතයුතු වෙනවා."

"එසේමයි, ගරු ස්වාමීන් වහන්ස."

"හොඳයි සිටුතුමනි. මම මේ ගැන භාග්‍යවතුන් වහන්සේගෙන් විමසා වහා දැනුම් දෙන්නම් ඔබට."

ආනන්ද ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේට මේ ගැන සැලකර සිටියා. භාග්‍යවතුන් වහන්සේ සෙනසුනේ වැඩනොසිටින විට වන්දනා කරන්නට පිළිවෙතක් විමසුවා.

"ආනන්ද! ඔබගේ විමසීම ඉතාමත් කාලෝචිතයි. අදටත් මතුවටත් දෙවිමිනිසුන්ගේ යහපත පිණිස වනවා නියතයි. තථාගතයන් වහන්සේ එය සැලකර සිටින්නම්. හොඳින් අසාසිටින්න."

අතීත බුද්ධ සාසනවල පවා බුදුරජාණන් වහන්සේට ගෞරවකිරීම පිණිස බුද්ධත්වයට පත්වන මොහොතේ සෙවණ දුන් බෝධීන් වහන්සේ සුදුසුයැයි දේශනාකරඇති බව බුදුනුවණට හසුවුණා. ඒ අනුව බුදුරජාණන් වහන්සේ මෙසේ වදාළා.

"ආනන්ද! තථාගතයන් වහන්සේට වන්දනා කිරීමට යමෙක් කැමැත්තේ නම්, බුද්ධරාජ්‍යයට පත්වන අවස්ථාවේ සෙවණ ලැබූ ඇසතු වෘක්ෂය සුදුසුයැයි මම අනුදනිමි."

"ස්වාමීන් භාග්‍යවතුන් වහන්ස! එය මගධ දේශයේ ගයාවේ ඇතිබවයි ඔබවහන්සේ දේශනාකලේ. ඉතිං බොහෝදුරයි නේද?"

"ආනන්ද! එය එසේමය. නමුත් එහි ශාඛාවක් මෙම ජේතවනාරාමයේ පිහිටුවන්නට සුදුසුයි නේද?"

බුදුරජාණන් වහන්සේගේ මේ අවසරයෙන්, කොසොල් මහරජ, අනේපිඩුසිටුතුමා, විශාඛා මහ උපාසිකාව යන අය ආනන්ද ස්ථවිරයන් වහන්සේගේ මූලිකත්වයෙන් ජේතවනාරාමයේ ශ්‍රී මහා බෝධි ශාඛාවක් රෝපණය කරනු ලැබුවා. අදත් ආනන්ද බෝධීන් වහන්සේ නමින් හඳුන්වනු ලබන්නේ ඒ උතුම් බුදු මුවින් අනුදැන වදාල වන්දනීය පූජනීය ශාස්තෘන්වහන්සේ කෙරෙහි ගෞරවය මතුකරදෙන බෝධිරාජයානන් වහන්සේය.

සම්බුද්ධ පරිනිර්වාණයෙන් වසර තුන්සියයකට ආසන්න කාලයේදී දඹදිව රජකළ අශෝක අධිරාජයාණන්ගේ පුත් වූ පසුව සසුන්ගතව මිහිඳු මහරහතන් වහන්සේ නමින් ප්‍රචලිත උතුමන් වහන්සේ ලක්දිව බුදුසසුන පිහිටවූ බව ඔබ දන්නා කරුණකි. දෙවනපෑතිස් රජුගේ ආරාධනාවෙන් තම නැගණිය වූ සඟමිත් තෙරණින් වහන්සේට දන්වා ශ්‍රී මහා බෝධි ශාඛාවක් වැඩමකළ සැදැහැසිත් මතුකරවන ඒ ආශ්චර්යමත් කතාව නැවත සිහිකිරීම ඉතා යෝග්‍යයැයි හැඟුනද විස්තරය දීර්ඝවන බැවින් මෙහිලා සටහන් නොකරමි.

## දෙව්රමින් නාවිමන සෙනසුනට වැඩි බෝරජිඳුන්

අඹේපුස්ස නාවිමන වන සෙනසුන ආරම්භවූයේ දැනට දසක ගණනාවකට පෙර අති පූජනීය තාඹුගල ආනන්දසිරි ස්වාමීන් වහන්සේගේ මූලිකත්වයෙන්. එකල පුරෝගාමී වූ දායක දායිකාවන් කිහිපදෙනකු මෙය සටහන් තබන 2019 වසර

වනවිටත් සුජීවත්ව සිටින අතර සෙනසුන දකිමින් අතීතය ආවර්ජනය කරමින් වර්තමාන දියුණුවද දකිමින් සතුටුවෙනවා. නමුත් තවත් බොහෝ දෙනාට සෙනසුනේ කන්ද නගින්නට දැන් දෙපා වාරු නැහැ. සෙනසුනේ ඉපැරණි ශ්‍රී මහා බෝධීන් වහන්සේ වැඩසිටින්නේ කඳුමුදුනේ. වයෝවෘද්ධ අය කොහොමද කඳු නගින්නේ? එවන් වයෝවෘද්ධ අයටත් ගිලන් අයටත් වන්දනා කරගන්නට පහසුව සෙනසුනේ පහළ තිබුනා නම් කොච්චර හොඳදැයි, අපේ පුංචි කමිටුවේ අය නිතර සාකච්ඡා කළා. ඔය අතරේ දිනක් ස්වාමීන් වහන්සේ මෙවන් අදහසක් මතු කළා.

"මහත්මයා, මේ වැඩේ කරන්න බැහැ. දැන් දැන් පොලිස් මුරපොලක් ඕනවෙයි වගේ."

ස්වාමීන් වහන්සේගේ කතාවේ අගක් මුලක් අපටනම් තේරුණේ නැහැ. අප සැවොම අන්ද මන්ද වී මොහොතක් තුෂ්ණිම්භූතව බලාසිටියා.

"මා කියූ දේ මහත්මයලට තේරුනේ නැහැනේද? මා කිවූ කතාව?"

"එහෙමයි අවසර, හිතාගන්න බැහැ කුමක්ද කියල,"

"හොඳයි එහෙනම් අහන්නකෝ, බෝධි පූජාවට කියල අවේලාවේ කොල්ලො කෙල්ලො සෙනසුනේ ඉහල කොටසට යනවා. බෝධි පූජාවක් කිවුවම එපා කියන්නත් බැහැනෙ. නමුත් පූජාවට කියල මලක්වත් ගේන බවක්නම් නැහැ."

"ඉතිං අවසර?"

"මහත්මය දවසක් එහෙම ජෝඩුවක් ගියා. නමුත් එන්න ප්‍රමාදයි. මොකද වුණේ කියල බලන්න යද්දි අර ඇත කැලේ එහාපැත්තෙ ගල්තලාවෙ ........... බොහොම අසෝබනයි මහත්මයා. මං අහන්නෙ ඕවකරන්න මේ ආරණ්‍යයට එන්න ඕනද? වෙනතැන් නැද්ද? උඩට යන්න අවසර ගන්නෙ එකක් කියල. කරන්නෙ වෙනත් දෙයක්. මට සිද්ධවුණා එවෙලේම

එලවල දමන්න. මීට කලකට පෙරත් ඔහොම ගිය ජෝඩුවක් කන්ද උඩ රණ්ඩු වුණාලු මහ ගුටිකෙලියකුත් එක්ක. ඒ දවස්වල මම සෙනසුනේ වැඩසිටියේ නෑ.''

''අපි මේවා නවත්වන්නට ඕන අවසර''

''ඔබ හරි මහත්මයා. නමුත් සුදුසු විදියට. එනිසා බෝධි වන්දනා කරන්න මේ පහළ කොටසේ සෙනඟ ගැවසෙන ප්‍රදේශයේ බෝධියක් රෝපණය කරමු.''

''ඉතිං අවසර වටිනා බෝධියක් කොහෙන්ද සොයාගන්නෙ? ඔය කපුටු බෝධිනම් වැඩක් නැහැ.''

මේ කතාව පූජ්‍ය ගලිගමුවේ සුමන ස්වාමීන් වහන්සේට දැනගන්න ලැබුනා. උන්වහන්සේ කදිම අදහසක් ඉදිරිපත් කළා.

''නාථගනේ ලොකුස්වාමීන් වහන්සේ ලඟ බෝ පැල තියෙනව. මම දැක්ක කලක් තිස්සේ බොහොම හොඳින් සාත්තු කරනවා. අපි ගිහින් එකක් ඉල්ලාගනිමු.''

ඒ අනුව පූජනීය සුමන ස්වාමීන් වහන්සේට ගමන් පහසුව සැපයීමෙන් ස්වාමීන් වහන්සේම බෝසමිඳුන් වැඩමකරවූවා. ඒ ටික දිනකින් කඨින පිංකම සඳහා නාථගනේ ලොකු ස්වාමීන් වහන්සේ වැඩියා. සුදුසු අවස්ථාවක් බලා අපිට ලැබුණ බෝධීන් වහන්සේගේ වංශකතාව විමසා සිටියා.

''අවසර ස්වාමීන් වහන්ස! මේ බෝධීන් වහන්සේ බොහොම සරු පෙනුමයි. අපි කැමතියි විස්තර දැනගන්න.'' අපි ඒ ලොකු ස්වාමීන්වහන්සේගෙන් ඇසුවා. එවිට පූජනීය නාථගනේ ලොකු ස්වාමීන්වහන්සේ විස්තර කතාව පටන්ගත්තා.

''ඔව්, බොහොම අමාරුවෙන් රැක බලාගත්තේ. පුංචිකාලෙදි හැමදාම උදේ සවස සාත්තුව ඕන. නැත්නම් බොහොම පළිබෝධ''

එහෙමකියද්දි මට මතක්වුනේ, හරියට පුංචි කුමාරයෙක් හැදෙනව වගේ බලාගන්න ඕන කියල. "අවසර ස්වාමීන් වහන්ස කොහොමද මේ බෝපැල ලබාගත්තේ?"

"ඒක බොහොම වටින කතාවක්, නාඋයනේ ලොකු ස්වාමීන් වහන්සේත් එක්ක අපි දඹදිව වන්දනා කරන්න වැඩියා. අපි එදා ජේතවනාරාමේ බලල අන්තිමේදි ආනන්ද බෝධීන් වහන්සේ ලඟ පත්කඩය එලාගෙන හැමදෙනාම වන්දනා කරනවා. එය අතරේ මහා පුණ්‍යවාසනාවක් මතු වුණා. හිතුවෙවත් නැති දෙයක්."

ස්වාමීන් වහන්සේ විස්තර කරන ආකාරයට කුතුහලය නිසා අපේ සිත් තවතවත් කතාවටම ඒකරාශී වුණා. ස්වාමීන් වහන්සේ කතාව කියනවා.

"ඒ කියන්නේ වන්දනා කරද්දි මෙන්න බෝ ඵලයක් මගේ පත්කඩය උඩට වැටුනා. මම එය අරගෙන සතුටින් වටපිට බැලුවා වෙනත් බෝගස් තියෙනවද කියල. නැහැ, එතන වැඩසිටියේ ආනන්ද බෝධීන් වහන්සේ විතරයි. එනිසා නිසැකවම මම දැනගත්තා, මේක නම් මගේ පුණ්‍ය වාසනාව කියල. මම එය සුරක්ෂිතව තබල වන්දනාව කළා. වන්දනාව කරල ඒ වැඩසටහන අවසානයේ නාඋයනේ ලොකු ස්වාමීන් වහන්සේටත් වන්දනා කළාට පස්සේ මම කිවුවා, "අවසරයි ස්වාමීන් වහන්ස! මම වන්දනා කරද්දි මේ බෝ ඵලය පත්කඩය උඩට වැටුණා. අවසර ලැබෙනවනම් ලංකාවට ගෙනහින් රෝපණය කරන්න පුලුවන්." එතකොට නා උයනේ ලොකු ස්වාමීන් වහන්සේ අතේ තිබුන බෝඵලයක් මට දීල, "මේකත් වන්දනා කරද්දි පත්කඩය උඩට වැටුනා, ඔබවහන්සේට දෙන්නමයි තියාගත්තේ." ස්වාමීන් වහන්සේ එහෙම කිවුවම මට හරි සතුටක් ඇතිවුණා. අවසර ඉල්ලන්නත් කලින් අවසර ලැබිල තිබුණා කියල දැනුන නිසා, එහෙම ලබාගත්ත බෝඵල දෙකෙන් ඉතාම අමාරුවෙන් හදාගත්ත පැලයක් තමයි මම නාවිමනට යොමුකලේ" කියමින් නිදානය පැහැදිලි කර දුන්නා.

නාථගන ආරණ්‍යයේ සිට වැඩමකළ ඒ බෝසමිඳුන් පුංචි රාජකුමාරයෙක් වගේ තවමත් සුරක්ෂිතව මල්පෝච්චියක මහසඟරුවනේ ආරක්ෂාව මැද වැඩෙමින් සිටිනවා.

දවසක්, "අපි කොතනද මේ බෝධීන් වහන්සේ රෝපණය කරන්නේ?" අපේ කෙනෙක් ඇසුවා. පිළිතුරු සොයද්දි කරුණු කිහිපයකටම අවධානය යොමු කළා.

"සැම කෙනකුටම දවසේ ඕනෑම වෙලාවක වන්දනා කරන්නට පුළුවන්තැනක් වෙන්නට ඕන. අනික වයෝවෘද්ධ අයට පවා යන්නට පුළුවන් තැනක් වීමත් වැදගත්."

කෙනෙක් තම අදහස මෙසේ ප්‍රකාශ කළ විට තවත් අයෙක් "බොහෝ විහාරස්ථානවල ප්‍රතිමාඝරයත් චෛත්‍යයත් බෝධි මණ්ඩලයත් එක ළඟ තියෙන්නේ. එය වන්දනා කරන්නට පහසුවක්."

"ඇයි අමතක වුණාද? සෙනසුනට ඇතුලුවෙනවිටම පෙනෙන්නට තිබුණොත් එය ප්‍රිය අරමුණක් වේවි කාටත්"

මෙසේ විවිධ අදහස් මතුවෙද්දි පිඩුහල අසල දිරාගිය පැරණි ටැංකිය සහිත තැනක් සිහිපත් වුණා. එම ස්ථානය සෙනසුනට ඇතුළුවන විටමත්, ප්‍රතිමාඝරයටත්, පිඩුහලටත් ආදී සැමතැනටම මැදිවූ තැනක්. අතීත ඉදිකිරීම් වලට පස්ගන්නට වලවල්කපා කුණුකසලින් පිරී වල් බිහිවී තිබූ අසම බිම්කඩක් නිසා බෝමළුවකට තබා වැසිකිළියක් සදන්නටවත් එහි සුදුසු බවක් නෑ. ගල්වැටිදමා පස්පුරවා එම පහත්බිම උස්වේදිකාවක් මෙන් ලස්සන කරන්නට අපේ තරුණ පිරිසට වැඩිකලක් ගියේ නෑ. මේ සඳහා අවශ්‍ය පස් පවා සෙනසුනෙන් බැහැර ප්‍රදේශවලින් උපයා සපයා ගත්තේ මෙම වනපියසේ සුරක්ෂිත භාවයට උපකාරවනු පිණිසයි. මෙහි ශ්‍රමදායකත්වයට නිට්ටඹුවේ තිලිණ මහත්මා සහ මිත්‍ර පිරිස මූලිකවූබව සතුටින් සිහිපත් කරමු. තරිඳු මහත්මා, රවී මහත්මා ඇතුළු මිත්‍ර පිරිස බෝධි ප්‍රාකාරය සඳහා බරපැන යොමු කළා. සැදැහැති ආරියදාස මහත්මා (අරියදස්සන හිමි) රන්වැට සාදවා ලස්සන කළා. ආනන්ද බෝධීන් වහන්සේට පරිවාර ආරක්ෂක බෝධියක් සමීර චතුරංග

සහ නිශාන්ත තරුණ මහත්වරුන් රෝපණය කළා. ඉඩෝර සමයේ පැන් වඩන්නට මල්වැස්සක්වන්වූ දියදහරාවක් සහ විදුලි ආලෝක පූජාවක් සුචන්ද (සුජන්ද ස්වාමීන් වහන්සේ), ලකිත් (සුචිත්ත ස්වාමීන් වහන්සේ) සහ මමද එකතුව සකස් කළා. නාඋයන මූලස්ථානයෙන් ලැබුණ කිරිගරුඬ බුද්ධ ප්‍රතිමා වහන්සේ තැන්පත් කර ආවරණයක් සහ බුද්ධ රශ්මි මාලාවන් අප විසින් සකස් කරනු ලැබුවා. මේ අනුව පිංකමක් ලස්සනට පිළිවෙලට කරන්නට ඉඩ පහසුකම් ඇති වටිනා තැනක් නාවිමන සෙනසුනට නිර්මාණය වුණා.

## කළ පින් පිහිටට එනවාද ?

***චිරප්පවාසිං පුරිසං, දූරතො සොත්ථිමාගතං; -***
***ඤාතිමිත්තා සුහජ්ජා ච, අභිනන්දන්ති ආගතං.***
***තථෙව කතපුඤ්ඤම්පි, අස්මා ලොකා පරං ගතං;***
***පුඤ්ඤානි පටිගණ්හන්ති, පියං ඤාතීව ආගතං.***

*(ධම්ම පද පියවග්ග)*

දුර ඈත රටකසිටින කාලෙකින් හමු නොවූ කෙනෙක් ආපසු තම රටට ගමට නිවසට එනවා කියල දැනුනොත් නෑදෑ හිතමිතුරු සහෘදයෝ සැවොම තම සගයාගේ පැමිණීම ගැන ඉතාමත් සතුටින් පිළිගන්නට යනවා. සතුටුවෙනවා. ප්‍රිය සම්භාෂණ පවත්වනවා. එසේම පිං කළ තැනැත්තාද මෙලොවත් සතුටු වන අතර මිය ගිය මොහොතේ පටන් පරලොවද සතුටට පත් කරවනවා.

බුදුරජාණන් වහන්සේලා දහම් දේශනා කරන්නේ හේතුවක් මුල් කරගෙනමයි. සුදුසු තන්හි සුදුසු කාලයේමයි. එවැනි යම් කරුණක් නොවී නම් දේශනා කරන්නේ නෑ. මෙය දේශනා කලේ කවර හේතුවක් මුල් කරගෙනද?

ස්වාමීන් වහන්සේ ධර්ම දේශනා කරද්දි එපා කියා දෙව්ලොව සැප වින්ද කෙනෙක් ගැන ඔබට මතකද? අහනකොටත් පුදුමයි නේද? දහම් දෙසන්නට එපා කියල දෙව්ලොව යන්නෙ කොහොමද? අපායේ මිසක්. නමුත්

දෙව්ලොව ගියා. මුළු ජීවිත කාලයේම කුසල් දහම් වඩමින් සිටි උපාසකතුමෙක් ජීවිතයෙන් සමුගන්න අවසන් මොහොතේ බණ අසමින් සිටියලු. එකවරම අතින් සංඥා කළාලු බණ නවත්වන්නට. ස්වාමීන් වහන්සේ ආපසු දෙව්රම් වෙහෙරට වැඩල එය බුදුරජාණන් වහන්සේට සැල කළාලු. බුදුරජාණන් වහන්සේ කුමක් පවසන්නට ඇත්ද?

"මහණෙනි! ඔහු දහම් දෙසන්නට එපා කිව්වේ නැ. බණ අසමින් සිටියදී දිව්‍ය රථ පැමිණ ආරාධනා කළා දෙව්ලොව යන්නට. බණ අසන නිසා පොඩ්ඩක් සිටින්නට පැමිණ සිටි දෙවියන්ට අතින් සංඥා කළා. ඔබ බණ නතර කළා. ඔහු දෙව්ලොව උපත ලැබුවා. කවුරු ගැනද මේ? බුදුරජාණන් වහන්සේ ජීවමාන කාලයේ සිටි නන්දිය උපාසකතුමා ගැන.

ඉහත සහන් ගාථාව දේශනා කලෙත් ඔහු ගැනමයි. නන්දිය තරුණයාගේ ජීවිතයම කැප කළේ පිනටමයි. මව්පිය උරුමයෙන් ලැබුන සියළු ධනස්කන්ධය ඔහු බුද්ධ ප්‍රමුඛ මහ සඟරුවන වෙනුවෙන් උවටැන් කරන්නටම යොදාගත්තා. ඒ අතර දිනක් දහම් අසා සෙනසුන් පිදීමේ ආනිසංස සිහිකරන ඔහුට සිතුවිලි දාමයක් මතුවුණා.

"මම බොහෝ පිංකරන බව ඇත්ත. නමුත් පිං කොච්චර කළත් ඇතිය කියල සීමාවක් දකින්නේ කොහොමද? මේ දිගු සසර ආ මග වැරදුනු තැන් කොච්චර ඇත්ද? ඒවා ඉස්මතු වුණොත් ඵලය කුමක් වෙයිද? එනිසා කුසල් වැඩීමම නිවන්මග පහසු කරනවා. අපායෙන් ඈතට ගෙනයනවා. මම දන් දෙනවා වගේම දානශාලාවක් මහසඟරුවනට පහසුවන ආකාරයට සාදා පූජාකලොත්.....? ඔව්, මම ඒක කරනවා. දාන ශාලාව කොයි වාගෙ පහසුකම්ද අවශ්‍ය විමසලා බලා පිළිවෙලකට මෙය කරන්න ඕන. දානශාලාවට අවශ්‍ය සියලුම අංගෝපාංගත් සපයන්න ඕන....." එසේ සිතූ ඔහු ලස්සන දන්හලක් සාදවා සියලු අංග උප අංග සහිතවම පූජාකළා.

දිනක් මුගලන් මහරහතන් වහන්සේ ඉදු බලයෙන් දෙව්ලොවට වැඩමකර සැරිසරන්නේ මනරම් ස්වර්ණමය දිව්‍යමාලිගාවක රැඳී සිටි දෙවඟනන් පිරිසක් දැක, "ස්වාමීනි!

මොග්ගල්ලානයන් වහන්ස! මොහොතක් රැඳීසිටින්න. අපට යම් කාරණාවක් පවසන්නට තියෙනවා.'' එය ඇසූ මුගලන් මහරහතන් වහන්සේ නතර වුණා. දෙවඟනන් පැමිණ වන්දනා කළා.

''දෙව්දූවරුනි ! මේ මනරම් මාලිගාව නුඹලාගේද?''

''ස්වාමීන් වහන්ස! මෙය අපටම අයත් එකක් නම් නොවෙයි. මෙහි නියම හිමිකරු එනතෙක් අපි මෙහි බලා සිටින්නෙමු.''

''කවුරුන්ද මෙහි නියම හිමිකරු? ඔහු කොහි සිටින්නෙහිද?

''එයම තමයි අපට පවසන්නට ඇත්තේ. ඒ සඳහාමයි අප ඔබවහන්සේගෙන් අවසරයක් ගත්තේ.''

''ඔව්. විමසා සිටින්න දෙව්දූවරුනි. කුමක්ද නුඹලා මගෙන් විමසන්නේ?''

''ස්වාමීනි මහරහතන් වහන්ස! නිතර පිං කරන නන්දිය කියල උපාසක මහත්මයෙක් දන්නවද? එහු මෑතකදී දානශාලාවක් සාදා බුද්ධ ප්‍රමුඛ මහා සංඝරත්නයට පූජාකළාද?''

''ඔව්, එවැන්නක් සිදු වූවා. ඔහු බොහෝ කුසල් වඩන නැණවතෙක්''

''ස්වාමීනි මහරහතන් වහන්ස! මේ ඔහු වෙනුවෙන් පහළ වූ මාළිගාවයි. බලන්න මෙහි ලස්සන. ස්වාමීනි, පරණ වූ පළතුරක් බඳු මිනිසත්බව අතහැර නැවුම් පළතුරක් වන් දෙව්ලොවට එන්නට ඔහුට පවසන්නට හැකිද? මේ අප්සරාවන් ඔහු එනතුරු බලා සිටින බව දන්වන්නට?''

මහමුගලන් මහරහතන් වහන්සේ දෙව්ලොවින් මනු ලොවට පැමිණ බුදුරජාණන් වහන්සේට මෙය සැලකර සිටියා. එකරුණෙහි ලා කුසලයේ අනුසස් බුදුහිමි වදාළා. පිං කළ

තැනැත්තා එනතෙක් සුව සාදන්නට තමා කළ පින බලා සිටින්නේ කලකින් දකින මිතුරකු, ඥාතියකු හමුවන්නට මග බලා සිටින පිරිසක් වගේ යැයි දේශනා කළා.

ඒ අතීත කතාවත් එක්ක වර්තමාන සිදුවීමක් ලියන්නට යුතුයැයි මට සිතුණා. දවසක් ලොකු ස්වාමීන් වහන්සේට පණිවුඩයක් ලැබුණා කලක සිට දන්නා දායක මහත්මයෙක් හදිසි රෝගාබාධයක් නිසා රෝහල් ගතවුණා කියලා. හදිසි වුවත් පණිවුඩය ලැබුනේ නම් දින ගණනක් පහුවෙලා. අති පූජනීය නාඋයනේ මහා ස්වාමීන් වහන්සේ හමුවන්න ගිය ගමනේ රෝහලටත් ගොඩ වුණාලු ලෙඩා බලන්න. ස්වාමීන්වහන්සේ දුටු විගසම රෝගියා මහා පුදුම කතාවක් කියලා.

"කොහොමද මහත්මයා අසනීප තත්වේ? මට නම් පේන්නෙ කිසිම ලෙඩක් නෑ වගේ"

"එහෙමයි අවසර ස්වාමීනි. මම නම් මැරිල ආයේ ඉපදුණා. දැන්නම් මට හිතෙන්නෙ මැරුණා නම් හොඳයි කියලා. කමක් නෑ පණ ආවනේ."

"ඇයි මහත්මයා එහෙම කියන්නේ? තවම මිනිස් ආයුෂෙන් බාගයකවත් ගෙවිලා නෑනේ?

"ස්වාමීන් වහන්ස, මේ වෙලාවේ මැරුණ නම් මාව ගොඩ තමයි. ඊළඟ වාරේ මොනවා වෙයිද කවුද දන්නේ? "

"හොඳයි කියන්නකො බලන්න ඔය ටික ටික කියන කතාව සම්පූර්ණ කරලා."

"ස්වාමීන් වහන්සෙ! එදා දවසෙම මම වැඩකරලා හැන්දෑවෙ කඩේට ගියා පුතාට අවශ්‍ය පොත් වගයක් ගේන්න. කාර් එක නවත්තල මම කඩෙන් අවශ්‍ය පොත් වගයක් තෝරමින් සිටියේ. එකවරම දාඩිය දාලා පපුවෙ දැඩි වේදනාවක් ආවා. ඉවසන්න බෑ. මම දත්මිටි කාගෙන ගිහින් මුදලාලිට කිවුවා. මට හරිම අමාරුයි ඉක්මනින් මාව ඉස්පිරිතාලෙට ගෙනියන්න කියලා. මගේ කාර් එක තිබුණට මට ඩ්‍රයිව්

කරන්නත් හයියක් නෑ. වෙන පුළුවන් කෙනකුත් නෑ. බලන් ඉන්නත් බෑ. අන්තිමේදි මට යන්න වුණේ ත්‍රිවීල් එකකින්. වේදනාවේ තරමට මට ක්ලාන්තේ වගෙයි. හාන්සි වුණා ළඟසිටි අයෙකුට කවුද දන්නෙත් නෑ. අර වේදනාව මැද්දෙන් මට සිහිවුනේ මගේ නෝනයි පුංචි දරුපැටවු තුන්දෙනයි තනිවෙනවා. ඊළඟට දේපල. එකපෙළට සිතුවිලි ගලන් ආවා පුදුම වේගයකින්. ඔහොම සිත්ගලාගෙන එද්දි එකපාරටම මතක් වුණා **"මේ මොනවද සිතන්නේ, ස්වාමීන්වහන්සේ කීවේ මේව හිතන්න හොඳ නෑ කියලා."** ඒ වනවිටත් මට දැනිල තිබුණා දැන් මම අවසන් ගමන් යනවා කියලා. හදිසියේම මතක් වුණා නාවිමනෙ ආරණ්‍යයේ බෝමළුවට යන පාරට කැට (interlock) අල්ලන්න කළ පරිත්‍යාගය. මම එතන ඉන්නව වගේ පෙණුනා. පාරදිගේ මම ගියා බෝමළුවට, එතන හරිම සනීපයි. ආලෝකමත්. දැන් සිතේ බර අඳුරු ගතිය සම්පූර්යෙන් නැතිවෙලා. පුදුම සනීපයක් සතුටක් දැනුණා. ස්වාමීන් වහන්සේ නමක් එතන භාවනා කරමින් වැඩ සිටියා. ඒත් එක්කම සිහින් හඬක් ඇහුණා හීනෙන් වගේ. පේෂන්ට් නෝමල් (patient normal) කියල. පියව් සිහිය එනවිට මම සිටියේ දැඩිසත්කාර ඒකකයේ."

"කොහොම වුණත් දැන් සනීපයි. එවේලේ සිදුවීමට අනුව හුස්ම ටික ගියා නම් මම හොඳ තැනක ඉපදෙනවා. මනුස්ස ලොකෙට ආවනම් පැවිදිවෙන්න හරි අවස්ථාව ලැබෙයි කියල හිතෙනවා. ඒකයි අපේ ස්වාමීන් වහන්ස, ඒවෙලාවෙ හුස්ම ගියානම් හොඳයි කිව්වේ. ඒත් එහෙම වුණේ නැහැනේ. ඒකත් හොඳයි. දැන් පෙරටත් වඩා පිං කරන්න ඕන, ඊලඟ අවස්ථාවේ මොනවා වෙයිද කොයි විදියේ සිතක් මතුවෙයිද කාටද කියන්න පුළුවන්."

**සාදු සාදු සම්බුදු අසිරිය පැතිරෙනවා**
**බෝපත් වල සිරි සිරි නද - පවනේ ලෙල දෙන නෙක ධජ**
**සාදු සාදු මගෙ දෙනුවන් අග පැටලෙනවා**
**සාදු නදින් මේ දෙසවන් විවර කෙරෙනවා**

**සාදු දනන් දහස් ගණණ් - සාදු ගුන පුරන රිසියෙන්**
**සාදු සිතින් බෝ සමිඳුන් වෙතට ඇදෙනවා**

සාදු සාදු සම්බුදු අසිරිය පැතිරෙනවා,
ජම්බු දීපයේ සිදුහත් ඉපදුන දා මහ බෝසත්
බුද්ධගයාවෙන් බෝ සමිඳුන් දිස්වෙනවා
දසමරසෙන් පරදවමින් - තිලොවග සම්බුදු වූදා
සිරි බෝසෙවනේ හිඳ -තුන් ලොව සනසනවා

අනිමිස ලෝචන පූජාවෙන් සත්දවසක් පුරාම
සම්බුදු සමිඳුන්ගේ - ගරු පුද හිමිවෙනවා
බුදු සමිඳුන් සිහිකරගෙන- වඳින පුදන සැම දනහට
තිවග සුව සැපත ලබන්ට -පිහිට සදනවා

සසංකාරයෝ විසංකාර කර දුකින් මිදෙන පිළිවෙත පෑදූ
මෙසංසාර භව දුකින් මිදෙන්නට සියලු සතුන්හට මග සෑදූ
උතුම් පාරමී බලෙන් වැඩූ නුවණින් යුත් සව්කෙලෙසුන් පැරදූ
නිතින් වදිම් සම්බුදු සමිඳුන් මම සිතින් දහම් සිසිලෙන් සේදූ

සාදූ සාදූ සාදූ !!!

## ලස්සන සිත සදා සුව දේ

*නතං මාතා පිතා කයිරා අඤ්ඤේ වා පි ච ඤාතකා*
*සම්මා පනිහිතං චිත්තං සෙය්‍යසෝ නං තතෝකරේ*
*(ධම්මපද චිත්ත වග්ග)*

මව් පියන්ට හෝ ඥාතියෙකුට හෝ අන් කවරකු විසින්වත් කළ නොහැකි තරම්වූ උපකාරයක් සේවයක් යහපත් බවින් පෝෂිත සිතට කළ හැකිය. කළ නොහැකි යහපතක් නැත්තේය.

අපිට හැම දෙයක්ම ලබාදෙන්නේ සිත මූලික වෙලා. උපත ලබන තැන පටන් ජීවිතය පුරා ලබන යම් සැපක් හෝ දුකක් වේද ඒ සියල්ලටම සියල්ලකම වගකීම සිත සතු දෙයක්. මම මේ කියනදේ ඔබ තවත් විදියකට සිතාවි. දුක සැප දෙන්නේ කර්මය කියලා. එය සැබැවක්මයි. මම **සිත නිසා**'' කිවුවේ ඉහතින් දැක්වූ ගාථාවට සරිලන නිසා. කර්මය කියන්නෙ

චේතනාව. චේතනාව සිතේ තිබෙන චෛතසිකයක්. ඒ නිසා සිත මුල් වුණා කිවුවමත් නිවැරදියි නේද? සිත ලස්සන නම් අපිත් ලස්සනයි. සිත කැත නම් අපිත් කැතයි. එහෙම කියනවට අකමැති නම් අවලස්සනයි කියන්නම්. සිත ලස්සන වෙන්නෙ කොහොමද ? කැත වෙන්නේ කොහොමද? පිළිතුර ඔබ දන්නවා. මම මෙහෙම කියන්නම්කෝ. බඳුනක් සුවඳද දුගඳද කියල වෙන් වෙන්නෙ එහි ඇති දේ අනුවයි. එසේම සිත සුගඳද දුගඳද ලස්සනද කැතද තීරණය වෙන්නේ සිතේ තිබෙන දේ අනුවයි. සිත නිතර වෙනස් වෙනවා. ඒ නිසා සිතේ තිබෙන දේත් වෙනස් වෙනවා.

ඒ වෙනස්වෙන සිතට නිතරම හොඳ දේවල් පුරවගන්න පුළුවන් නම් සිත නිතරම සුවඳ දෙයි. ලස්සන වෙයි. සිත ලස්සන වෙන්නෙ ශ්‍රද්ධාව, කරුණාව, මෛත්‍රිය, නුවණ වැනි හොඳ ගති සිතේ ඇතිවෙද්දි. ඒව නැතිනම් සිත කැතයි. ඇයි? සිතේ පිරෙන්නේ ආසාව, තරහ, වෛර, ක්‍රෝධ, ඊර්ෂ්‍යා, මාන. මේවා වැඩෙන්න හරිම ලේසියි. බලන්න සිතලා ආවර්ජනය කරලා ඔබේ එක පැයක කාලයක් මොනවද සිතේ වැඩුනේ කියලා. අර සිත කළු කරන සිත අවලස්සන කරන දුක පිණිස හේතු සදන අකුසල පාර්ශ්වික ගති නේද? මේ අකුසල පාර්ශ්විකයෝත් යම් ආශ්වාදයක් දෙන නිසා හරි කැමතියි රැස් කරන්න. අනුන් රිදවල සතුටුවෙන අය කොච්චර සිටිනවද? දවසක් කෙනෙක් කියනව තව කෙනකුට "*මම ඊයෙ මියුසිකල් ෂෝ එකක් බලන්න ගියා. ගිහින් එන ගමන් මහ රෑ වටපිට බැලුවා. බල්ලෙක් නෑ පාරේ. (එහෙම කිවුවෙ කවුරුවත් නෑ කියලා) පට්ට පාළුයි. ගෙදරක ගේට්ටුව ළඟ ඩස්ට්බින් එකක් (කසල බඳුනක්) මම ඒක අරගෙන අනිත් පැත්තෙ ගෙදරින් තිබ්බා. අද උදේ බලද්දි දෙගොල්ලෝ කොක්ක. ඒක දැක්කම මට හරි ෆන් එක*". මහ ලොකුවට හපන්කමක් වගේ කිවුවට සුලු ආශ්වාදයක් ලැබුවට මෙය මොන තරම් අනුවණද බලන්න. කෝ? අර සිත ලස්සන කරන ගති අසලකවත් නෑ. මේ පුංචි නිදසුනක් මීට වඩා නපුරු දේ කොච්චර වෙනවද? මේවායේ ඵලය මෙලොවත් පරලොවත් දෙකෙහිම දුක්වෙන්නට සිදුවෙනවා.

***මිච්ඡා පණිහිතං චිත්තං පාපියෝනං තතෝකරේ -*** වැරදි මග ගිය සිත පාපකාරී පුද්ගලයෙක් ඇසුරු කළා වගේ සැමවිටම අනතුරක.

සිත වැරැද්දට යන්න හරිම පහසුයි. හොඳ මගට යන්න නම් වෙසෙසින් පුරුදු කරන්නම ඕන. එය තමයි බෝසත් උතුමෝ පාරමී කියල පුරුදු කළේ. පාරමී සියල්ල එක ගොනුවකට ගත්තම දස පිංකිරිය වත කිවුවත් හරි. එයත් කෙටි කළාම දාන, සීල, භාවනා කියන්නත් පුළුවන්. මෙන්න මේ දාන සීල භාවනා තමයි. සිත ලස්සන කරන පිළිවෙත. දන් දෙන විට කුසල් සිත් වැඩෙනවා විවිධාකාරයෙන්. එය දාන ආනිසංස කියන විට දක්වනවා **උපසංකමති පයිරුපාසති සෝතං ඔදහති ධම්මං සුනාති සුත්වා ධම්මං ධාරේති අත්ථං උපපරික්ඛති.........** දන් දෙන්නට එනවා. ස්වාමීන්වහන්සේලා හමුවෙනවා. කතා කරනවා. බණ අහනවා. සිතට ගන්නවා. අර්ථ මෙනෙහි කරනවා. ඒ අනුව සිත වඩනවා. ධර්මය අවබෝධ කරනවා. දුකෙන් මිදෙනවා. සිතන්න. මේ දන් දීමේ හෙවත් අත හැරීමේ වටිනාකම. ශෝචනීය කරුණ තමයි මේ වගේ පිළිවෙතට දන් දෙන අය අඩුයි. බොහෝ දෙනා දන් දෙන්නේ අතහැරීමේ චේතනාවෙන් නොවෙයි. ලෝකය තව තවත් අල්ලා ගන්න. එහිම ඉන්න. නමුත් බුද්ධිමතා දන් දී එහි නිසි ඵල ලබනවා.

නිසිලෙස කළ දානයෙන් සතුට ලබනවා වගේම නිසිලෙස වඩන සීලයත් දුකෙන් ඈත් කර සැපය ළං කර දෙනවා. සිත ලස්සන කරන්නට උපකාරී වෙනවා. ඇයි සිතෙන් සිත සිතානේ හැම දෙයක්ම කරන්නේ. ඉතිං බලන්න සිතෙන් සිත සිතා නපුරු කතා කියද්දි නපුරු වැඩ කරද්දි සිතට කොච්චර අවුලක්ද අපිරිසිදු බවක්ද අවලස්සන බවක්ද ගෙනදෙන්නේ. ඒ නිසා සිල්වතෙක් වුණාම කය වචන සංවර වෙනවා. ඒ නිසා සිතට පහසුවක් වෙනවා.

නමුත් සිත හොඳටම ලස්සන කරන්නෙ භාවනාවෙන්. භාවනා කියන්නෙ වැඩීම. දියුණු කිරීම. කුමක වැඩීමක්ද දියුණුවක්ද? එය කොටස් දෙකක්. ඉන් පළමුවැන්න සිතේ එකඟබව දියුණු කිරීම, වැඩීම. ඒ කියන්නෙ සිතේ තිබෙන ගතියක් වන ඒකග්ගතාව දියුණු කිරීම. තවත් විධියකින් කියනවා

නම් එක හොඳ අරමුණක නැවත නැවත සිතන්නට සිත පුරුදු කිරීම. මේක තමයි සමථ භාවනා කිව්වේ. ඣාන භාවනා කියන්නෙත් මෙයමයි. අනිත් එක නුවණ දියුණු කිරීම. ඒ නුවණ සැබෑම නුවණ. ඒ කියන්නෙ යථා අවබෝධය ලබන නුවණ. යමක් හෝ යමෙක් කෙරෙහි යථා අවබෝධය නැති තරමටම අපි එය හෝ ඔහු කෙරෙහි මුලාවෙනවා. ඒ නිසාම ඇලෙනවා. ගැටෙනවා. මේ ගති නැති වන්නේ යථාර්ථය දුටු දවසටයි. ඒ යථාර්තය දකින නුවණ වඩන භාවනාව විපස්සනා කියන්නේ. සංසිඳුන සිතෙන් විපස්සනා කරන්නට පහසුයි. ඒ නිසා තමයි සමථ විපස්සනා දෙකක් දේශනා කරල තියෙන්නේ. ඒ නිසා සිත ලස්සන කරන්න නම් භාවනා කිරීම අත්‍යාවශ්‍ය වෙනවා.

***උක්ඛිත්තා පුඤ්ඤ තේජේන කාමරූප ගතිංගතා***
***භවග්තම්පි සම්පත්තා පුනාගච්ඡන්ති දුග්ගතිං***
***තාව දීඝායුකා සත්තා චවන්ති ආයු සංඛයා***
***නත්ථි කොචි භවෝ නිච්චෝ ඉති වුත්තං මහේසිනා***
***තස්මාහි ධීරා නිපකා නිපුනා අත්ථචින්තකා***
***ජරාමරණ මොක්ඛාය භාවෙන්ති මග්ග මුත්තමං***
***භාවයිත්වා සුචිං මග්ගං නිබ්බානෝගධ ගාමිනං***
***සබබාසවේ පරිඤ්ඤාය පරිනිබ්බන්ති අනාසවා***

(ධම්ම හදය විභංගය )

*පුඤ්ඤ ශක්තියේ බලය වැඩි නිසා කාමාවචර ලෝක රූපාවචර ලෝක පමණක් නොව අරූප ලෝක භවාග්‍රය (නේවසංඥානාසංඥායතනය) දක්වාම ගියත් නැවතත් දුගතියට පෘථග්ජන බව නිසා එන්නට වෙනවා. කල්ප මහාකල්ප ගණන් දීර්ඝායුෂ ඇති සත්වයන්ද ආයු කෙළවර නැවත හීන (පහත්) ලෝකවල උපත ලබනවා. මහා ඍෂී වූ භාග්‍යවතුන් වහන්සේ වදාළේ කිසිම තැනක් කිසිම භවයක් නිත්‍ය නොවන බවයි. ඒ නිසා මෙය තේරුම් ගත් අර්ථවත් සේ සිතන උත්සාහවත් නැණවතුන් ජරා දුකෙන් මරණ දුකෙන් මිදෙනු පිණිස උතුම් වූ ආර්ය මාර්ගය වඩයි. පුරුදු කරයි. එසේ ඒ උතුම්වූ නිවීමේ මග වඩා සියලු කෙලෙසුන් ආස්‍රවයන් නුවණින් දැන දුරුකර නිකෙලෙස් වූයේ පිරිනිවනට පත්වෙයි.*

මේ මා උපුටා ගත්තේ ලොකු ස්වාමීන් වහන්සේ නිතර දෙන අවවාදයක්. මට මතක හැටියට 2011 වසරේ විතර සෙනසුනට පැමිණි තරුණ පිරිසකට මේ අවවාදය දුන්නම ඒ අය එකඟ වුණා සති අන්ත භාවනා වැඩ සටහනක් සඳහා සහභාගී වන්නට. එවිට ස්වාමීන් වහන්සේ කිව්වේ "දරුවනි! ඔබලාගේ අදහස හරිම වටිනවා. රැකියාවන්වල යෙදිලා වගකීම්වල පැටලිලා සිටින්නට කොයිකාට වුණත් සිදුවෙනවා. ජීවිතේ හැටි එහෙමයි. නමුත් ඒවා නිසා ආධ්‍යාත්මික ගුණ දියුණු නොකළොත් අන්තිමේදි කාගෙවත් පිහිටක් නැතිවෙනවා. එපමණක් නොවෙයි. කාටවත් පිහිට වෙන්නත් බැරිවෙනවා. සති අන්තේ පමණක් නොවෙයි නිවාඩු තිබෙන ඕනෑම දවසක වෙලාවක ඇවිත් භාවනා කරන්න. ඔබ දැනටමත් දන් දෙනවා පෝයට සිල් රකිනවා විහාරස්ථානවල ශ්‍රමදාන කටයුතු කරනවා නොකරන දේ තමයි "භාවනාව" ඒකත් උත්සාහ කරලා බලමු."

"ස්වාමීන්වහන්ස! අනිත් ස්ථානවල නම් දින දහයේ සති දෙකේ මාසේ වගේ භාවනා පංති කරනවා. මෙහෙ එහෙම කරන්නේ නැද්දෙ?" එක් ළමයෙක් ඇසුවා.

එයට ස්වාමීන් වහන්සේ පිළිතුරු දුන්නෙ "එහෙම හොඳයි විවේක තිබෙන අයට භාවනා කරගන්න පුලුවන්. නමුත් මෙහි තවම එවැනි පරිසරයක් සකස් වෙලා නැහැ. හරියට පිරිසකට ඉන්න තැනක් නවාතැනක්වත් නැහැ. ගෙදර උදේ සවස යන්න එන්න ගියහම සාර්ථක වෙන්නෙ නෑ. සෝදලා මඩේ දමනවා වගේ. අනික මමත් මෙහි රැදෙන්නේ සතියයි දෙකයි. තව අවුරුදු කිහිපයක්ම මට මේ විදේශ භාවනා වැඩසටහන් කරන්න වෙනවා. නවක ස්වාමීන් වහන්සේලා පිරිසක් උගන්නන්න හැකි තරමට හුරුපුරුදු වෙනකම්. ඒ නිසා ඔබතුමන්ලා හැකි සැමවිටම ඇවිත් පුරුදුවෙන්න. මම මෙහි සිටින දිනවල කියලා දෙන්නම්. මට පුලුවන් දිරිගන්වන එකයි. සිත වඩන්නට ඕන ඔබමයි. එයට මම සැමවිටම සිටීම අවශ්‍ය වන්නේ නෑ."

මේ අනුව ආරම්භ කළ සති අන්ත භාවනා වැඩසටහන මාස ගණනාවක් පුරාවට අඛණ්ඩව සිදුවුණා. විදේශික හිතෛෂී පිරිසත් ස්වාමීන් වහන්සේ සෙනසුනෙහි වැඩසිටින කාලවල

පැමිණ  භාවනා කටයුතුවල යෙදුනා. මෙලෙස භෞතික මෙන්ම ආධ්‍යාත්මික යන උභයාර්ථයෙන් ප්‍රගතියක් මේ කාලය තුළ සිදුවූ බව සතුටින් සටහන් කරමි.

















# වගකීම සහ යුතුකම

පූජනීය සිද්ධස්ථානයකින් සිදුවිය යුතු සැබෑ වගකීම කුමක්ද? මේකත් බොහොම කාලීන ප්‍රශ්නයක් තමයි. මම මේ සෙනසුනේ සිටිය කාලය තුළ මා දුටු සුවිශේෂී වූද කෙනකුගේ ආගම දහම ගැන ඇති අවබෝධය මනා සේ පිළිඹිඹු කරන්නා වූද කරුණු අතර එකක් තමයි අවුරුදු තිහ හතළිහ මෙම ස්ථානයේම දන් පිංකම් කරපු දායක පිංවතුන් අමනාප වී ඊළඟ වසරේ දාන වාරයට නොපැමිණෙන බව නොදන්වාම නොපැමිණීම. මෙහිදී දානය පූජා කිරීමට එසේ නොපැමිණීමෙන් ස්වාමීන් වහන්සේලා නිරාහාරව තබා අපහසුතාවයට ලක්කරන්නදෝ මේ උත්සාහය කියා බොහෝ අවස්ථාවල අපට සිතුණා. නමුත් නිතර සෙනසුන ගැන සොයා බලන බුද්ධිමත් දායක පිරිසකුත් සිටිනවා. එවැනි දිනවල ඒ අය සතුටින් දානය පිළිගන්වා බොහෝ පිං රැස් කර ගන්නවා.

කෙසේ නමුත් මෙසේ කරන්නට හේතුවූ කරුණු කාරණා විමසා බලනවිට ගෙදර දානයට නොවැඩීම පාංසුකූලයට නොවැඩීම වැනි කරුණු බොහෝ විට හේතුවූ බව දැනගන්නට ලැබුණා. ඇත්තටම එය අමනාප වන්නට තරම් කරුණක්ද වරදක්ද කියා දැනගන්නට අපටත් උවමනා කළේ දහම් මගට ආධුනිකයන් වන අප වැනි තරුණයන්ටත් මෙය ඉතා වැදගත් කරුණක් නිසා. ඒ නිසාම අප විවේක අවස්ථාවක් බලා ඒ ගැන විමසා සිටියා.

"අවසරයි ස්වාමීන් වහන්ස! ප්‍රශ්නයක් අහන්න මේ වෙලාවේ."

"හා කමක් නෑ. මම මේ පුංචි වැඩක. නමුත් මම වැඩ ඉවර වෙනකම් සිටියොත් ප්‍රශ්නෙ අමතක වේවි. දන්නවනේ මගේ වැඩ".

ස්වාමීන් වහන්සේ අවසර දුන්නට උන්වහන්සේ වැඩ කරද්දි අපි ප්‍රශ්න අහන එක හොඳ මදි. එතන නිකම් බලා සිටින එකත් කොහොමටවත් හොඳ නෑ. ඒ නිසා අපි ස්වාමීන් වහන්සේ

කරන වැඩේට උපකාර කරල ඉක්මනින් නිමා කළා. ඉන්පසු ස්වාමීන් වහන්සේ කිවුවා,

"ම්.. ඒක තමයි මම බැලුවේ. මේ ළමයිගේ බුද්ධිය ලියලනවද පිරිහෙනවද කියල. සමහර ළමයි අපි මේ වත් පිළිවෙත් කරද්දි ලඟට වෙලා කතාව පටන් ගන්නවා. ඉතිං මම ඒ අයට ඉදලක් කොස්සක් අතට දීපු දවස් බොහෝමයි. සමහරු නම් එහෙම කළාම හොඳට වැඩකරනවා. සමහරු යන්තම් වැඩේ කරල හිමින් මාරු වෙනවා. ඒ දෙගොල්ලන්ගේ වෙනස කියන්න ඕන නැනේ. මේ ළමයි එහෙම නෑ. හොඳයි. අපි දැන් ගිහින් තේ එකක් එහෙම හදාගෙන කතා කරමුකෝ. අපිටත් හොඳයි ගිලන්පස ටිකක්."

"අවසර ස්වාමීන් වහන්ස මොනවද වළඳන්නෙ?" අපි ගිලන්පසට සුදුසු දේ විමසුවා.

"මට ඉරමුසු ටිකක් හොඳයි. ඔය ගිලන්පස පෙට්ටියේ ඇති ඔසුපැන් කියල පැකට් වගයක් බලන්නකෝ."

"දැන් හරිම පහසුයි ඕවා. අපි උපස්ථාන කරන කාලේ තමයි ඒකට වැඩේ. හැබැයි ඒකත් හොඳයි. වැඩි වැඩියෙන් හිත යෙදෙනකොට වැඩි වැඩියෙන් කුසල් වැඩෙනවා."

ස්වාමීන් වහන්සේ කිවුව දේ කොතන හරි මග හැරුණ දෙයක් තිබුණා. වාක්‍යය අසම්පූර්ණයි. ඒ වුණාට එහෙම කියන්න බැහැනේ වාක්‍යය අසම්පූර්ණයි කියලා. ඒ නිසා මම ඇසුවා,

"ස්වාමීන් වහන්ස. ඒ කිව්වේ? ඒ කාලෙ මොකද අපහසුව?"

"ඇයි දරුවො? ඒ කාලෙ ඒ කියන්නෙ අපි උපාසක වෙලා සිටිය කාලෙ ඔය ඔසුපැන් කියල දෙයක් තිබුණෙ නැහැ. බෙහෙත් ගස් පිටින් සොදල වේළල තියාගෙන අවශ්‍ය වෙලාවට මැටි මුට්ටියේ දර ලිපේ තම්බන්නේ. දර සොයන්න ඕන. ඒවා නොතෙමෙන්න තියන්න ඕනා. වැඩ ගොඩයි. දැන් ඉතිං මොකද? විදුලියයි ගෑසුයි."

අපි කතාවෙන් කතාව. ඒ අතරෙ යාලුවො ඉරමුසු හදලා අපි කවුරුත් එක්ක පුජා කළා. අපිත් අපට අදාළ භාජනවල ඉරමුසු රස වින්දා. දැන් අපේ ප්‍රශ්න අහන්න වෙලාව.

“අවසරයි ස්වාමීන් වහන්ස. “පාංසුකූල” කියන්නෙ මොකක්ද?”

“විවිධ අර්ථ ඇති ඔය වචනෙට. නමුත් අපට අදාළ වෙන අර්ථය නම් “පාංසු” කියන්නෙ පස් කියන අර්ථයනේ. “කූල” කියන්නෙ ගං ඉවුරට ඒ වගේම අතහැර ගිය වෙන් වූ කියන අර්ථ. ඒ අනුව තැන තැන අතහැර ගිය යන අර්ථය ගන්නට පුලුවන්. ”

“පාංශුකූල චිවරය කියන්නේ ඒකද? ”

“ඒකත් අර්ථයක් තමයි. ඒ කාලෙ පාංශුකූල කියල ගත්තේ අමුසොහොන්වල මිනී ආවරණය කළ රෙදි. ගෙදරදොර භාවිතා කරල විසි කළ, කසළ ගොඩවල්වල ඇති රෙදි කැබලි තෝරා එකට එකතු කර පිරිසිදු කර ගැනීමෙන්.”

“ස්වාමීන් වහන්ස එහෙමනම් මේ කාලේ **“පංශුකූලය දෙනවා”** කියන්නේ කුමක්ද? ”

“ඒකෙ නම් අර්ථය කියන්න මට තේරෙන්නේ නැහැ. නමුත් යමෙක් මරණයට පත්වුණාම ආගමික කටයුතු කිරීම කලක සිට පුරුදු වෙච්ච වැඩපිළිවෙලක්. ඒක හොඳ දෙයක්.”

“අවසර ස්වාමීන් වහන්ස **“කලක සිට පුරුදු වෙච්ච”** කියලා ඔබවහන්සේ කිව්වේ. බුදුරජාණන් වහන්සෙගේ කාලේ තිබුණේ නැද්ද පාංසුකූල දීමේ සිරිතක් කෙනෙක් මිය ගියාම? ”

“පොතපත ඇසුරෙන් තමයි එදා විස්තර ගන්න ඕන. ඔබ අහල ඇති ප්‍රධාන ගිහි උපස්ථායිකාව විශාඛා මහා උපාසිකාව ගැන. ඇයි ඔය “මහා” කියන්නෙ? සාසනේ වෙනුවෙන් මහ සඟරුවන වෙනුවෙන් අතීත සංසාරේ ඉදල ප්‍රාර්ථනා කර ගෙන ඇවිත් ඉමහත් වූ උපකාර කළ නිසා. ඒ තරමට උපකාර කළ

වෙන කවුරුත් නැතිතරම්. එවන් වූ උපාසිකාව දවසක් මහ දවල් දිග හිස කෙස් කළඹ තෙමාගෙන විහාරස්ථානයට පැමිණියා. අද කාලේ මහත්තයා මැරුණම හාමිනේ එදා ඉඳලම මුලු ජීවිතේම සුදු අඳින සිරිතක් මම දැකල තියෙනවා. ඒ ශෝකය ප්‍රකාශ කරන පිළිවෙතක්. එදා හිසකෙස් තෙමාගෙන සිටියෙත් ඒ වගේ ශෝක කාරණයක් අන් අයට දැක්වීමටයි. ඔයාලට කියන්න මම දැක්කා මැලේසියාවේදි අපේ චීන ජාතික දායක මහත්මයෙක්ගේ අම්මා කළුරිය කරලා. දරු මුණුපුරෝ හැම දෙනාම ඒ දවස් ටිකේම සුදු ඇඳුම් ඇඳල පරණ ගෝනි කැබැල්ලක් ඇඳුමේ අතේ අමුණගෙන සිටියේ. මට හිතෙන්නෙ ඒ සුදු වස්ත්‍රයෙත් ලස්සන අඩු කරන්න වෙන්න ඇති. ඔය වගේ විවිධ චාරිත්‍ර ශෝකය දක්වන්නට භාවිතා කරනවා.

එදා කවදාවත් නැති විදියට විශාඛා උපාසිකාව ආවම බුදුරජාණන් වහන්සේ ඇහුවා "ඇයි උපාසක අම්මේ, මේ කොණ්ඩේ තෙමාගෙන?" කියල. විශාඛාව කිවුවා "අනේ බුදුපියාණන් වහන්ස, මට අද හරිම ශෝක දිනයක්. මගේ හොඳම මං ගොඩක් ආදරෙන් සිටිය මිණිබිරිය මැරුණා. අද අවසන් කටයුතු කරල එනගමන් මේ."

ඇයි බුදුරජාණන් වහන්සෙ එහෙම ඇහුවෙ? හිස කෙස් තෙමාගෙන ඇයි කියල? අර තරමට උදවු කරන විශාඛා මහ උපාසිකාව කියල නැහැ මලකුණක් කසල ගොඩක් අපද්‍රව්‍ය ගොඩක් ගෙදර තියෙනවා. අපි ඒක අද විසිකරනවා කියල. ඇත්ත තමයි ඔය මලමිණිය කියන නාමය දීපු, දුගඳ හමන, නෑයින්ටත් පිළිකුල්, කරදර නිසා විසිකරන කසළ ගොඩ ඉවත්කරනවයැ බලන්න එන්නයැ කියල අර මහෝත්තම බුදුරජාණන් වහන්සේට කියනවා නම් ඒක මොනතරම් මෝඩකමක්ද සිතන්න. මහසඟරුවනට කියනවනම් මොන නිර්ලජ්ජී වැඩක්ද සිතන්න. ඒ නිසා එදා විශාඛාව වගේ බුද්ධිමත් අය බුදුරජාණන් වහන්සේටත් මහසඟරුවනටත් උන් වහන්සේලාගේ විවේකයටත් බාධාකලේ නැහැ. ඒ නිසා පංසුකූල දීමක් එකල සිදුවෙලා නැහැ. නමුත් දන් දීල පිං කරල අනුමෝදන් කළ අවස්ථා නම් බොහොමයක් සඳහන් වෙනවා."

"ස්වාමීන් වහන්ස, අහන්න අවසර, එදා එවැනි පිළිවෙතක් තිබුණේ නැත්නම් ඔබ වහන්සේ මුලදී කිවුවා නේද? කෙනෙක් මරණයට පත් වුණාම පංශුකූල දීම හොඳයි කියල?"

"ඔයාලට දරුවනේ වැරදිලා. හරියට අහගෙන ඉඳල නැහැ. මට හිතෙන්නෙ තමන්ගෙ අදහස හරිය කියන සිතින් තමයි ඉඳල තියෙන්නේ. ඇත්තටම මම කිව්වේ කොහොමද? මම කිව්වේ... යමෙක් මරණයට පත්වුණාම ආගමික කටයුතු කිරීම කලක සිට පුරුදු වෙච්ච වැඩපිළිවෙලක්. ඒක හොඳ දෙයක් කියලා. තේරුණාද? ඒක පිං අනුමෝදන් කරන වැඩ පිලිවෙලක් නිසා. ඒ වුණාට අද බොහෝ තැන්වල සිද්ධ වෙන්නෙ එහෙම දෙයක් නෙමෙයි. නෑයන් නොවන අනුන්ගේ මළකුණක් හරි ගෙදර තියාගෙන හම්බකරන එකයි. තම තමන්ගෙ ගුණවරුණාව එකතුවෙලා සිටින අයට ඇහෙන්න ලවුඩ්ස්පීකර්වලින් කියන එකයි. ඒ මදිවට මත්ද්‍රව්‍ය නාගෙන විවිධ සෙල්ලම් කරන එකයි ඔය වගේ කිසි වැඩක් නැති වැඩ ගොඩක්නේ. මට ඔය වගේ ඒවා කිහිපයක්ම කිවුවා මෙම ස්ථානයට වැඩම කළ අලුත. මම භාරගත්තෙ නෑ. අන්තිමේ මගෙත් එක්ක තරහ වෙලා අතන මෙතන දොස් කියලත් තියෙනවා කියලා මට සමහරු කිවුවා. මම කිවුවා **"කළ කළ දේ එලඑල දේ"** කියල තියෙනවනේ කියල."

මට අහන්නට ඕනකරලා තිබුණ තැනට ඉබේටම වගේ ආවා. ඒත් මට තව අහන්න සිතුණා. "ස්වාමීන් වහන්ස ඇත්තටම මටත් ඔය කාරණය දැනගන්නට ඕනකම තිබුණා. දැන් එතනටම ඇවිල්ලා. මම අහන්න සිතුවේ පසුගිය කාලය තුල මම දැක්ක බොහොම පැරණි දායක අයයි කියපු කිහිප දෙනෙක්ම නොදන්වාම සෙනසුනට පැමිණීම නතර කළා. සෙනසුනෙන් දුරස්වෙලා. ඔබවහන්සේ ඒගැන සොයන්න ගියෙත් නැහැ. ඒ අය සෙනසුනට දැන්වීමක් කලෙත් නැහැ."

"ඒ නිසාම අපි විමසා බැලුවා කුමක්ද මේකට හේතුව කියල. අපට දැනගන්න ලැබුණේ ඔබවහන්සෙගේ ප්‍රතිපත්තිය ඒ කිවුවෙ ඔය වැඩපිළිවෙල හොඳ නැහැ කියල."

අපි එහෙම කිවුවම ස්වාමීන් වහන්සේ ඇහුවා "මොකක්ද ඔය කියන ප්‍රතිපත්තිය? "

අපි කිව්වා "පංසුකූලෙට යන්නේ නෑ. පිරිත් පිංකම් බාර ගන්නේ නෑ. ගෙවල්වල දානෙට යන්නේ නෑ. "

"…….හා..හා..හා.. ඒකද ඔය කියන ප්‍රතිපත්තිය?"

"ළමයිනේ සාසනේ ප්‍රතිපත්තිය කියන්නේ ඔය ටික කියල තමයි ගොඩක් අය සිතන්නේ. ඕනම වැරදි වැඩක් කරල මැරුණම ඔය ටික කරලා ගොඩගන්න පුලුවන් කියල තමයි සිතන්නේ. නමුත් බුදුරජාණන් වහන්සේ වදාළේ කර්මයට අනුව ඵල ලැබෙන බව."

"කවුරු මොනව කිවුවත් මම බුදුරජාණන් වහන්සේ කියලා දුන්න, අපේ ශ්‍රේෂ්ඨ ගුරුදේවෝත්තමයන් වහන්සේලා අපට කියපු වැඩ පිළිවෙලක් තියෙනවා. අන්න ඒක තමයි ප්‍රතිපත්තිය විධියට අපි පුරුදුකරන්නේ. ඒ වැඩ පිළිවෙත තමයි සීල, සමාධි, ප්‍රඥා කියන ත්‍රිශික්ෂාව. කොහොම වුණත් තව කරුණක් තියෙනවා. ඒකත් කියන්න ඕන. මේ ස්ථානය වැහිල යන්න තරම් තිබුණා. කවුරුවත් එන්න කැමති නැතිව පාළුවට ගිහින් තිබියදී. විදේශගතව සිටි මට එන්නට කියල අපේ ගුරු උතුමන් වහන්සේ අතිපූජනීය නාඋයනේ අරියධම්ම මහා ස්වාමීන් වහන්සේ තමයි බාරදුන්නේ. එදා මට කියපු අවවාදය. ඔය මම ප්‍රතික්ෂේප කරපු ටික. ඒ වාගෙම ප්‍රසිද්ධිය, පැවිදි දිවියට බාධාවක්, විවේකය නිවන් මගට උපකාරයක් කියල ඕනවට වඩා බාහිර වැඩ වල යෙදෙන්නට එපා කිවුවා. දායක පවුල් වලට වැඩි බැඳිම පැවිදිකමට නොගැළපෙන බවත් සැමට එක ලෙස සැලකීම යුතුකම බවත් කියල දුන්නා. කරණීය මෙත්ත සූත්‍රයේ තිබෙන ගුණ අමතක නොකරන්න කිවුවා. ඒවගේම කවුරුන් හෝ ධර්මයේ පිහිට සොයාගෙන සෙනසුනට පැමිණිය හොත් සෙනසුන තුළදී කළ යුතු ධර්ම සංග්‍රහය ඉටුකරන්නටත් කිවුවා. ඒ නිසා අද ඒ උතුමන් වහන්සේ මනුලොව අපට පෙනෙන්නට නැතත් අපි කරන දේ බලමින් බ්‍රහ්ම ලෝකයේ වැඩසිටිනවා ඇති. ඒ අවවාදවලට පිටින් මා යායුතු නැහැ කියන එක මගේ සිතේ කාවැදිලා තියෙනවා."

"අවසර ස්වාමීන් වහන්ස. ඔබවහන්සේ කියූ කරුණු අපිට හොඳින් වැටහුණා. නමුත් සමාජයේ මිනිසුන් අතර තිබෙන

අදහසක් තමයි. භික්ෂූන් වහන්සේගේ යුතුකමක් වගකීමක් කියල මේ පාංසුකූල වගේ කටයුතුවල යෙදීම. ඇත්තටම ස්වාමීන් වහන්ස, භික්ෂූන් වහන්සේ නමක් විදියට වගකීම සහ යුතුකම වන්නේ කුමක්ද?"

"බුදුරජාණන් වහන්සේ ශ්‍රාවක පුත්‍රයන්වහන්සේලාට දුන්න අවවාදය මතකද? **"මහණෙනි! යම් ගුරුවරයෙක් කරුණාවෙන් තම අනුගාමිකයන්ට මග පෙන්වන්නේ නම් අන්න ඒ මග මම (තථාගතයන්වහන්සේ) නුඹලාට නොසඟවා පැවසුවා. මේ තිබෙන්නේ ආරණ්‍ය. මේ තිබෙන්නේ රුක්ඛ මූල. මේ හිස්ගෙවල්. යන්න! මේ වැඩපිළිවෙල පටන්ගන්න. දිගටම කරගෙන යන්න. මග නවතින්න එපා. අන්තිම ඵලය දක්වාම වීර්යය කරන්න. ප්‍රමාද නොවන්න"** කියන අවවාදයනේ. ඊළඟට **"බොහෝ ජනයාගේ හිතසුව පිණිස මුල මැද අග සම්පූර්ණ වූ ධර්මය දෙන්න"** කියල. ඒ කියන්නෙ සීල සමාධි ප්‍රඥා වැඩපිළිවෙල ප්‍රායෝගිකව ප්‍රගුණ කරන්නට කියාදෙන්න. මේ පළමු අවවාදය සාමාන්‍ය අනුගාමික පිරිසට. දෙවැනි අවවාදය රහතන් වහන්සේලාට. නමුත් එදත් අදත් රහත් නොවූ ශ්‍රාවක පුත්‍ර මහ සඟරුවනත් මග කියල දුන්නා. කියල දෙනවා."

"ඒ අනුව ඒ උතුම් බුදුවදනින් කියවුණ භික්ෂුවගේ වගකීම මම හැකි පමණින් ඉටුකරනවා."

"ඔබවහන්සේ මේ යුතුකම ඉටුකරන්නට මග කියන්නට යොදාගන්නා ක්‍රමවේද මොනවාද?"

"තමන් ගුරු උදෙස් අනුගමනය කරමින් ඒ අනුව ලැබූ සැබෑ අත්දැකීම් කියාදීමයි මගේ පිළිවෙත. ගුණදම් පුරණ පිළිවෙත කොටස් දෙකකට බෙදන්නට පුලුවන්. ආමිස සහ ප්‍රතිපත්ති කියලා. කුසල් වැඩෙන අයුරින් පූජා සත්කාර වැනි දේ කිරීම ආමිස පූජාවයි. සීලයේ පිහිටා සමථ විපස්සනා භාවනා වැඩීම ප්‍රතිපත්ති පූජාවයි. මේ දෙකින් නිවන් ප්‍රත්‍යක්ෂ කරන්නට වඩා වැදගත්වන්නේ ප්‍රතිපත්තිය. නමුත් ආමිස පූජාවන්ගෙන් සම්පූර්ණයෙන් වෙන් වී ප්‍රතිපත්තිය වැඩීම අපහසුයි. ඒ නිසා ප්‍රසිද්ධියට ලාබසත්කාරයට නොඇලී යම්පමණක කරුණාව

මෛත්‍රිය වැඩෙන උපකාර කිරීම් ක්ෂේත්‍රයේ කුසල් දහම්වලට පිරිස යොමුකරමින් වඩ වඩාත් ප්‍රතිපත්තියේ අගය හෙවත් සමථ විපස්සනා වඩන්නට මග පෙන්වීමේ ක්‍රමයයි මෙහි සිදුවන්නේ.''

"අනික තමයි ප්‍රතිපත්ති පූජාව ප්‍රඥාවත් එක්ක කරන ගනුදෙනුවක්. ඒ සඳහා යම්තරමකට මුහුකුරා ගිය වැඩුනු නුවණක් තියෙන්නට ඕන. එය ලැබෙන්නේ උපතත් එක්ක. ඒ කියන්නේ පෙර ජීවිතයේ අවසන් මොහොතේ සිතට දැනුන දෙයත් එක්ක. ජනක කර්ම ශක්තිය කියන්නෙ ඒක. එය තුන්මුල් සිතක ඵලයක් නම් ඒ කියන්නෙ ත්‍රිහේතුක ප්‍රතිසන්ධියක් නම් නුවණ සහිත බීජයක් ඇතිව උපත ලබනවා. මේ ජීවිතයේ ඇසුර, පරිසරය, ක්‍රියාකාරකම් ආදියත් එක්ක ලැබෙන පෝෂණය නිසා නුවණ ප්‍රබල වෙනවා. මේ කියන දේවල් හැම කෙනාගේම සමවෙන්නෙ නෑ. ඒ නිසා තමයි යම් පමණකින් ආමිසපූජා අවශ්‍ය කරන්නේ.''

"ඔබවහන්සේ කියන විදියට අනුගාමික පිරිසෙහි ආමිස සහ ප්‍රතිපත්ති වැඩෙන්නට දැනට ආරම්භ කර ඇති පිළිවෙත් මොනවාද?''

"ඉරුදින සීල භාවනා සහ අභිධර්මය කියාදෙමින් සහ අවශ්‍ය ඕනෑම විටක භාවනා උපදෙස් ලබාදෙමින් පිරිස ධෛර්යමත් කිරීමට වැඩපිළිවෙලක් දැනටමත් කරගෙන යනවා.''

"උතුරු නැගෙනහිර දිර්ඝ කාලයක් කුරිරු ත්‍රස්ත භීතිකාවෙන් පීඩාවට පත් වෙහෙර විහාර සොයා වසරකට වරක් හැකි පමණින් උපකාර කරනවා. එවන් පුණ්‍ය භූමියක් තෝරාගෙන වාර්ෂිකව අතිපූජනීය රේරුකානේ චන්දවිමල මහා ස්ථවිරයන් වහන්සේ විසින් රචිත ධර්ම පුස්තක ධර්ම දානයක් ලෙස බෙදා දීමත් කරන්නේ බොහෝ දෙනාට මේ ධර්මයේ අගය කියා දෙන්න. ඒක ඒ උතුමන් වහන්සේ ජීවත්ව සිටි කාලයේ මට කළ අවවාදයක්.''

"වාර්ෂිකව ඉහත සඳහන් කළ ප්‍රදේශයක පාසලක් තෝරාගෙන ළමයින්ගේ දස්කම් අගයන වැඩමුළුවකින් පසු පාසල් උපකරණ සියලුම ළමයින්ට ලබාදෙමින් ළමයි දිරිමත් කරනවා. එහි ප්‍රතිඵල දැනටමත් පේන්න තියෙනවා. ඒ කියන්නේ අපට හමුවෙන මුල් කාලේ කතා කරන්නත් ලැජ්ජා, සබකෝලෙන් සිටි ළමයි දැන් දීප්තිමත් අය බවට පත්වෙලා. සමහරු තරගවලට පවා ඉදිරිපත් වෙනවා. ඒ වගේම ජයගන්නවා."

"ඒ ප්‍රදේශවල පාසල්වලින් තෝරාගත් උපකාර අවශ්‍ය දක්ෂ ළමයින්ට මව්පිය කැපකරු ක්‍රමයට අධ්‍යාපනය සඳහා මාසිකව උපකාර කරනවා. ඒක හරිම සාර්ථකයි. ඇත්තටම කොච්චර අපහසුතා තිබුනත් ළමයි නම් දක්ෂයි. අවශ්‍ය කරන්නේ ළමයින් උනන්දු කරවීම පමණයි. අපි ඒක කරනවා."

"මෙහිදී විශේෂයෙන් කියන්නට ඕන කාරණය මේ සියල්ලම කරන්නේ අර ඉහත රාමුව ඇතුලේ. ඒ කියන්නේ අපගේ ගුරු උතුමන් වහන්සේගේ අවවාද සිතේ තබාගෙන. අපේ විවේකයට බාධාවක් නොවෙන, කිසිදු දායකයකුට බරක් නොවෙන, ප්‍රසිද්ධිය සහ ලාබ සත්කාර පිටුදකින ප්‍රතිපත්තියට මුල්තැන දෙන වැඩමුළුවක් විදියට."

"අවසරයි. ඔබවහන්සේ කිවුවා මේවා කරන්නේ දායකයන්ට බරක් නොවෙන ලෙස කියලා. ඉතිං මේවායේ බරපැන දරන්නේ කොහොමද?"

"මම කාටවත් කරන්න කියල ඉල්ලීමක් කරන්නේ නැහැ. නමුත් අපේ බුද්ධිමත් පිරිසක් ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වෙලා සිටිනවා මේ සියලු කටයුතු වලට. කැපකරු මව්පිය ක්‍රමය කිව්වේ ඒකයි. යෝජනා කරනවා. ස්ථිර කරගන්නවා. සැලසුම් කරනවා. ඒ අයම වියදම් දරනවා."

"උදව් කරන පිරිස ගැන කියන්න පුලුවන්ද?"

"ඔව්. නමුත් මේ සාකච්ඡාවේ හෝ වැඩසටහනේ අවසානය නෙමෙයි. ඒ නිසා ඊළඟ සාකච්ඡාවෙදි ඒ සියල්ල කියන්නම්."





"මේ පාසල් ළමයින්ට උපකාර කරන වැඩ සටහනේ ඔබවහන්සේලාගේ පැත්තෙන් ලබන කරුණා මෙත් පිරි සතුටට අමතර වෙනත් ඵල තිබෙනවද?"

"ඇත්ත වශයෙන්ම. කැලයක පිළිල හැදිච්ච අරටුගස් ආයේ ගොඩගන්න බෑ. ලපටි ගස් ආරක්ෂා කලොත් හොඳට පෝෂණය කරල අනාගතයේ වැඩක් වේවි. ඒ වගේ තමයි මේ වැඩපිළිවෙල. සෑම අංශයකින්ම සමාජය පිරිහිලා. ඒවා දකින ළමයි ඒවා අනුගමනය කරනවා. අපේ උත්සාහය රැකවරණය දෙමින් නොමග යන්නට නොදී ළමා කාලය දැනුමෙන් වගේම ගුණධර්ම අතින් පෝෂණය කිරීමයි. එවැනි කිහිපදෙනෙක් හෝ ගොඩනැගුනොත් එයින් අනාගතයේ රටටත් ජාතියටත් දහමටත් තම තමන්ටත් පිහිටක් වේවි."

"දැන් ඇති නේද? මට තව වැඩ තියෙනවා."

ස්වාමීන්වහන්සේ අසුනෙන් නැගිට්ටා. අපිද එතැනින් මදක් නික්ම ගොස් සාකච්ඡා කළේ මෙම ස්ථානය කැලේ මැද තිබුණත් කවුරුන් වැඩ සිටිත්ද? කරන්නේ මොනවාද? කිසිදු ප්‍රසිද්ධියක් නැතත් සැබැවින්ම බුද්ධපුත්‍රයන් වහන්සේලාගෙන් ගුරුගෞරවයෙන් කළයුතු සහ රටට දැයට වියයුතු සියල්ල මනාසේ ඉටුවන වගකීම සහ යුතුකම නොපිරිහෙලා ඉටුකරන නිහඬ නිසංසල අවකාශයක් බවයි.

---

\- මතු සම්බන්දයි -

# පින

1. උදේ පටන් රැවෙනතුරු - රැ වී යලි එලිවෙනතුරු
සොයනව සොයනව තවමත් සොයාගන්න බැරිය මිතුරු
මොනවද මේ සොයන්නේ - කවුදෝ එය අසන්නේ//
2. සතුට සතුට සතුට ලැබෙන - තැනක් කොහෙද තියෙන්නේ
ගතට සිතට වෙහෙස නොදෙන- දේ කොහොමද කරන්නේ
එයම නේද සොයන්නේ - ඇයි තනිවම තැවෙන්නේ//
3. කනට මිහිරි බණ ඇසුවම - පිං සිතුවිලි නැගෙන්නේ
දනට පිනට යෙදෙන විටදී - නැහැ දුක් ගිනි දැනෙන්නේ
පිං කියන්නෙ කුමට ද - පිනෙන් සතුට දෙනව ද ?//
4. සිත පිනවන යමක් වේද එයටයි පිං කියන්නේ
පිං තිබෙනා සිත පමණයි සතුට සැපත ගෙනෙන්නේ
පිං කියන්නෙ සැපයට - සැපදේ පිං ඇතිවිට //
5. උල්පත නොසිඳෙනතුරු - ලිඳක වතුර නිරතුරු
ගලා එන්නෙ පිපාසයට ගෙනෙමින් යස පිළිතුරු
එලෙසින් පිං ඇතිවිට - සැපදෙනවා සැමවිට //
6. ගසක සිරිය වැඩිකරන්නෙ - මල් එල බර වූවිට
සිතක සිරිය මතු කරන්නෙ - පිං එල වැඩි තරමට
පිං කරන්න සැමවිට - එය එයි ඔබෙ පිහිට ට //
7. කඩ තොලු වැසෙනා සොඳින් - අඩ සඳ පිරෙනා ලෙසින්
හදපිරි සතුටින් අහන්න - කියමුද තොරතුරු ඉතිං
පිං කියන්නෙ සැපයට - සැපදේ පිං ඇතිවිට //
8. සතුට සැපය යනු පිනනම් - කොහොමද පිං ලබන්නේ
නිතර නිතර සැප ලබන්න අපි මොනවද කරන්නේ
පිං කරන්න සැමවිට - එය එයි ඔබෙ පිහිටට //
9. සයුරු වෙරලෙ දිස්වෙන - රළ පිට රළ පාවෙන
නපුරු සයුරුගති වලකන - බලන්න ඒ ලස්සන
රළමෙන් නැගෙනා සිතින් - නපුරු ගති නොඑන ලෙසින්
සතුට සැපත නිති සලසන -වඩමු වඩමු පිං නිතින්//

## වනරොපසුත්තං

**"කෙසං දිවා ච රත්තො ච, සදා පුඤ්ඤං පවඩ්ඪති;**
**ධම්මට්ඨා සීලසම්පන්නා, කෙ ජනා සග්ගගාමිනො" ති.**

**"ආරාමරොපා වනරොපා, යෙ ජනා සෙතුකාරකා; පපඤ්ච උදපානඤ්ච, යෙ දදන්ති උපස්සයං.**

**"තෙසං දිවා ච රත්තො ච, සදා පුඤ්ඤං පවඩ්ඪති; ධම්මට්ඨා සීලසම්පන්නා, තෙ ජනා සග්ගගාමිනො" ති.**

දිවා රෑ දෙකෙහි නිරන්තරයෙන් පිං වැඩෙන්නේ කාටද ?
සුගතියට යන්නා වූ දැහැමි වූ සිල්වතුන් කවුරුන් ද?

යමෙක් පිං සලකා මල්උයන් පලතුරු උයන් සකසාද, වන සෙනසුන් ඉදිකර ගුන දම් පුරන්නන්ට පහසුව සලසයිද,ඒ දඬු පාලම් ඔරුපාරු සපයයිද, පිපාසය නිවන්නා වූ ලිං පොකුණු ජලනල ආදීය සකසයිද, වාසස්ථාන සකසාදෙයිද, මෙවැනි දේ කරන්නා වූ යමෙක් වෙත්නම් , ඔහු දැහැමිය සිල්වත්ය. දිව්‍ය මනුෂ්‍ය ආදී සුගති පරායනය වන්නේද ඔහුමය.

*- වනරොපසුත්තං (සං.නි. සගාථක වග්ග)*

සාදූ! සාදූ ! සාදූ!

# අඳුර මැදින් යළි එළියක්...

අඳුරු රැයේ පායන සඳ හරි ප්‍රියංකරයි
සඳේ එළිය හැම මිදුලෙම එකම එකවගෙයි
සුදෝ සුදට නිල් අහසට හරිම ලස්සනයි
සඳවටකර ඇති තරුකැල සැවොම ඒ වගෙයි

සඳ හරි ප්‍රියංකරයි
එහි එළිය හරි අගෙයි
සඳේ එළිය නැති දවසට
සිතට හරි දුකයි!

ජාති භේද උස්මිටිකම් සඳට වැඩක් නෑ
බෙදන එළිය සැමතැනටම කිසි වෙනසක් නෑ
වාද භේද මානාදී ලප කිසිවක් නෑ
සඳට එරෙහි කිසිවෙක් සඳ අසලකවත් නෑ

ඝන වැහි වලාකුළු මහ රාහු බියකරු
එකමුතුවී සඳ රජිඳුට කරයි ගරු සරු!

සඳ හරි ප්‍රියංකරයි
එහි එළිය හරි අගෙයි
සඳේ එළිය නැති දවසට
සිතට හරි දුකයි!

ඡන්ද දෝස බය මෝහෙන් අගතියට වෙලා
අන්ධයින් වගේ ඇයි මේ තව පමාවෙලා
වින්ද නේක දුක් මහසයුරෙන් එතෙරවෙලා
චන්ද්‍ර මඬල සේ ගුණදම් පුරමු එක්වෙලා!

